6,10 ශ්‍රේණි සඳහා 2015 දී හඳුන්වා දුන්
විෂයමාලා සංශෝධන සම්බන්ධව 2014 දී පැවති

# සේවාස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ සමීක්ෂණය - 2015

6 10


පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම

www.nie.lk

# 6,10 ශ්‍රේණි සඳහා 2015 දී හඳුන්වා දුන් විෂයමාලා සංශෝධන සම්බන්ධව 2014 දී පැවති සේවාස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ සමීක්ෂණය - 2015

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

**6,10 ශ්‍රේණි සඳහා 2015 දී හඳුන්වා දුන් විෂයමාලා සංශෝධන සම්බන්ධව 2014 දී පැවති සේවාස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ සමීක්ෂණය් 2015**

(c) පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවල ජාතික අධ්‍යාපන ආයතනය

**පළමු වන මුද්‍රණය් 2015**

**සමස්ත උපදේශනය** : බී. සනත පූජිත
**පර්යේෂණ අභිමන්ත්‍රණය** : එම්. එන්. එස්. ශ්‍යාමා එදිරිසිංහ
**ව්‍යාපෘති නායක** : දිල්හානි හෙට්ටිගේ

**පර්යේෂකයින්**

අභ්‍යන්තර : දිල්හානි හෙට්ටිගේ
ඩී. කැප්පෙටිගොඩ
කේ. ඒ. එන්. එස්. ඇලෙක්සැන්ඩර්
ඩබ්ලිව්. කේ. එස්. පුෂ්පමාලා
එම්. ඩී. ඩී. අයිරානි ද සිල්වා

බාහිර : එම්. එල්. කේ. රඹුක්වැල්ල
එස්. පී. ඩබ්ලිව්. වාකිෂ්ඨ
සුනිලා රත්නායක
එන්. එම්. ආර්. ද සිල්වා
එම්. ඒ. පී. මුණසිංහ මයා

**භාෂා පරිවර්තනය**

සිංහල - ඉංග්‍රිසි : එම්. ඒ. පී. මුණසිංහ මයා

**පරිගනක යතුරු ලියනය** : පී. නිල්මිණී. ප්‍රනාන්දු මිය
එන්. පී. නිසංසලා ජයරාණි මිය
තමරා ගමගේ මිය
ප්‍රියංවදා සමරසිංහ මෙනවිය

**කාර්යාලීය සහාය** : කාන්ති ගලප්පත්ති මිය
එන්. පී. නිසංසලා ජයරාණි මිය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සන්දර්භය තුළ ප්‍රාථමික, කනිෂ්ඨ ද්විතියික හා ජ්‍යෙෂ්ඨ ද්විතියික යන සෑම මට්ටමක ම විෂයමාලා සංශෝධන හා නවීකරණ ක්‍රියාවලියේ නියමු කාර්යය හිමි වන්නේ ජාතික අධ්‍යාපන ආයතනයට ය. ඉහත සඳහන් මට්ටම්වලට අදාළ සියලු ම විෂය සඳහා සංශෝධන හෝ නවීකරණ කටයුතු සිදු වී නම් ඒ පිළිබඳ සේවාස්ථ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පූර්ණ වගකීම ජාතික අධ්‍යාපන ආයතන සතු වේ.

ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු විෂයයක් සඳහා ම ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් පුහුණු කිරීමේ කටයුතු ජාතික අධ්‍යාපන ආයතන පරිශ්‍රයේ දී ආයතනයේ ඒ ඒ විෂය සඳහා විෂයමාලා සම්පාදන කාර්යයේ නියුතු නිලධාරීන් ගුරුවරුන් වෙත ගෙන යනු ලබන්නේ ගුරු උපදේශකවරුන් විසිනි.

''6, 10 ශ්‍රේණි සඳහා 2015 දී හඳුන්වා දුන් නව විෂයමාලා සංශෝධන සම්බන්ධ ව 2014 දී පැවැත් වූ සේවාස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ සමීක්ෂණය - 2015'' යන මැයෙන් පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබූ මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ජාතික අධ්‍යාපන ආයතනය මූලික ව ගුරු උපදේශකවරුන් මගින් විෂයමාලා සංශෝධන පිළිබඳ ගුරුවරුන් සඳහා කරගෙන යනු ලබන සේවාස්ථ පුහුණු වැඩසටහන් පිළිබඳ තත්‍ය ස්වරූපය හඳුනා ගැනීමටත් එමගින් ඉදිරි පුහුණු වැඩසටහන් කාර්යක්ෂ ව හා ඵලදායී ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ගුරුහරුකම් ලබා ගැනීමත් ය.

විෂයමාලා සංශෝධන ක්‍රියාවලියේ සේවාස්ථ පුහුණු වැඩසටහන් සාර්ථක ව සිදු කිරීමට ඉවහල් වූ මෙම ජාතික මට්ටමේ පර්යේෂණය ක්‍රියාත්මක කළ පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් බී. සනත් පූජිත මහත්මාටත්, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශ්‍යාමා එන්. එදිරිසිංහ මහත්මියටත්, ව්‍යාපෘති නායක සහ එම කාර්ය මණ්ඩලයටත් බාහිර සම්පත් පුද්ගලයින්ටත් මගේ ස්තූතිය පිරිනමමි.

මහාචාර්ය ගුණපාල නානායක්කාර

අධ්‍යක්ෂ ජනරාල්

# පටුන


| | |
|---|---|
| පෙරවදන | iii |
| පටුන | iv |
| වගු නාමාවලිය | v |
| 1වන පරිච්ඡේදය - හැඳින්වීම | 4 |
| 2වන පරිච්ඡේදය - සාහිත්‍ය විමර්ශනය | 6 |
| 3වන පරිච්ඡේදය - ක්‍රමවේදය | 11 |
| 4වන පරිච්ඡේදය - දත්ත විශ්ලේෂණය | 16 |
| 5වන පරිච්ඡේදය - යෝජනා හා නිර්දේශ | 69 |

# වගු නාමාවලිය

3.1 වන වගුව: විෂය අධ්‍යක්ෂ, ගුරු උපදේශක හා ගුරු නියැදිය 10
4.1 වන වගුව: පර්යේෂණය සඳහා යොදාගනු ලැබූ නියැදිය හා දත්ත එක්රැස් කරන ලද ක්‍රමවේද 13
4.2 වන වගුව: ජාතික අධ්‍යාපන ආයතනයේ සැසි සඳහා සහභාගිත්වය 15
4.3 වන වගුව: පළාත් අනුව සහභාගිවූ විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන්ගේ ප්‍රමාණය 15
4.4 වන වගුව: ස්ත්‍රී / පුරුෂ භාවය අනුව සැසි සඳහා සහභාගීත්වය 16
4.5 වන වගුව: භාෂා මාධ්‍යය අනුව සහභාගීත්වය පිළිබඳ තොරතුරු 16
4.6 වන වගුව: නියෝජනය කරණු ලබන ප්‍රධාන හර විෂය අනුව සහභාගීත්වය පිළිබඳ තොරතුරු 16
4.7 වන වගුව: සහභාගීවන්නන්ගේ සේවා පළපුරුද්ද අනුව සහභාගීත්වය 16
4.8 වන වගුව: පුහුණු සැසිවල සංවිධානය පිළිබඳ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය 18
4.9 වන වගුව: පවත්වනු ලැබූ සැසිවල අන්තර්ගතය පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය 20
4.10 වන වගුව: පවත්වන ලද සැසිවල ක්‍රමවේදය පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය 21
4.11 වන වගුව: පවත්වන ලද සැසි ඇගයීම පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය 23
4.12 වන වගුව: අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන් හඳුනාගත් ගැටලු ක්ෂේත්‍ර හා ලබාදුන් ප්‍රතිචාර 25
4.13 වන වගුව: විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු මුහුණදුන් සංවිධානය ආශ්‍රිත ගැටලු 26
4.14 වන වගුව: සංවිධානය ආශ්‍රිත සංවර්ධන යෝජනා 26
4.15 වන වගුව: කාලය / දින ගණන ආශ්‍රිත සංවර්ධන යෝජනා 29
4.16 වන වගුව: සම්පත් සැපයීම පිළිබඳ යෝජනා 31
4.17 වන වගුව: සම්පත් පුද්ගලයින් තෝරා ගැනීම ආශ්‍රිත යෝජනා 32
4.18 වන වගුව: සැසි පැවැත්විය යුතු අවස්ථා පිළිබඳ යෝජනා 33
4.19 වන වගුව: පුහුණු සැසි අන්තර්ගතය පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර 34

4.20 වන වගුව: අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා 34
4.21 වන වගුව: අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා 36
4.22 වන වගුව: අන්තර්ගත දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා 38
4.23 වන වගුව: විෂය සන්ධාරය පිළිබඳ යෝජනා 39
4.24 වන වගුව: ක්‍රමවේදය ආශ්‍රිත යෝජනා ක්ෂේත්‍රය 40
4.25 වන වගුව: සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා 41
4.26 වන වගුව: තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා 43
4.27 වන වගුව: ඇගයීම පිළිබඳ යෝජනා 44
4.28 වන වගුව: ඇගයීම ක්‍රම ප්‍රමාණවත් නොවීම 45
4.29 වන වගුව: ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ යෝජනා 46
4.30 වන වගුව: පුහුණු සැසි පිළිබඳ යෝජනා 48
4.31 වන වගුව: පළාත් මට්ටමින් පර්යේෂණය සඳහා යොදා ගනු ලැබූ ගුරු සංඛ්‍යාව 49
4.32 වන වගුව: අධ්‍යයනය සඳහා යොදාගනු ලැබූ ගුරු භවතුන්ගේ පාසල් ණියෝජනය 49
4.33 වන වගුව: නියැදිය සඳහා යොදා ගනු ලැබූ ගුරුභවතුන්ගේ ස්ත්‍රී/ පුරුෂ භාවය 50
4.34 වන වගුව: නියැදිය සඳහා යොදා ගනු ලැබූ ගුරු භවතුන් ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යය 50
4.35 වන වගුව: නියැදිය සඳහා යොදාගනු ලැබූ ගුරු භවතුන්ගේ ප්‍රධාන හර විෂයන් 50
4.36 වන වගුව: ආගම විෂය ඉගැන්වීම් කරන ගුරු භවතුන්ගේ ව්‍යාප්තිය 50
4.37 වන වගුව: නියැදිය සඳහා යොදා ගත් ගුරුභවතුන් ඉගැන්වීම් කරන ශ්‍රේණි 51
4.38 වන වගුව: නියැදිය සඳහා යොදා ගත් ගුරුභවතුන්ගේ සේවා පළපුරුද්ද 51
4.39 වන වගුව: නියැදිය සඳහා තෝරාගත් ගුරුභවතුන්ගේ වෘත්තීය සුදුසුකම් 51
4.40 වන වගුව: පුහුණු සැසි සංවිධානය 52
4.41 වන වගුව: විෂය අන්තර්ගතය පිළිඳව ගුරු භවතුන්ගේ ප්‍රතිචාර 54
4.42 වන වගුව: සැසි පවත්වනු ලැබූ ක්‍රමවේදය පිළිබඳ ගුරු භවතුන්ගේ ප්‍රතිචාර 56
4.43 වන වගුව: සේවාස්ථ සැසි ඇගයීම පිළිබඳ ගුරු භවතුන්ගේ ප්‍රතිචාර 57
4.44 වන වගුව: ගැටල ක්ෂේත්‍ර පිළිබඳ සමස්ත ගුරු ප්‍රතිචාර 59
4.45 වන වගුව: ගැටලු ක්ෂේත්‍ර පිළිබඳ ගුරු ප්‍රතිචාර - මාධ්‍ය අනුව 60
4.46 වන වගුව: සංවර්ධනාත්මක යෝජනා පිළිබඳ ගුරු ප්‍රතිචාර 60

4.48 වන වගුව: සංවර්ධන යෝජනා පිළිබඳ ගුරු ප්‍රතිචාර (යෝජනා ආදී) 61
4.49 වන වගුව: සංවිධාන ක්ෂේත්‍රය පිළිබඳ ගුරු ප්‍රතිචාර 62
4.50 වන වගුව: අන්තර්ගතය පිළිබඳ සමස්ත ගුරු ප්‍රතිචාර 63
4.51 වන වගුව: ක්‍රමවේදය පිළිබඳ ගුරු ප්‍රතිචාර 65
4.52 වන වගුව: ඇගයීම පිළිබඳ ගුරු ප්‍රතිචාර 67

# පළමුවන පරිච්ඡේදය
# හැඳින්වීම

ගුරුවරුන් තමන්ගේ ප්‍රවීණතා පිළිබඳ නැවත විමසා බලා, යාවත්කාලීන වෙමින් තවදුරටත් සංවර්ධනය වීමේ ක්‍රියාවලිය 'අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය' යි. (Continuous Professional Development) අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කිරීමට වඩාත් පහසු වූ ද, සක්‍රිය වූ ද, ගුරුවරුන්ගේ දැනුම, හැකියා සහ ප්‍රතිජනනාත්මක විශ්වාස වර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී වූ ද ක්‍රමය වන්නේ සේවාස්ථ පුහුණුවයි. ඉගැන්වීම පිළිබඳ වෘත්තීමය සහතිකයක් ලබා ගත් පසු ගුරුවරයකු වශයෙන් සේවය කිරීමේ දී අධ්‍යාපනය අඛණ්ඩ ව තවදුරටත් ලබා ගැනීමට ඇති හොඳ ම ක්‍රමය ද සේවාස්ථ ගුරු පුහුණුවයි. අධ්‍යාපනයෙහි සැලකිය යුතු වෙනස්කම් ඇති කිරීමට තරම් ප්‍රබල කාරකයක් ලෙස නොපෙනෙතත්, සේවාස්ථ ගුරු පුහුණුව මෙම ක්ෂේත්‍රයෙහි වැදගත් විපර්යකාරයකු ලෙස ක්‍රියාත්මක වන බව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ පාසල්වල ගුරුවරුන් සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලා ප්‍රධාන වශයෙන් පවත්වාගෙන යනුයේ ජාතික අධ්‍යාපන ආයතනයයි. විෂයමාලා පිළිබඳ විවිධ අවස්ථාවල දී කරනු ලබන වෙනස්කම් හා සංශෝධන ගුරුවරුන් වෙත හඳුන්වා දෙන්නේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් මගිනි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ජාතික අධ්‍යාපන ආයතනය භාවිත කරනුයේ Cascade Model හෙවත් පියගැට ක්‍රමය නමින් හැඳින්වෙන පියවර දෙකකින් යුක්ත ක්‍රමයකි. ප්‍රථමයෙන් විෂයමාලා වෙනස්කම් සේවාස්ථ ගුරු උපදේශකවරුන්ටත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විෂය භාර අධ්‍යක්ෂවරුන්ටත් ජාතික අධ්‍යාපන ආයතනයෙහි විෂය භාර දෙපාර්තමේන්තු විසින් හඳුන්වා දෙන අතර දෙවනුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල උදව් ඇතිව විෂය අධ්‍යක්ෂවරුන් සහ ගුරු උපදේශකවරුන් ගුරුවරුන් සඳහා පළාත් හා කලාපීය මට්ටමේ පුහුණු වැඩසටහන් හා සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කර පවත්වනු ලැබේ.

2015 වර්ෂයේ පාසල්වල ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද 6 සහ 10 ශ්‍රේණි සඳහා වූ නව විෂයමාලා සංස්කරණ ගුරුවරුන්ට හඳුන්වා දෙන ලද්දේ 2014 දී ය. 6 සහ 10 ශ්‍රේණිවල සියලු ම විෂයයන් (ගණිතය, විද්‍යාව, ප්‍රථම භාෂාව, ) මෙම සංස්කරණ ක්‍රියාවලියට අන්තර්ගත විය. ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු මගින් මෙම වසරේ දී ඒ ඒ විෂයයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් මාලාවක් විෂය අධ්‍යක්ෂවරුන්ට සහ ගුරු උපදේශකවරුන් සඳහා පවත්වාගෙන ගිය අතර ඔවුහු ඔවුන්ගේ ප්‍රදේශවල ගුරුවරුන්ට මෙම වෙනස්කම් හඳුන්වා දුන්හ. සංස්කරණය කරන ලද මෙම නව විෂයමාලාවට අදාළ ඉගැන්වීම් පාසල්වල ආරම්භ වූයේ 2015 දී ය.

කෙසේ වෙතත්, මෙම සේවාස්ථ පුහුණු ක්‍රියාවලියෙහි, විශේෂයෙන් නව විෂයමාලා සංස්කරණ පන්තිකාමර මට්ටමේ දී ක්‍රියාත්මක වෙන ආකාරයෙහි කාර්යක්ෂමතාව කොතෙක් ද යන්න

විභාග කළ යුතු වේ. ජාතික අධ්‍යාපන ආයතනය මගින් කරනු ලබන විෂයමාලා වෙනස්කම් මැදි මට්ටමේ පුහුණුකරුවන් විසින් කොතෙක් දුරට ග්‍රහණය කර ගත්තේ ද, අවබෝධ කර ගත්තේ ද යන්න සොයා බැලීම කාලීන අවශ්‍යතාවක් වී ඇත. එමෙන්ම ජාතික අධ්‍යාපන ආයතනය මගින් දෙනු ලබන පණිවිඩය සංශෝධිත විෂයමාලා නව්‍ය ලෙස ක්‍රියාවට නංවන ගුරුවරයා කරා නිසි අයුරින් ළඟා වන්නේ ද යන්න සොයා බැලිය යුතු වේ. තව ද, පුහුණු වැඩසටහන් පිළිබඳ ව විෂයමාලාව ක්‍රියාවට නැංවීමේ යෙදෙන සියල්ලන්ගේ සංජානනය හඳුනා ගැනීම ද, වැඩසටහන්වල ප්‍රබලතා හා දුබලතා හඳුනා ගෙන තේරුම් ගැනීම ද, සේවාස්ථ පුහුණු ක්‍රියාවලියෙහි ගැටලු හඳුනා ගැනීම ද, අනාගතයේ දී වඩාත් හොඳ සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ අනුව මෙම අධ්‍යයනය තුළින්, විශේෂයෙන් 2014 වසරෙහි පවත්වන ලද සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන්වල සංවිධානාත්මක ව්‍යුහය, විෂය ක්ෂේත්‍රය, ක්‍රම විද්‍යාව සහ ඇගයීම් පිළිවෙළ යන කරුණු පිළිබඳ විමර්ශනයක් කිරීම ප්‍රයත්නයක් දරනු ඇත. මේ අනුව මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණු වශයෙන් සඳහන් වනුයේ 2014 පවත්වාගෙන ගිය සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන්වල ප්‍රබලතා හා දුබලතා හඳුනාගෙන ඉන් පාඩම් ඉගෙන, අනාගත පුහුණු වැඩසටහන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වාගෙන යාම ය.

# දෙවන පරිච්ඡේදය
# සාහිත්‍ය විමර්ශනය

ගුරුවරුන්,ශිෂ්‍යයන්ගේ ජීවිතවල සම්භවන වර්ෂවල දී ඔවුන්ට දැනුම දෙන්නන්ද ඔවුන්ගේ ප්‍රධාන සමාජානුයෝග කාරකයන්ද වන හෙයින් අධ්‍යාපන සංවර්ධනය තුළ ප්‍රමුඛ කාර්ය භාරයක් ගුරු අධ්‍යාපනට හිමි වේ. ගුරු අධ්‍යාපනයෙහි හරය වන්නේ එහි විෂය අන්තර්ගතයෙහි ගුණාත්මකභාවය හා අදාළත්වයත්, එමඟින් ගුරුවරුන්ට ලැබෙන ක්‍රමවේද හා කුසලතා ප්‍රවර්ධනය කෙරෙන හිතකර ධනාත්මක ආකල්පත් ය. ඉගෙනුම-ඉගැන්වීම් ක්‍රියාවලිය වූ කලී සහභාගීකත්ව ක්‍රියාකාරකමකි. මේ දිශානතිය සියලුම ගුරු අධ්‍යාපන ආයතන පුරා පැතිර යා යුතුය. (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2003)

පූර්වෝක්ත උධෘතයෙන් හකුළා දක්වෙන පරිදි ගුරු අධ්‍යාපනය, ගුරු සංවර්ධනයෙහි අනිවාර්ය අංගයක් වන්නා සේම එනයින් විෂයමාලා සංවර්ධනයට හා ප්‍රතිසංස්කරණයට සමගාමීව සිදුකරන අඛණ්ඩ ගුරු පුහුණුව පාසල් ඉගෙනුම-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ගුණාත්මය පවත්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන්නේය.ලිට්ල්(1992) පෙන්වා දෙන පරිදි ,ගුරු සංවර්ධන වැඩසටහනකින් අපේක්ෂා කෙරෙන අංග සතරකි. එනම්, දැනුම වර්ධනය, කුසලතා වර්ධනය, විනිශ්චය කිරීමේ හැකියාව වර්ධනය හා වෘත්තීය ප්‍රජාවට ගුරුවරයා දක්වන දායකත්වයෙහි වර්ධනය යනුවෙනි. ලීත්වුඩ් (1992) ගුරු සංවර්ධනයේදී අනුක්‍රමික ව සංකීර්ණතාවයෙන් වැඩි වන මට්ටම් හයක් හඳුනා ගනී.

1. ප්‍රවර්තන කුසලතා සංවර්ධනය
2. ඉගැන්වීමේ මූලික නිපුණතා සංවර්ධනය.
3. ඉගැන්වීමේ නම්‍යශීලිතාව පුළුල් කිරීම
4. ඉගැන්වීමේ විශේෂඥතාව අත්පත් කර ගැනීම
5. ගුරු වෘත්තීය සංවර්ධනයට දායක වීම
6. නායකත්ව භාවිතය හා තීරණ ගැනීමට සහභාගි වීම

ලෝකයේ බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අරභයා ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේද වන්නේ සේවාස්ථ පුහුණු ක්‍රමයයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සේවාස්ථ පුහුණුව (1) දීර්ඝ කාලීන පුහුණුව හා (2) කෙටි කාලීන පුහුණුව යනුවෙන් දෙවැදෑරුම් වන අතර දීර්ඝ කාලින පුහුණුව, සහතිකරණය, උපාධි පශ්චාත් උපාධි ඉලක්ක කර ගනිමින් විශ්ව විද්‍යාල, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන ආයතනය වන ආයතන විසින් පවත්වනු ලැබේ. කෙටි කාලීන සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහනක් විධිමත් ලෙස ආරම්භ වූයේ 1960 විෂයමාලා සංවර්ධනය පිහිටුවීමෙන් පසු වය. වර්තමානයේ සේවාස්ථ ගුරු පුහුණු පාඨමාලා පැවැත්වීමේ වගකීම ප්‍රධාන වශයෙන් ම පැවරී ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනයට ය. එහෙත් ඊට අතිරේක ව අවශ්‍යතා අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල, ගුරු මධ්‍යස්ථාන, ගුරු පුහුණු ආයතන හා ප්‍රාදේශීය ඉංග්‍රිසි උපකාරක මධ්‍යස්ථාන විසින්ද සේවාස්ථ ක්‍රමයෙන් ගුරුවරුනට පුහුණුව සපයනු ලැබේ.

1985 ජාතික අධ්‍යාපන ආයතනය පනත අනුව ගුරුවරුන් සඳහා සේවාස්ථ පුහුණුව සැපයීම ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්යයක් වේ. පාසල පද්ධතියෙහි ප්‍රාථමික, කනිෂ්ඨ, ද්විතික හා ජ්‍යෂ්ඨ ද්විතීක යන සියලු මට්ටමක ම හැම විෂයයක් සඳහා ම ආයතනය පුහුණු සැසි සංවිධානය කරන අතර විශේෂයෙන් නව විෂයමාලාවක් ක්‍රියාත්මක කෙරෙන අවස්ථාවලදී ඒ සඳහා විශේෂ අවධානයක් යොමු වේ. පුහුණු කිරීමේ කටයුතු විෂයමාලා සම්පාදනයේ නිරත ඒ ඒ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සිදුවන අතර අවශ්‍ය තන්හි බාහිර සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබා ගැනේ. සියලු ගුරුවරුන් සඳහා මුහුණට-මුහුණ ලා කෙරෙන අධ්‍යයන සැසි පැවැත්වීම ප්‍රායෝගික නොවන හෙයින් පුහුණුව සිදු කෙරෙනුයේ පියගැට ක්‍රමය (Cascade method)අනුව ය. එනම් මෙහි දී ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන් විසින් (බොහෝ විට ආයතන පරිශ්‍රයේ දී) ඒ ඒ විෂයයට අදාළ ගුරු උපදේශකවරුන් පුහුණු කෙරෙන අතර ඔවුහු ප්‍රාදේශීය තලයේ දී එම පුහුණුව ගුරුවරුන් වෙත ගෙන යති. මෙහිදී 'වැහුම් එලය' අවම කරමින් අදාළ පණිවිඩය සම්පූර්ණ ලෙසත් නිවැරදිවත් තම ග්‍රාහකයා වන ගුරුවරයා වෙත ගෙන යෑම අදාළ ගුරු උපදේශකගේ වගකීම වේ. මේ බව හඳුනා ගන්නා විමලධර්ම ඒකනායක කමිටුව සිය වාර්තාවෙන් (2001) ගුරු උපදේශක කාර්යභාරය මෙසේ සාරාංශ කර දක්වයි.

1. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකරෙන හැම අවස්ථාවකදී ම නව විෂයමාලාව, විෂය නිර්දේශ හා ඉගෙනුම්-ඉගැන්වීම්,ඇගයීම් ක්‍රමවේද පන්තිකාමරයට හඳුන්වා දීම.
2. විෂයමාලා ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ප්‍රමුඛ පුහුණුකරුවකු ලෙස කටයුතු කිරීම.
3. විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට ගුරුවරයාට සහාය වීම හා ගුරුවරයාගේ වෘත්තීය සංවර්ධන ක්‍රියාවලියට මඟපෙන්වන්නෙකු ලෙස කටයුතු කිරීම.
4. විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනයේ දී ප්‍රමුඛ සුසාධ්‍යකරුවෙකු ලෙස කටයුතු කිරීම.
5. විෂයමාලා නවීකරණය හා ප්‍රතිසංස්කරණ කාර්යයේදී ප්‍රධාන සන්නිවේදකයෙකුගේ කාර්යභාර්ය ඉටු කිරීම.

පසුගිය දශක තුනක කාලය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සේවාස්ථ පුහුණුව පිළිබඳ පර්යේෂණ අධ්‍යයන කිපයක් සිදු කර ඇත. කෙසේ වුවද මේ අධ්‍යයන වලින් බොහොමයක් නාභිගත වී ඇත්තේ "උපාධ්‍යාවරුන්" ලෙස පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලවල කාර්ය නියුක්ත ව සිටින්නා වු ද, ජාතික අධ්‍යාපන ආයතනයේ පණිවිඩය ගුරුවරුන් වෙත සන්දේශනය කිරීමේ මුඛ්‍ය කටයුත්ත ඉටුකරන්නා වු ද ගුරු උපදේශකවැන්ගේ භූමිකාව කෙරෙහිය.

ගෙවුණු සියවසෙහි පසු භාගයේ දී පර්යේෂකයන් කිහිපදෙනෙකු විසින් කෙටිකාලින සේවාස්ථ වැඩසටහන්වල සංවිධානයට අදාළ ගැටලු අධ්‍යනයට ලක් කර ඇත. මහානාම (1983), ගුරු අවශ්‍යතා අනුව වැඩසටහන් සංවිධානය කිරීමේ අවශ්‍යතාව යෝජනා කර ඇති අතර සේවාස්ථ වැඩසටහන් ගුරුවරුන්ට සුදුසු දැයි පරික්ෂා කිරීම සඳහා පශ්චාත් ඇගයීම් ක්‍රමයක අවශ්‍යතාව ද පෙන්වා දෙයි. මීට සමාන අදහසක් සේවාස්ථ ගුරු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යනයක යෙදුනු ලීලාරත්න (1994) විසින් ද ඉදිරිපත් කරනු ලැබ ඇත. සේවාස්ථ වැඩසටහන් පිළිබඳ ප්‍රතිපෝෂණයක හා පශ්චාත් ඇගයුමක අවශ්‍යතාව, ගුරු උපදේශකවරුන්ගේ ක්‍රියාකාරකම් තක්සේරු කිරීමේ වැඩපිළිවෙලක

අවශ්‍යතාව, සැසි වලට විදුහල්පතිවරුන් සහභාගි වීමේ අවශ්‍යතාවය හා ගුරු උපදේශකවරුන්ගේ දැනුම හා කුසලතා  යාවත්කාලීන කිරීම සඳහා ඔවුන් නැවත පුහුණු කිරීමේ අවශ්‍යතාවය ද ඇය විසින් යෝජනා කරනු ලැබ ඇත්තේය.

පෙරේරා හා සෙස්සන් (2009) විසින් සිදු කරන ලද අධ්‍යයනයකින් අනාවරණය කෙරෙනුයේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද වැඩසටහන්, විෂයමාලා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව සහභාගි වුවන් පූර්ණ ලෙස දැනුවත් කිරීමට අපොහොසත් වී ඇති බවයි. ඒවායින් අඩුවෙන් ම ප්‍රතිලාභ ලබා ඇත්තේ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට වැඩි ම දායකත්වය සපයන ගුරුවරුන්ය. යම් නිසා අදාළ පුහුණු වැඩසටහන් ප්‍රතිසංස්කරණයට භාජන වීමේ අවශ්‍යතාව ඔවුහු පෙන්වා දෙයි. මීට සමගාමී ව විෂයමාලා ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් සම්පත් නිසි කලට බෙදා හැරීමේ අවශ්‍යතාවය ද ඔවුහු අවධාරණය කරති.

ගුණවර්ධන (2011) විසින් මෑත දී සිදු කරන ලද අධ්‍යනයකින් පෙන්වා දෙන්නේ, රටේ කෙටි කාලීන  ගුරු පුහුණුවට වග කියන රාජ්‍ය ආයතන වන අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල හා ගුරු මධ්‍යස්ථාන අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති බව ය. ඒවා අතර, සැසි සංවිධානය කරමින් හා ශාස්ත්‍රීය සේවා සපයමින් කේන්ද්‍රීය භූමිකාව ඉටු කරන්නේ ජාතික අධ්‍යාපන ආයතනය වන නමුත් පුහුණුව අධීක්ෂණය කිරීමේ, නියාමනය කිරීමේ හා තක්සේරු කිරීමේ අධිකාරීත්වය ඊට අහිමි ය. තම පළාත්වල හා කලාප ගුරු අධ්‍යාපන ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම පළාත් අධ්‍යාපන දෙපාර්තුමේනතුවලට හා කලාප අධ්‍යාපන කාර්යාල වලට පැවරෙන නමුත් ඔවුන්ගේ වගකීම, සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පමණක් සීමා වේ. ගුරු අධ්‍යාපන වැඩසටහන් වල අධීක්ෂණය, නියාමනය හා තක්සේරුව පිළිබඳ වගකීම කිසිවෙක් නො දරති. පළාත්වල සේවාස්ථ පුහුණුව මෙහෙයවන ගුරු මෙහෙයවන ගුරු උපදේශකවරුන් පළාත් දෙපාර්තමේන්තුවලට හා කලාප කාර්යාලවලට අනුයුක්ත ව සිටින නමුදු කලාප මට්ටමේදී විධිමත් තක්සේරුවක් හෝ ඇගයීමක් සිදු නො කෙරේ.

සේවාස්ථ ගුරුපුහුණු වැඩසටහන් වල සුමට සංවිධානමය ක්‍රියාකාරීත්වයට බාධාකාරී සාධක කීපයක්ද ගුණවර්ධන (2011) අනාවරණය කරයි. පර්යේෂක විසින් වැඩසටහන්වලට සහභාගි වන ගුරුවරුන්ගෙන්, විදුහල්පතිවරුන්ගෙන්, ගුරු උපදේශකවරුන්ගෙන් හා ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුකරුවන්ගෙන් ලබාගත් අදහස්වලට අනුව, පුහුණු සැසි පූර්ණ සැලසුම්ගත කාළසටහනකට අනුව පවත්වා නැත. මේ අසංවිධානාත්මක ක්‍රියාවලියට ප්‍රධානතම හේතුව වන්නේ මූල්‍ය ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදයයි. සමීක්ෂණයට භාජන කරන ලද ගුරු උපදේශකවරුන්ගෙන (111), 50%කට ආසන්න ප්‍රමාණයක් ම ප්‍රකාශ කළේ ප්‍රතිපාදන කලට වේලාවට නොලැබෙන බවයි. හැම විෂයකට ම අයත් බොහෝ ගුරුවරුන්ගේ ප්‍රතිචාර වලින් තහවුරු වුයේ සේවාස්ථ සැසි ක්‍රමානුකූලව නොපැවෙත්වෙන බවයි. ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය හේතු කොටගෙන සැසි සංවිධානය කෙරෙනුයේ වර්ෂයේ තුන්වැනි පාසල් වාරයේය. මෙය පාසැල් ඉගැන්වීමේ කටයුතුවලට බාධාවකි. සේවාස්ථ ගුරුපුහුණු වැඩසටහන් ක්‍රමානුගත ව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම බාධකය මෙය බව සඳහන් කෙරිණ.මෙහි ලා පර්යේෂණ විසින් පෙන්වා දෙනු ලබන තවත් කරුණක් වන්නේ ගුරුවරුන්ගේ වර්තමාන අවශ්‍යතා පදනම් කර ගනිමින් සැසි සැලසුම් කිරීමේ අවශ්‍යතාවයි. සැසි පැවැත්වීමට

අවශ්‍ය පහසුකම් නොමැති වීම පුහුණු කරුවන් සේම පුහුණුලාභීන් මුහුණදෙන තවත් දුෂ්කරතාවකි. සැසි පැවැත්වීම සඳහා යොදා ගැනෙනුයේ පාසල් ගොඩනැගිලි, ගුරු මධ්‍යස්ථාන හා වෙනත් සුදුසු ස්ථානය. මෙයින් සමහර ස්ථාන තාක්ෂණික මෙවලම් භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් වලින් තොරය. තවත් ඇතැම් ස්ථානවල සහභාගිවන්නන් විශාල පිරිසක් රඳවා ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැත. එබැවින් අඛණ්ඩ ගුරු අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථාන සංවර්ධනය පියවර ගැනීම හෝ සියලු ආකාර අඛණ්ඩ අධ්‍යාපන කාර්යයන් සඳහා ගුරු මධ්‍යස්ථාන සංවර්ධනය කර භාවිතා කිරීම පර්යේෂක විසින් යෝජනා කෙරේ.

NCREC ආයතන විසින් 2002 දී සිදු කරන ලද අධ්‍යනයකින් ගුරුවරුන් ස්වකීය පුහුණුකරුවන් කෙරෙහි දක්වන ආකල්පමය සාධනීය බවත් සැසි සඳහා ගුරුවරුන්ගේ සහභාගීත්වය සතුටුදායක බවත් අනාවරණය වේ. එසේ වුවද ගුණවර්ධන (2011) පෙන්වා දෙන්නේ සේවාස්ථ සැසි සඳහා ගුරුවරුන්ගේ සහභාගිත්වය එතරම් සතුටුදායක නොවන බවය. තුන්වැනි වාරයේ පාසල් පැවැත්වෙන දිනවල සැසිවලට සහභාගි වීම බරපතල කරුණක් බවට ගුරුවරු පැමිණිලි කර ඇත. 2009 වර්ෂයේ දී වැඩිම  සහභාගිත්ව අනුපාතයක් වාර්තා වී ඇත්තේ ප්‍රාථමික පුහුණු වැඩසටහන් සඳහා ය. විද්‍යාව ගණිතය විෂයයන් සඳහා ද පැමිණීම යහපත් ය. මෙහි ලා ගුරු සහභාගීත්වය අනිවාර්ය කිරීමේ නීතිය  ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පර්යේෂක අවධාරණය කරන අතර ගුරුවරුන්ගේ උසස්වීම් සඳහා සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් සඳහා ඔවුන්ගේ සහභාගිත්වය සලකා බැලිය යුතු බවත්, සහභාගිත්වය වෙනුවෙන් ගුරුවරුන්ට වැඩි දිරිගැන්වීම් ලබා දිය යුතු බවත් හෙතෙම යෝජනා කර සිටියි.

විවිධ විෂයයවල පුහුණුවෙහි ගුනාත්මයෙහි සැලකිය යුතු වෙනස්කම් දක්නට ලැබේ. ගුරු උපදේශකවරුන්ගේ භූමිකාව පිළිබඳ ව අතුකෝරළ (1998) විසින් කරන ලද අධ්‍යයනයකින් අනාවරණය කෙරෙනුයේ සේවාස්ථ පුහුණු වැඩසටහන් ක්‍රියත්මක කරන්නන් ලෙස ගණිත ගුරු උපදේශකවරුන් සතුටුදායක ලෙස ස්වකීය කාර්යභාර්ය ඉටු කරන බවයි. පුහුණුවෙහි ගුණාත්මක බව සම්බන්ධයෙන්   ගුණවර්ධන (2011) ප්‍රකාශ කර සිටින්නේ ගුරුවරුන් විසින් සංජනනය කරන පරිදි, පුහුණුකරුවන් විසින් යොදා ගනු ලබන ඉගැන්වීම් ක්‍රම ගුණාත්මක වශයෙන් යහපත් බවත් ජාතික අධ්‍යාපන ආයතනයේ      පුහුණුකරුවන් විසින් දෙනු ලබන පුහුණුව, ගුරු උපදේශකවරුන් විසින් දෙනු ලබන පුහුණුවට වඩා ඵලදායි බවත් ය. සේවාස්ථ සැසි පැවැත්වෙන ස්ථානවල ඇති පහසුකම්වල ඌනතාව හා තාක්ෂණික මෙවලම් භාවිතට පුහුණුකරුවන්ගේ දැනුම හා කුසලතා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගුරු උපදේශකවරුන් විසින් පුහුණු සැසි වල දී තාක්ෂණය භාවිතයට ගැනීම බෙහෙවින් සීමා සහිත වේ. ඔවුන් විසින් ඉගැන්වීම් ක්‍රමයක් ලෙස ප්‍රධාන කොට ම උපයෝගීකර ගැනෙනුයේ සම්ප්‍රධායික දේශන ක්‍රමයයි.

අධ්‍යක්ෂවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් විසින් පමණක් නොව, ගුරු උපදේශකවරුන් විසින්ම පවා ගුරු උපදේශක භූමිකාව නිසි පරිදි හඳුනාගෙන නොමැති බවයි. ගුරු උපදේශක භූමිකාව පිළිබඳව අධ්‍යනය කල ගජනායක (2007) අනාවරණය කරයි.ගුරු උපදේශක භූමිකාව, උපධ්‍යායවරකුගේ  භූමිකාවක් ලෙස ඇගයීමට ලක්කරන තිලකරත්න (2007),  ගුරු උපදේශක භූමිකාව පිළිබඳව ගුරුවරුන් තෘප්තිමත් බවත් බෙහෝ පාර්ශවකරුවන් විසින් ඔවුන්ගේ භූමිකාව ධනාත්මකව ඇගයීමකට පාත්‍ර කර ඇති බවත් සඳහන් කරයි. එසේ වුව ද ගුරු උපදේශකවරු

ඔවුන්ගේ සේවා තත්ත්ව සම්බන්ධයෙන් අතෘප්තිමත් අතර ඔවුන්ගේ සේවාවෙහි පූර්ණ ප්‍රතිසංවිධානයක් අපේක්ෂා කරති. ගුණවර්ධන (2011) විසින් පෙන්වා දීඇති පරිදි ගුරු උපදේශක සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම, නිසි අවධානයට පාත්‍ර වීමෙන් තොර ව දීර්ඝ කාලයක් තිසසේ ඇදෙමින් පවතිනා ගැටලුවකි. පත්වීම් දීමේ දි විවිධ පළාත් විසින් අනුගමනය කෙරෙන කොන්දේසි වල විෂමතා, නිර්දේශිත වැටුප් ක්‍රමයක් නොමැති විම, උසස්වීම් සඳහා නිශ්චිත පටිපාටියක් හෝ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැතිකම, නිර්දේශිත මාරුවීම් ප්‍රතිපත්තියක් නොමැති වීම හා ජාතික මට්ටමේ සමෝධානයකින් තොර වීම වැනි සේවා ගැටලු හේතු කොට, ගුරු උපදේශකවරුන් සේවය කරන්නේ අතෘප්තියෙනි. ඔවුන්ගේ සේවා අතෘප්තිය සේම මානසික ආතතියත්, ගුරුවරුන් ලෙස ම විශ්‍රාම යැමත් කරණකොට මේ සේවාවේ ගුණාත්මය තව දුරටත් පරිහාණියට පත් වී ඇත. මේ දුෂ්කරතා මඟහරවා ගනු වස්, පළාත් මට්ටමින් ගුරු උපදේශකවැන් බඳවා ගැනීම සඳහා අනුගමනය කෙරෙන අවිධිමත් ක්‍රියාමාර්ග නවතාලිමත්, ගුරු උපදේශක සේවාව, දීප ව්‍යාප්ත සේවාවක් බවට පත්කිරීමෙන් එහි ගුණාත්මක බව ඉහළ නැංවිමට පියවර ගැනීමත් පර්යේෂක විසින් යෝජනා කෙරේ.

ගුණවර්ධන (2011) විසින් පෙන්වා දෙන ලද පරිදි ස්වකීය කාර්යසාධනය පිළිබඳ ව ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුකරුවන් පූර්ණ ලෙස තෘප්තිමත් නොවන්නේ එය ගුරුවරුන්ගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීම සඳහා එතරම් බලපෑමක් කර නොමැති බැවිනි. ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුකරුවන් ම පිළිගන්නා පරිදි ඔවුනගේ පුහුණු වැඩසටහන්වල ඵලදායීතාව සීමාසහිතය. එය පන්තිකාමර ඉගැන්වීම් කෙරෙහි බලපෑම් කිරීමට අපොහොසත්ය. මෙයට ප්‍රධාන හේතුවක් ලෙස ඔහු පෙන්වා දෙන්නේ පියගැට ආකෘතියේ පුහුණුවට (Cascade model training) ආවේණික දූර්වලතාවයක් වු 'වැහුම් ගැටලුවයි' (Trickle down problem). වැහුම් ගැටලුව සමනය කිරීම සඳහා ඉන්දියාව විසින් ගන්නා ලද පිළිවෙත් ඇසුරින් ශ්‍රී ලංකාවේ ද ඉන් ඇති වන හානිය යම් පමණකට අඩු කිරීම සඳහා හෙතෙම මනාව සැලසුම් කරන ලද නියාමන වන අධීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමත් කාර්යක්ෂම ගුරු උපදේශක සේවාවක් පිහිටුවීමෙන් පුහුණුවේ ගුණාත්මක බව ප්‍රවර්ධණය කිරීමත් යෝජනා කරයි.

# තුන්වන පරිච්ඡේදය
# ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන කාර්යයට පර්ශ්ව කිහිපයක් ම සම්බන්ධ ව සිටින්නේ වී නමුත් නෛතික වශයෙන් ඒ පිළිබඳ වගකීම මූලික ව පැවරී ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනයට ය. ප්‍රතිසංස්කණයට භාජන කරන ලද නව විෂයමාලාවක් ඉගැන්වීම සඳහා ගුරු පිරිසක් සූදානම් කරනු කල්හි එම පුහුණුව විශේෂ වැදගත්කමකින් යුක්ත වන්නේ ය. ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ දෙපාර්තමේන්තුව මේ පිළිබඳ අවධානය යොමු කරන ලදු ව සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කරමින් ආයතනය විසින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ ව ඒවායේ ප්‍රධාන ප්‍රතිලාභීන් වන ගුරුවරුන්ගෙන් හා විෂයමාලා සම්පාදකයන් ඇතුළු ගුරු පුහුණුවට සම්බන්ධ අනෙකුත් පර්ශවකරුවන්ගෙන් තොරතුරු ලබා ගැනීමට තීරණය කරන ලදී.

### 3.1 අධ්‍යයනයේ අරමුණ

අනාගත පුහුණු වැඩසටහන් වඩා කාර්යක්ෂම ලෙසත් ඵලදායී ලෙසත් පැවැත්වීම සඳහා ගත හැකි පාඩම් ඉගෙනීම ඉලක්ක කර ගනිමින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් ආරම්භ කොට ගුරු උපදේශකවරුන් මාර්ගයෙන් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක කරන ලද විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන්වප යථා ස්වරූපය හඳුනා ගැනීමේ මේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ.

අධ්‍යයනයේ පුලුල් අරමුණු මෙසේ ය.

- විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව ජාතික අධ්‍යාපන ආයතන විසින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන්වල පවත්නා තත්වය හඳුනා ගැනීම;
- විෂයමාලා පිළිබඳ පුහුණු වැඩසටහන් ගැන පාර්ශ්වකරුවන්ගේ සංජානන හඳුනා ගැනීම;
- උක්ත පුහුණු වැඩසටහන්වලට අදාළ ගැටලු හඳුනා ගැනීම;
- අනාගත ගුරු පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා ගත හැකි ක්‍රමෝපාය හඳුනා ගැනීම.

ඉහත දක්වන ලද අරමුණු පහත දැක්වෙන පර්යේෂණ ප්‍රශ්න බවට පරිවර්තනය කර ගත හැකි ය.

- නව විෂයමලා ප්‍රතිසංස්කරණය පිළිබඳ ව 2014 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්වල ජාතික පුහුණු අරමුණු කවරේ ද?
- ඉහත කී අරමුණු සාක්ෂාත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා කලාප අධ්‍යාපන කාර්යාල විසින් ගන්නා ලද සංවිධිත ක්‍රියාමාර්ග මොනවා ද?
- මේ පුහුණු ක්‍රියාවලියේ දී ව්‍යවහාරකයන් අතරින් කවර නම් කොට්ඨාසයක් ආවරණය වී ද?

- පුහුණු සැසිවල සංවිධානය, අන්තර්ගතය හා ඇගැයීම පිළිබඳ ව පාර්ශවකරුවන්ගේ සංජානනය කෙබඳු වී ද?
- විෂයමාලා පුහුණු වැඩසටහන්වල සංවිධානය, අන්තර්ගතය හා ඇගැයීම සම්බන්ධ ව පාර්ශ්වකරුවන් මුහුණ දුන් ගැටලු මොනවා ද?
- පුහුණු වැඩසටහන්වල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා පුහුණුකරුවන් යෝජනා කරන උපාය මාර්ග කවරේ ද?
- පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරුවරුන් යෝජනා කරන උපාය මාර්ග කවරේ ද?

### 3.2 අධ්‍යයන සංගණනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සේවාස්ථ වෘත්තීය පුහුණු වැඩසටහන් සංවිධානයට හා ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ සියලු ම අංශ මේ අධ්‍යයනයේ සංගහනයට ඇතුළත් වේ. එබැවින් ජාතික අධ්‍යාපන ආයතනය, කලාප අධ්‍යාපන කාර්යාල හා පාසල් විසින් මේ අධ්‍යයනයට අදාළ ආනුභවික ස්ථාන නියෝජනය කෙරේ. මේ අනුව එක් එක් හර විෂයයට සම්බන්ධ ව විෂයමාලා සම්පාදනයේ හා ගුරු පුහුණුවේ නිරත ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ගෙන් ද, කලාප හා පළාත් මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ වගකීම දරන විෂය අධ්‍යක්ෂවරුන්ගෙන් ද, පුහුණුකරුවන් හා ගුරුවරුන් අතර සම්බන්ධීකාරකයන් සේ ක්‍රියා කරන ගුරු උපදේශකවරුන්ගෙන් ද සංගහනය සමන්විත වේ. ඔවුන් අතරින්, ඒ ඒ ස්ථානවල තම භූමිකාවල සක්‍රිය ලෙස නියුක්ත ව සිටින්නා වූ සියලු දෙනා අධ්‍යයනයේ ඉලක්ක ජනගහනය වේ.

### 3.3 නියැදිය

මේ අධ්‍යයනය අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් පෙනී සිටිය යුතු හර විෂයයක් වන මවු බස, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉතිහාසය යන කනිෂ්ට ද්විතීයික මට්ටමේ දී ඉගැන්වෙන හර විෂයනට අදාළ පුහුණු වැඩසහන් නාභිගත ව සිදු කරන ලද්දකි. එබැවින් නියැදියට ඇතුළත් වූ සියලු පිරිස ඉහත කී විෂයයනට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඍජු ව හෝ වක්‍ර ව සම්බන්ධ වූවෝ වෙති. තව ද ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් හැර අනිකුත් සියලු අංශවලින් නියැදියට ඇතුළත් කර ගන්නා ලද සියලු පිරිස්, 2014 වර්ෂයේ දී ඉහත දක්වන ලද විෂයයන් සය සම්බන්ධ පවත්වන ලද සේවාස්ථ ගුරු පුහුණු සැසිවලට සහභාගි වූවන්ට පමණක් සාම්පලය ලෙස සීමා කෙරිණ.

එක් විෂයකට සම්බන්ධ දෙදෙනකු බැගින්, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉහත සඳහන් විෂය සයට අදාළ විෂයමාලා සංවර්ධන කටයුතුවල නිරත වන නිලධාරීන් දොළොස් දෙනෙකු සාරම්මණ ලෙස නියැදියට ඇතුළත් කර ගන්නා ලදී. විෂය අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් තෝරා ගැනීමේ දී අහඹු නියැදීම් ක්‍රමය අනුගමනය කරන ලදී. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි එක් දිස්ත්‍රික්කයකින් එක් කලාපය බැගින් කලාප 25ක් අහඹු ලෙස නියැදියට තෝරා ගැණින. (3.1 වගුව)

3.1 වන වගුව : විෂය අධ්‍යක්ෂ, ගුරු උපදේශක හා ගුරු නියැදිය

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය | සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | විෂය අධ්‍යක්ෂ | ගුරු උපදේශක | පාසල් | ගුරුවරු |
| දකුණු | ගාල්ල | බලපිටිය | 6 | 6 | 5 | 30 |
| | මාතර | තංගල්ල | 6 | 6 | 5 | 30 |
| | හම්බන්තොට | හම්බන්තොට | 6 | 6 | 5 | 30 |
| බස්නාහිර | කොළඹ | කොළඹ | 6 | 6 | 5 | 30 |
| | ගම්පහ | කැලණිය | 6 | 6 | 5 | 30 |
| | කලුතර | හොරණ | 6 | 6 | 5 | 30 |
| මධ්‍යම | මහනුවර | දැනුවර | 6 | 6 | 5 | 30 |
| | නුවර එළිය | හඟුරන්කෙත | 6 | 6 | 5 | 30 |
| | මාතලේ | ගලේවෙල | 6 | 6 | 5 | 30 |
| උතුරු | යාපනය | යාපනය | 6 | 6 | 5 | 30 |
| | කිලිනොච්චිය | කිලිනොච්චිය | 6 | 6 | 5 | 30 |
| | වව්නියා | වව්නියා දකුණ | 6 | 6 | 5 | 30 |
| | මන්නාරම | මඩු | 6 | 6 | 5 | 30 |
| | මුලතිව් | මුලතිව් | 6 | 6 | 5 | 30 |
| උතුරු මැද | අනුරාධපුරය | තඹුත්තේගම | 6 | 6 | 5 | 30 |
| | පොළොන්නරුව | දිඹුලාගල | 6 | 6 | 5 | 30 |
| ඌව | බදුල්ල | පස්සර | 6 | 6 | 5 | 30 |
| | මොණරාගල | වැල්ලවාය | 6 | 6 | 5 | 30 |
| වයඹ | කුරුණෑගල | ගිරිඋල්ල | 6 | 6 | 5 | 30 |
| | පුත්තලම | හලාවත | 6 | 6 | 5 | 30 |
| සබරගමුව | කෑගල්ල | කෑගල්ල | 6 | 6 | 5 | 30 |
| | රත්නපුර | ඇඹිලිපිටිය | 6 | 6 | 5 | 30 |
| නැගෙනහිර | අම්පාර | සමන්තුරෙයි | 6 | 6 | 5 | 30 |
| | මඩකලපුව | පත්තිරිප්පු | 6 | 6 | 5 | 30 |
| | ත්‍රිකුණාමලය | මුත්තූර් | 6 | 6 | 5 | 30 |
| එකතුව | | | 150 | 150 | 125 | 750 |

මුලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

පළමු ව ශ්‍රී ලංකාවේ එක් එක් අධ්‍යාපන දිස්ත්‍රික්කයෙන් එක් අධ්‍යාපන කලාපය බැගින් අහඹු ලෙස නියැදියට ඇතුළත් කර ගන්නා ලද අතර ඒ අනුව අධ්‍යපන කලාප 25 ක් නියැදියට ඇතුළත් විණි. (3.1 වගුව) එක් අධ්‍යාපන කලාපයෙන්, ඉහත සඳහන් කරන ලද හර විෂයන් හය නියෝජනය කරන විෂය අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු හා ගුරු උපදේශකවරුන් හය දෙනෙකු සාරම්මණ ලෙස තෝරා ගන්නා ලදී. තෝරා ගන්නා ලද එක් එක් කලාපයෙන් ස්තරගත පදනම යටතේ 1AB, 1C හා 2 යන පාසල් වර්ග ද, පිරිමි, ගැහැනුඅ හා මිශ්‍ර යන පාසල් ද නියෝජනය වන පරිදි පාසල් පහ බැගින් පාසල් 125 තෝරා ගැණින. එම එක් එක් පාසලින් යට කී හර විෂය සය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් සය දෙනෙකු තෝරා ගන්නා ලද අතර ඒ අනුව නියැදියට ඇතුළත් වූ මුළු ගුරුවරුන් සංඛ්‍යාව 750 කි. ඒ එක් එක් කලාපයකින් 30 දෙනෙකු බැගිනි. මේ අනුව සමස්ත නියැදිය විෂය අධ්‍යක්ෂවරුන් 150 දෙනෙකුගෙන්, ගුරු උපදේශකවරුන් 150 දෙනෙකුගෙන් හා ගුරුවරුන් 750 දෙනෙකුගෙන් සමන්විත විය. මේ සියලු පාර්ශ්වකරුවෝ 2014 වර්ෂයේ දී පවත්වන ලද සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූවෝ වූහ.

නාභිගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා සඳහා බස්නාහිර පළාත, දකුණු පළාත, වයඹ පළාත හා උතුරු පළාත යන පළාත් සතර අහඹු ලෙස තෝරා ගන්නා ලදී. මෙයින් උතුරු පළාත දෙමළ මාධ්‍යය නියෝජනය කළ අතර අනෙක් පළාත් තුනෙන් සිංහල ඉගැන්වීම් මාධ්‍යය නියෝජනය විණ. ඉහත එක් එක් පළාතෙන් ගුරු උපදේශකවරුන් 12 දෙනෙකු සම්මුඛ සාකච්ඡා සඳහා තෝරා ගන්නා ලදී. ඔවුන්ගෙන් දෙදෙනෙක් එක් හර විෂයයක් නියෝජනය කළහ.

### 3.4 දත්ත රැස් කිරීම

තැපැල් මගින් යවන ලද වෙන් වෙන් ප්‍රශ්නාවලි තුනකින් විෂය අධ්‍යක්ෂවරුන්ගෙන්, ගුරු උපදේශකවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙන් දත්ත ලබා ගැණින.

විෂයමාලා සංවර්ධන කාර්යයේ නිරත ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන්ගෙන් දත්ත රැස් කර ගන්නා ලද්දෙ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙනි. තෝරා ගන්නා ලද පළාත් සතරෙහි ගුරු උපදේශකවරුන්ගෙන් දත්ත සපයා ගැනීම සඳහා අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලයක් භාවිත කර ගනිමින් නාභිගත කණ්ඩායම් සාකච්ඡා සතරක් පවත්වන ලදී. එක් නාභිගත සම්මුඛ සාකච්ඡාවක් සඳහා දත්ත රැස් කරන්නෝ දෙදෙනෙක් සහාය වූහ.

දත්ත එක් රැස් කිරීමේදී පර්යේෂණ කාර්ය පහසු කර ගැනීම සඳහා කලාප මට්ටමින් පර්යේෂණ නියෝජිතයන්ගේ සහය ලබා ගන්නා ලදි

### 3.5 දත්ත විශ්ලේෂණය

ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙආකාරයෙන් ම දත්ත විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක තොරතුරු විශ්ලේෂණය කරන ලද්දේ තේමා පාදක ගුණාත්මක ක්‍රම භාවිතයට ගනිමිනි. ප්‍රතිශත භාවිතයට ගනිමින් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කරන ලදී.

### 3.6 සීමා හා පරිසීමා

අධ්‍යයනය සඳහා මිඩංගු කළ හැකි සීමිත කාලය හා අනෙක් බාධා සැලකිල්ලට ගනිමින් අධ්‍යයනය, හර විෂයන් සයකට අදාළ ව පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට පමණක් සීමා කෙරිණ. අධ්‍යයනයේ මූලික නියැදුම් ඒකකය වන අධ්‍යාපන කලාප, එක් දිස්ත්‍රික්කයක් එක් කලාපයකින් පමණක් නියෝජනය වන පරිදි කලාප 25 කට පමණක් සීමා කෙරිණ. එක් කලාපයකින් තෝරා ගන්නා ලද පාසල් හා ගුරුවරුන් සංඛ්‍යාව පිළිවෙළින් 5 කට හා 30 කට සීමා කරන ලද අතර එම සංඛ්‍යාව තෝරා ගැනීමේ දී අනුපාතික වීමේ සාධකය නොලසකා හරින ලදී.

දෙමළ මාධ්‍ය පාර්ශ්වකරුවන්ගේ නියෝජනය තහවුරු කරන ලද්දේ උතුරු පළාතෙන් අධ්‍යාපන කලාප පහක් නියැදියට ඇතුළත් කිරීමෙනි. එය ද හරියට ම ජනගහනයට අනුපාතික තෝරා ගැනීමක් නොවිණ.

# සිවුවන පරිච්ඡේදය
# දත්ත විශ්ලේෂණය

2014 වර්ෂයේදී නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හා සම්බන්ධව ජාතික අධ්‍යාපන ආයතනය (NIE) මූලිකව ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පුහුණු වැඩසටහන්වල පවතින තත්වය හඳුනාගැනිම මූලික අභිප්‍රාය කරගත් මෙම පර්යේෂණය මගින් මතු දැක්වෙන සුවිශේෂී පර්යේෂණ අරමුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

1. විෂයමාලා පුහුණු වැඩසටහන් පිළිබඳව පාර්ශවකරුවන් සංජානනය හඳුනාගැනීම.
2. පුහුණු වැඩසටහන් වල ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු හඳුනාගැනීම.
3. ජාතික අධ්‍යාපන ආයතනය හා කලාප මට්ටමේ සිදු කරනු ලබන ඉදිරි පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය උපාය මාර්ග හඳුනාගැනිම.
4. කලාප මට්ටමින් සිදුකරනු ලබන සේවාස්ථ පුහුණු සැසි සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

මෙම අධ්‍යයනය සඳහා පහත දැක්වෙන පරිදි නියැදිය තෝරා ගන්නා ලදී. ප්‍රධාන හර විෂයහය වන මවු බස, ආගම, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉතිහාසය නියෝජනය වන පරිදි නියැදිය තෝරාගැනීම සිදු කළ අතර සිංහල හා දෙමළ මාධ්‍ය නියෝජනය වන පරිදි ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරා ගළුක් දිස්ත්‍රික්කයකින් එක් කලාපය බැගින් කලාප 25 පදනම්කරගෙන දත්ත ලබාගැනීම සිදුකරන ලදී.

4.1 වන වගුව: පර්යේෂණය සඳහා යොදාගනු ලැබූ නියැදිය හා දත්ත එක්රැස් කරන ලද ක්‍රමවේද

| අනු අංක | දත්ත එක්රැස් කිරීම සඳහා යොදාගනු ලැබූ පාර්ශවකරුවන් | දත්ත එක්රැස් කරන ලද ක්‍රමවේද | සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍ය | |
| 1 | විෂයමාලා සම්පාදක (ජාතික මට්ටම) | සම්මුඛ සාකච්ඡා | 11 | 1 | 12 |
| 2 | විෂය අධ්‍යක්ෂ (පළාත් මට්ටම) | ප්‍රශ්ණාවලිය | 70 | 25 | 95 |
| 3 | ගුරු උපදේශක (පළාත් මට්ටම) | ප්‍රශ්ණාවලිය | 83 | 46 | 129 |
| 4 | ගුරු උපදේශක (පළාත් මට්ටම) | නාභිගත සම්මුඛ සාකච්ඡා | 36 | 12 | 48 |
| 5 | ගුරු භවතුන් (පළාත් මට්ටම) | ප්‍රශ්නාවලිය | 457 | 216 | 673 |
| | එකතුව | | 657 | 300 | 957 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

මෙම පර්යේෂණය ප්‍රධාන පියවර දෙකක් යටතේ සංවිධානය කරන ලදී.

1. ජාතික අධ්‍යාපන ආයතනය විසින් පළාත් මට්ටමේ විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා පවත්වනු ලැබූ පුහුණුකරුවවන් පුහුණු කිරීමේ (TOT) සේවාස්ථ සැසි පිළිබඳ තොරතුරු විශ්ලේෂණය.
2. පළාත් මට්ටමේ විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් විසින් පාසල් මට්ටමේ ගුරු භවතුන් සඳහා පුහුණු සැසි සඳහා සංවිධානය කරනු ලැබූ සේවාස්ථ සැසි පිළිබඳ තොරතුරු විශ්ලේෂණය.

අධ්‍යයනයේ පළමු පියවර යටතේ, සලකා බලනු ලබන්නේ, ජාතික මට්ටමින් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් ප්‍රධාන හර විෂයන් 6ක් යටතේ සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් සිදුකරනු ලැබූ විෂයමාලා සංශෝධන වලට අදාල පුහුණු සැසි පිළිබඳව විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සංජාණනය කෙබඳු වේද යන්න විමසීමයි.

දෙවන පියවරේදී සිදු කරනු ලැබුවේ පළාත් මට්ටමේ ක්‍රියාත්මක කරන ලද සේවාස්ථ සැසි පිළිබඳව පාසල් මට්ටමේ ගුරු භවතුන්ගේ සංජානනය විමසිමයි. මෙහිදි පළාත් මට්ටමින් හා කලාප මට්ටමින් විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් විසින් සංවිධානය කරනු ලැබූ සැසි පිළිබඳව අවධානය යොමු කරණ ලදී.

අධ්‍යයනයේ පළමු පියවරේදී ප්‍රශ්ණාවලිය තුලින් ලැබූ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය තුළට අදාල විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳව සංඛ්‍යාත්මක විග්‍රහයන් ප්‍රතිශත ආශ්‍රයෙන් සිදු කරනු ලබන අතර, ගුණාත්මක දත්ත ලබාගැනීම සඳහා භාවිතකරනු ලැබූ විවෘත ප්‍රශ්ණ හා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ආශ්‍රයෙන් ගොනුකර ලැබූ ගුණාත්මක දත්ත පර්යේෂණ අරමුණ අනුව ගොඩනගාගන්නා ලද තේමා පදනම්කරගෙන ගුණාත්මක දත්ත විශ්ලේෂණ මූලධර්ම හරහා සංස්ලේෂණය කර ඇත.

අධ්‍යයනයේ ප්‍රමාණාත්මක දත්ත මත පදනම් ආයතනයේ සමස්ථ නිරීක්ෂණ හා නිගමන, යෝජනා ඉදිරිපත් කර ඇත.

## 4.1 පළමු පියවර - ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවැත්වූ පුහුණු සැසි පිළිබඳ විශ්ලේෂණය

පළමු පියවර යටතේ, ජාතික අධ්‍යාපන ආයතනය (ජඅආ) විසින් සංවිධානය කරණ ලද, ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂ වරුන් සහභාගීවන්නන් ලෙස සංවිධානය කරණු ලැබූ සැසි පිළිබඳ මූලික තොරතුරු ඉදිරිපත් කිරීම සිදුකර ඇත. නියැදිය වශයෙන් විෂය අධ්‍යක්ෂවරුන් 150 හා ගුරු උපදේශකවරුන් 150 යොදා ගැනීමට සැලසුම් කළ ද සත්‍ය වශයෙන් ම ප්‍රශ්නාවලිවලට ප්‍රතිචාර දක්වූ සංඛ්‍යාව එම ප්‍රමාණයට වඩා අඩු විය. ප්‍රශ්ණාවලිවලට ප්‍රතිචාර දක්වන ලද පිරිස පදනම් කරගෙන මතු දක්වන තොරතුරු ඉදිරිපත් කර ඇත.

4.2 වන වගුව: ජාතික අධ්‍යාපන ආයතනයේ සැසි සඳහා සහභාගිත්වය

| පිරිස් කාණ්ඩය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1. ADE - විෂය අධ්‍යක්ෂවරුන් | 95 | 42.4 |
| 2. ISA - ගුරු උපදේශකවරුන් | 129 | 57.6 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.3 වන වගුව: පළාත් අනුව සහභාගිවූ විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන්ගේ ප්‍රමාණය

| පළාත | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. මධ්‍යම පළාත | 22 | 9.8 |
| 2. නැගෙනහිර පළාත | 28 | 12.5 |
| 3. උතුරු මැද පළාත | 18 | 8.0 |
| 4. උතුරු පළාත | 43 | 19.2 |
| 5. වයඹ පළාත | 22 | 9.8 |
| 6. සබරගමු පළාත | 23 | 10.3 |
| 7. දකුණු පළාත | 17 | 7.6 |
| 8. ඌව පළාත | 19 | 8.5 |
| 9. බස්නාහිර පළාත | 32 | 14.3 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.4 වන වගුව: ස්ත්‍රී / පුරුෂ භාවය අනුව සැසි සඳහා සහභාගීත්වය

| පුම්තිරි බව | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. ගැහැණු | 99 | 44.2 |
| 2. පිරිමි | 125 | 55.8 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.5 වන වගුව: භාෂා මාධ්‍යය අනුව සහභාගීත්වය පිළිබඳ තොරතුරු

| භාෂා මාධ්‍යය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 144 | 64.3 |
| දමිළ | 64 | 28.6 |
| ඉංග්‍රීසි | 16 | 7.1 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.6 වන වගුව: නියෝජනය කරණු ලබන ප්‍රධාන හර විෂය අනුව සහභාගීත්වය පිළිබඳ තොරතුරු

| නියෝජනය කරනු ලබන ප්‍රධාන විෂය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 38 | 17.0 |
| ඉංග්‍රීසි | 49 | 21.9 |
| ආගම | 25 | 11.2 |
| ඉතිහාසය | 30 | 13.4 |
| විද්‍යාව | 41 | 18.3 |
| ගණිතය | 41 | 18.3 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.7 වන වගුව: සහභාගීවන්නන්ගේ සේවා පළපුරුද්ද අනුව සහභාගීත්වය

| සේවා පළපුරුද්ද | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| වසර 5ට වඩා අඩු | 46 | 20.5 |
| වසර 5-10 අතර | 24 | 10.7 |
| වසර 10ට වඩා වැඩි | 154 | 68.8 |
| **එකතුව** | **224** | **100** |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් ලංකාවේ සියලු පළාත් නියෝජනය කරණ පරිදි තෝරාගත් විෂයන් සඳහා විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා ජාතික අධයාපන ආයතනයේදී පුහුණු සැසි පැවැත්වීම සිදුකරණ ලදී. මෙම පුහුණු සැසි සඳහා ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් එකම කණ්ඩායමක් ලෙස සහභාගීකරගෙන සැසි පැවැත්වීම සිදුකරණ ලදී. එබැවින් ඔවුන් සැසි පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාර ගුරු උපදේශනවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රතිචාරවල එකතුවක් ලෙස සලකා විශ්ලේෂනයට භාජනය කරණ ලදී.

### 4.1.1. විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවැත්වූ පුහුණු සැසි පිළිබඳ සංජානන විශ්ලේෂණය

විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවැත්වූ පුහුණු සැසි පිළිබඳ පාර්ශවකරුවන් දෙපිරිසක් සංජානනය විමසීම සිදුකරණු ලැබුයේ ඔවුන්ට ලබාදුන් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමෙනි. ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලැබු සැසි පිළිබඳව පාර්ශවකරුවන් සංජානනය විමසනු ලැබුවේ ප්‍රධාන තේමා 4ක් පදනම් කරගෙනයි.

1. සංවිධානය
2. අන්තර්ගතය
3. ක්‍රමවේදය
4. ඇගයීම

සමස්ත සැසියේ මතු දක්වන ලද ප්‍රධාන තේමා උප තේමා 20ක් ඔස්සේ තවදුරටත් විභේදනය කොට පාර්ශවකරුවන් සංජානනය වරණ 5ක් ඔස්සේ ලබාගැනීම සිදුකරණ ලදී.

1. තරයේ එකඟ වෙමි
2. එකඟ වෙමි
3. ප්‍රකාශ කළ නොහැක
4. එකඟ නොවෙමි
5. තරයේ එකඟ නැමි

මෙම සහභාගිවුවන්ගේ එකඟතාවය දැක්වෙන ප්‍රකාශ විශ්ලේෂණය කිරීමේ පහසුව සඳහා ප්‍රධාන වර්ගීකරණයන් 03ක් යටතේ විග්‍රහ කිරිම සිදුකරණ ලදී.

1. තරයේ එකඟවෙමි සහ එකඟවෙමි යන ප්‍රකාශ දෙක එකඟවෙමි යටතේද
2. තරයේ එකඟවෙමි සහ එකඟ නොවෙමි යන ප්‍රකාශ දෙක එකඟ නොවෙමි
3. ප්‍රකාශ කළ නොහැකිය යන්න ඒ ලෙසම ප්‍රයෝජනයට ගැනීම සිදුකරණ ලදී

ඒ අනුව ප්‍රකාශ 03ක් ලෙස විශ්ලේෂණයට ලක්කරන ලදී. පාර්ශවකරුවන් සංජානනය ප්‍රධාන තේමා 4 සහ උප තේමා ඔස්සේ විශ්ලේෂනයට ලක් කිරිම මතු දැක්වේ.

4.8 වන වගුව: පුහුණු සැසිවල සංවිධානය පිළිබඳ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | |
| | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| 1. සැසි සඳහා යොදාගත් දින ගණන ප්‍රමාණවත් විය. | 50 | 22.3 | 15 | 6.7 | 159 | 71.0 |
| 2. සැසි සඳහා හොඳ පූර්ව සුදානමක් තිබුණි. | 23 | 10.3 | 22 | 9.8 | 179 | 79.9 |
| 3. කාල කළමනාකරණය සතුටුදායක මට්ටමක තිබුණි. | 37 | 16.5 | 21 | 9.4 | 166 | 74.1 |
| 4. සැසි සහභාගීත්වයට හැකිවන ලෙස ප්‍රමාණවත් කාලයක් සහිතව දැනුම් දී තිබුණි | 19 | 8.5 | 13 | 5.8 | 192 | 85.7 |
| 5. සහභාගිවීමට පහසු දිනවල සැසි සංවිධානය කර තිබුණි | 37 | 16.5 | 32 | 14.3 | 155 | 69.2 |
| සැසි සංවිධානය පිළිබඳ සමස්ත සංජානනය | 166 | 14.82 | 103 | 9.19 | 851 | 75.98 |

N = 224 / සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව, 1120 = 224 x 5
මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය 2015

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලැබූ සැසි පිළිබඳව පාර්ශවකරුවන් සංජානනය පහත සඳහන් තේමා ඔස්සේ විශ්ලේෂණය ගොනු කරනු ලැබිණ.

4.1.1-1 පුහුණු සැසිවල සංවිධානය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානනය

4.1.1-2 පුහුණු සැසිවල අන්තර්ගතය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන

4.1.1-3 පුහුණු සැසිවල ක්‍රමවේදය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන

4.1.1-4 පුහුණු සැසිවල ඇගයීම පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන

### 4.1.1 - 1 **පුහුණු සැසිවල සංවිධානය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානනය**

පුහුණු වැඩසටහන් සංවිධානය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානනය විමසීමේදී සැසි සඳහා යොදාගනු ලැබූ දින ගණන පිළිබඳව එකඟතාවය පළ කරණ ලද්දේ නියැදියන් 159 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 71.0 විය. සැසි සඳහා යොදාගත් දින ප්‍රමාණවත්ය යන්න බහුතරයක්ගේ අදහස විය. ඒ අදහස 159 සනාථ කර තිබූ අතර, එම ප්‍රකාශය සඳහා එකග නොවූ ප්‍රතිශතය සියයට 22.3 විය. සහභාගිවන්නන් බහුතරයක අදහස වූයේ සැසි ප්‍රමාණවත් දින ගනනක් සැසි පැවැත්වූ බවයි.

සැසි සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින්ගේ පෙර සූදානම පිළිබඳ විමසීම සිදුකරණ ලදී. සැසි සඳහා යෝග්‍ය පූර්ව සුදානමක් තිබූ බව ප්‍රකාශකර සිටියේ නියැදියෙන් 23 එනම් සියයට 10.3 පමණි. නියැදියන් 179 ප්‍රකාශ කර සිටියේ සැසි සඳහා විෂයමාලා සම්පාදකයින්ගේ ප්‍රමාණවත් පෙර සුදානමක් නොතිබූ බවයි. එය සමස්. නියැදියේ ප්‍රතිශතයක් ලෙස

සියයට 79.9 විය. බහුතර පිරිසකගේ අදහස වුයේ පූර්ව සුදානමක් නොමැති සැසි සංවිධානය කර තිබූ බවයි.

පවත්වනු ලැබූ සැසි වල කළමනාකරණය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානනවිමසීම සිදුකරන ලදි. සැසියේ කාල කළමනාකරණය සතුටුදායක මට්ටමක තිබූ බව ප්‍රකාශකරණ ලද්දේ මුලු නියැදියෙන් 37ක් එනම් සියයට 16.5 පමණි. ඉතිරි 166 දෙනෙකු ප්‍රකාශ කරණ ලද්දේ කාල කළමනාකරණය සතුටුදායක මට්ටමක නොතිබූ බවයි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 74.1 විය. මේ අනව බහුතරයකගේ අදහසි වී ඇත්තේ, පවත්වනු ලැබූ සැසිවල කාල කළමනාකරණය දුර්වල මට්ටමක පැවැති බවයි.

සැසි සඳහා සහභාගිවීමට ප්‍රමාණවත් කාලයක් සහිතව දැනුම්දීම පිළිබඳ විමසීමේදී පතිචාරය වුයේ මුලු නියැදියන්, 192 එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 85.7 ප්‍රකාශ කළේ සහභාගීවීම සඳහා ප්‍රමාණවත් කාලයක් සහිතව දැනුම්දීම සිදු නොවුවි ලැබෙන කැඳවීම් මත දින කිහිපයක් පවත්වනු ලබන සැසි සඳහා ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් හට සහභාගීවීම ප්‍රායෝගිකව පහසු කරුණකි. එබැවින් සැසි සඳහා දැනුවත් කිරීමේ කාල සීමාව ප්‍රමාණවත් නොවූ බව බහුතර පිරිසකගේ ප්‍රතිචාරය විය.

සැසි සංවිධානය කරනු ලබන දින වකවානු සහභාගීවන්නන්ට පහසු වන පරිදි සංවිධානය කර තිබේදැයි යන්න විමසීමට භාජනය කරණ ලදී. සහභාගිවන්න් සඳහා පහසු අවස්ථාවක සැසි සංවිධානය කර තිබූ බවත්, එනම් සහභාගීත්වය පහසු මට්ටමක පැවැති බව ප්‍රකාශ කර ඇත්තේ සමස්ත නියැදියෙන් 37 එනම් සියයට 16.5 පමණි. ඉතිරි 155 ප්‍රකාශ කර ඇත්තේ, සැසි සංවිධානය කර තිබූ දින වකවානු අනුව සහභාගීවන්නට අපහසුතා ඇති වු බවයි. එම ප්‍රතිශතය සියයට 69.2 විය. සහභාගීවන්නන්ගෙන් 32 ක් එනම් සියයට 14.3 මේ පිළිබඳව ඍජු අදහස් ප්‍රකාශ කිරීම සිදු කර නොමැත.

පුහුණු සැසි සංවිධානය පිළිබඳ සමස්ත සංජානනය විමසීමේදී නියැදියේ 224 තුළින් ලත් ප්‍රතිචාර වගු අංක 4 8 යටතේ ඉදිරිපත් කර ඇත. මේ අනුව, නියැදියෙන් ලැබිය යුතු සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව 1120 කි. (224 x 5) මෙම ප්‍රතිචාර 1120 විහිදි ගොස් ඇති ආකාරය විමසීම වැදගත් වේ. සැසි සංවිධානය පිළිබඳ සංජානනය විමසීමේදී ලබාදුන් ප්‍රකාශ 5 සඳහාම එකඟතාවය දැක්වූ ප්‍රතිචාර සංඛ්‍යාව 851 කි. එය මුල් ප්‍රතිචාර සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 75ග98 කි. එමෙන්ම ප්‍රතිචාර දැන්විම් අතරින් ප්‍රකාශ සඳහා එකඟ නොවන ප්‍රතිචාර ප්‍රමාණය 166 වේ. එය මුල් ප්‍රතිචාර සංඛ්‍යාවේ එකතුවක් ෙ ව ස සියයට 14.82 ක් වේ. මේ අනුව පැහැදිලි වන්නේ, සැස සංවිධානය පිළිබඳ සමස්ත තත්වය විමසීමේදී නියැදියන් බහුතරයක්, සංවිධානය තුල සිදුකර ඇති ක්‍රියාකාරකම් කෙරෙහි එකඟතාවයක් දක්වන බවයි.

4.1.1 - 2 **පුහුණු සැසිවල අන්තර්ගතය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන**

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් පවත්වනු ලැබූ සැසිවල අන්තර්ගතය පිළිබඳ විමසීම සඳහා ප්‍රකාශ 4ක් ලබාදීම සිදුකරන ලදී. එම ප්‍රකාශ සඳහා නියැදිය ලබාදුන් ප්‍රතිචාර එකතුව වගු අංක 4.9යටතේ දක්වා ඇත.

4.9 වන වගුව: පවත්වනු ලැබූ සැසිවල අන්තර්ගතය පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | |
| | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| 1. දැනුවත් කරණ ලද විෂය සන්ධාරය ප්‍රමාණවත් විය. | 38 | 17 | 25 | 11.2 | 161 | 71.9 |
| 2. විෂය අන්තර්ගතය ප්‍රායෝගික අත්දැකීම් ලබාගත හැකි ලෙස සංවිධානය කර තිබුණි. | 39 | 17.4 | 23 | 10.3 | 162 | 72.3 |
| 3. නව සංශෝධන පිළිබඳ දැනුවත් කිරීම ගුරුවරුන්ට විෂය ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් විය | 38 | 17 | 31 | 13.8 | 155 | 69.2 |
| 4. අන්තර්ගතයට අදාල මුලාශ්‍ර යොමු කිරිම සිදු කෙරින. | 32 | 14.3 | 39 | 17.4 | 153 | 68.3 |
| සැසි අන්තර්ගතය පිළිබඳ සමස්ත සංජානනය | 147 | 16.4 | 118 | 13.16 | 631 | 70.42 |

N = 224 / සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව 224 x 4 = 896
මුලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

සැසියේදී සහභාගීවන්නන් දැනුවත් කරණ ලද විෂය සන්ධාරය පිළිබඳ සහ එය ප්‍රමාණවත් භාවය පිළිබඳව එකඟතාවය පළ කරන ලද්දේ මුලු නියැදියෙන් 161 කි. එය සියයට 71.9 වේ. අන්තර්ගතය ප්‍රමාණවත් නොවන බවට 38 දෙනෙක් ප්‍රතිචාර දක්වා ඇත. එය ප්‍රතිශත අගය සියයට 17 වේ. මේ අනුව නියැදියෙන් බහුතරයකගේ අදහස් වී ඇත්තේ සැසි වලදී ලබාදුන් විෂය අන්තර්ගතය ඉදිරි කටයුතු සඳහා ප්‍රමාණවත් වන බවයි.

විෂය අන්තර්ගතය ප්‍රායෝගික අත්දැකීම් ලබාගත හැකිවන පරිදි සැසි සංවිධානය කිරිම පිළිබඳව විමසිම උදෙසා ප්‍රකාශයක් ලබාදීම සිදුකරන ලදී. සැසිය විෂය අන්තර්ගතය හා ප්‍රායෝගික අත්දැකීම් ලබාගත හැකිවන පරිදි සැළසුම් කර තිබුණි යන ප්‍රකාශය හා එකඟ වුයේ නියැදියෙන් 162 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 72.3 කි. ඒ අනුව බහුතරයක් සැසි තුළින් විෂය අන්තර්ගතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකිම් ලැබීමට හැකි වූ බව ප්‍රකාශ කර ඇත.

සැසි මගින් නව සංශෝධන පිළිබඳ දැනුවත් කිරීම ගුරු භවතුන්ගේ විෂය ඉගැන්වීමේ කටයුතු සඳහා මගපෙන්වීම ප්‍රමාණවත් වීද යන්න පිළිබඳ සහභාගීවන්නන්ගේ ආකල්පය විමසීම සිදුකරන ලදී. මෙහිදී ලැබුණ ප්‍රතිචාර වුයේ, ලැබුණ දැනුම ප්‍රමාණවත් විය යන්න එකඟතාවය පළ කරනු ලැබුවේ නියැදියෙන් 155 ක් එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 69.2 පමණි. විෂය ඉගැන්වීම සඳහා

ප්‍රමාණවත් දැනුමක් නොලැබුණ බවට නියැදියෙන් 38 එනම් සියයට 17 ප්‍රකාශකර ඇත. මේ අනුව විමසන විට පැහැදිළි වන්නේ සැසි වලින් නව සංශෝධන පිළිබඳව ප්‍රායෝගික දැනුමක් ප්‍රමාණවත් පරිදි ලැබුණු බව සංඛ්‍යා දත්ත අනුව ගම්‍ය වේ.

නව විෂය සංශෝධන වල අන්තර්ගතය පිළිබඳව වැඩිදුර ගවේෂණය සඳහා මුලාශ්‍ර වලට යොමු කිරීම පිළිබඳව විමසීම සිදුකරණ ලදී. මෙහිදි ලැබුණු ප්‍රතිචාර වුයේ සමස්ත නියැදියෙන් 32 එනම් සියයට 14.3 මුලාශ්‍රවලට යොමු කිරීම සිදු නොකල බව ප්‍රකාශ කල අතර, බහුතරයක් එනම් 153 ප්‍රකාශ කර සිටියේ නව මුලාශ්‍ර කරා යොමු කිරීමක් සිදු කල බවයි. සැසි අන්තර්ගතය පිළිබඳ සමස්ත සංජානනය විමසීමේදී, සියලු ප්‍රකාශවලට එකඟතාවය පළ කරන ලද ප්‍රතිචාර 631 ලැබී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට 16.4කි. නිශ්චිතවම අදහස ප්‍රකාශ කළ නොහැකි ප්‍රතිශතය 70.42 කි. සැසි වලදී මුලාශ්‍ර වල වැදගත්කම හා ඒ පිළිබඳව ගවේෂණය කළ යුතුයි යන්න පිළිබ, අවධානය යොමු කරමින්, අන්තර්ගතය අදාළ මුලාශ්‍ර වෙත නිවැරදිය යොමු කල බව සඳහන් කළ ප්‍රතිශතය ඉහල අගයක් විය.

### 4.1.1 - 3 **පුහුණු සැසිවල ක්‍රමවේදය පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන**

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් පවත්වනු ලැබූ සේවාස්ථ සැසිවල ක්‍රමවේදය පිළිබඳව විමසීම ප්‍රකාශ 8ක් ඔස්සේ සිදුකරණ ලදී.

4.10 වන වගුව: පවත්වන ලද සැසිවල ක්‍රමවේදය පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | |
| | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| 1. සැසියේ අරමුණ පිළිබඳව දැනුවත් කෙරිණ. | 11 | 4.9 | 21 | 9.4 | 192 | 85.7 |
| 2. ඉගැන්වීම් ක්‍රමවේදය සැසි අරමුණ හා ගැලපී තිබුණි. | 20 | 8.9 | 24 | 10.7 | 180 | 80.4 |
| 3. උචිත පරිදි ඉගෙනුම් ආධාරක භාවිතා කරණ ලදී. | 35 | 15.6 | 19 | 8.5 | 170 | 75.9 |
| 4. ප්‍රායෝගික ක්‍රියාකාරකම් උපයෝගී කරගෙන තිබුණි. | 40 | 17.9 | 38 | 17 | 146 | 65.2 |
| 5. නවෝත්පාදක ඉගැන්වීම් ක්‍රම භාවිතා කෙරුණි. | 38 | 17 | 50 | 22.3 | 136 | 60.7 |
| 6. නවීන තාක්ෂණය භාවිතා කරණ ලදී. | 32 | 14.3 | 33 | 14.7 | 159 | 71.0 |
| 7. සැසිවලදි යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගන්නා ලදී. | 22 | 9.8 | 20 | 8.9 | 182 | 81.2 |
| 8. විෂය හා එහි ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබුණි. | 30 | 13.4 | 20 | 8.9 | 174 | 77.7 |
| සැසි වල ක්‍රමවේදය පිළිබඳ සමස්ත සංජානනය | 228 | 12.72 | 225 | 12.55 | 1339 | 74.72 |

N = 224 / සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව 224 x 8 = 1792

මුලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

සැසිය ආරම්භයට ප්‍රථම සැසියේ අරමුණු පිළිබඳ දැනුවත්වීම පිළිබ,ව සහභාගීවන්නන්ගේ සංජානනය විමසීම සිදුකරණ ලදී. ඒ අනුව, සහභාගීවූවන්ගෙන් 192 න් එනම් සියයට 85.7 පමණි. සැසිය ආරම්භයට ප්‍රථම එහි අරමුණු පිළිබඳ දැනුවත් කළ බව සඳහන් කර ඇත්තේ මුල් නියැදියෙන් 11 එය සියයට 4.9 ප්‍රකාශ කර ඇත්තේ සැසියේ මූලික අරමුණු පිළිබඳව දැනුවත් කිරීමක් සිදු නොකළ බවයි.

සැසියේදී භාවිත කරණු ලැබූ ඉගැන්වීම් ක්‍රමවේද සැසි අරමුණ හා ගැලපීම පිළිබඳව විමසිම සිදුකරණ ලදී. ඒ අනුව සහභාගීවන්නන්ගෙන් සියයට 80.4 එනම් සහභිගිවන්නන් 180 ප්‍රකාශ කර ඇත්තේ ඉගැන්වීම් ක්‍රමයද සැසි අරමුණ හා ගැලපී ඇති බවයි.

සැසිය සඳහා ඉගෙනුම් ආධාරක භාවිතය පිළිබඳ විමසීමේදී සියයට 75.9 ප්‍රකාශ කර ඇත්තේ, උචිත වූ ඉගෙනුම් ආධාරක සැසි සඳහා භාවිතයට ගෙන ඇති බවයි.

සැසි පවත්වනු ලබන ක්‍රමවේදය තුල ප්‍රායෝගික කි5යාකාරකම් උපයෝගීකර ගැනීම පිළිබඳව විමසීමේදී නියැදියෙන් සියයට 17.9 ක් සැසිවලදී ප්‍රායෝගික ක්‍රියාකාරකම් උපයෝගී කරගෙන නොමැති බවට එකඟතාවය පළ කර ලදි. එමෙන්ම නියැදියෙන් සියයට 65.2 ප්‍රකාශ කර ඇත්තේ සැසි වලදී ප්‍රායෝගික කි5යාකාරකම් භාවිතයට ගෙන ඇත.

නවෝත්පාදක ඉගැන්වීම් ක්‍රම සැසියේ දී භාවිතය පිළිබඳ විමසීම සිදුකරණ ලදී. නවෝත්පාදක ඉගැන්වීම් ක්‍රම භාවිතයට ගෙන නොමැති බව නියැදියෙන් 38 දෙනෙකු එනම් සියයට 17 ප්‍රකාශ කර ඇති අතර, නියැදියෙන් 136 ප්‍රකාශ කර ඇත්තේ සැසියේදී නවෝත්පාදක ඉගැන්විම් ක්‍රම භාවිතයට ගෙන ඇති බවයි. එමෙන්ම නියැදියෙන් 50ක් වේ. මේ පිළිබඳව අදහස් ප්‍රකාශකර නොමැත. එය ප්‍රතිශතයක් ලෙස සියයට 22.3 වේ.

සැසි පැවැත්වීමේදී නවීන තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ විමසීමේදී තාක්ෂණය භාවිතා නොකළ බවට එකඟතාවය පළ කර ඇත්තේ, නියැදියෙන් 32 එනම් සියයට 14.3ක් පමණි. සමස්ත නියැදියෙන් 159 සැසියේදී නවීන තාක්ෂණය භාවිතා කරණ ලද බවට ප්‍රතිචාර දක්වා ඇත. එය සියයට 71 විය.

සැසිවලදී යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වාගැනීම පිළිබඳ නියැදියෙන් සියයට 81.2 එකඟතාවය පළකර ඇත. එමෙන්ම විෂය හා එහි ප්‍රායෝගික ගැටලු විසඳාගැනීම සැසිය තුළින් අවස්ථාව ලැබිම පිළිබඳව සියයට 77.7 එකඟතාවය පළ කර ඇත. සැසිය තුළින් විෂය හා එය ප්‍රායෝගික ගැටලු විසඳාගැනීමට අවස්ථාව නොලැබුණ බව, නියැදියෙන් 30 එනම් සියයට 13.4 ප්‍රකාශ කර ඇත.

සමස්තයක් ලෙස විමසීමේදී සැසිවල ක්‍රමවේදය පිළිබඳව ප්‍රතිචාර 1792 ලබැගත හැකිව ඇත. ඉන් ප්‍රකාශ 8 සඳහාම එකඟතාවය පළකර ඇත්තේ ප්‍රතිචාර 1339 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 74.72කි. සැසි ක්‍රමවේදය පිළිබඳ විමසීමේදී සියලු ප්‍රකාශවලට එකඟතාවය පල නොකරන ලද ප්‍රතිචාර සංඛ්‍යාව 228 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 12.72. මේ අනුව බහුතරයක් සැසියේ ක්‍රමවේදය පිළිබඳව එකඟතාවයන් පළ කර ඇති බව පැහැදිලි වේ.

### 4.1.1 - 4 පුහුණු සැසිවල ඇගයීම පිළිබඳව පාර්ශවකරුවන්ගේ සංජානන

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින් විසින් පවත්වනු ලැබූ සේවාස්ථ සැසිවල ඇගයීම පිළිබඳව විමසීම ප්‍රකාශ 3ක් ඔස්සේ සිදුකරණ ලදී.

4.11 වන වගුව: පවත්වන ලද සැසි ඇගයීම පිළිබඳව ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සංජානනය

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | |
| | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| 1. සේවාස්ථ සැසියෙන් ලබාගත් අත්දැකීම් පුහුණු වැඩසටහන් සංවිධානයේදී වැදගත් වේ. | 29 | 12.9 | 29 | 12.9 | 166 | 74.1 |
| 2. පුහුණු වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ මෙම සැසියෙන් ලැබුණි | 26 | 11.6 | 25 | 11.2 | 173 | 77.2 |
| 3. සේවාස්ථ සැසි අත්දැකීම් කම වෘත්තීය සංවර්ධනයට ඉවහල් විය | 25 | 11.2 | 19 | 8.5 | 180 | 80.4 |
| සේවාස්ථ සැසි ඇගයීම පිළිබඳ සමස්ත සංජානනය | 80 | 11.90 | 73 | 10.8 | 519 | 77.23 |

N = 224 / සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව 224 x 3 = 672
මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

සේවාස්ථ සැසි ඇගයීම පිළිබඳ විමසීමේදී පුහුණු වැඩසටහන් වලින් ලබාගත් අත්දැකීම් පුහුණු වැඩසටහන් සංවිධානය සඳහා ඉවහල් කරගත හැකිවේද යන්න විමසීමේදී එයට එකඟතාවය පළකරන ලද්දේ මුළු නියැදියෙන් 166 එනම් සියයට 74.1 පමණි. සේවාස්ථ පුහුණු අත්දැකීම් පුහුණු වැඩසටහන් සංවිධානය සෘජු පිටිවහලක් නොලැබේය යන්න ප්‍රතිචාර 29 දක්වා තිබුණි. මේ අනුව පුහුණු වැඩසටහන් වලින් ලැබූ දැනුම තම ඉදිරි පුහුණු කටයුතු සංනරධනය කරගැනීම සඳහා ඉවහල් වන බව සමස්ත නියැදියෙන් සියයට 74.1 ප්‍රකාශ කර තිබුණි. එය සමස්ථ. නියැදියෙන් 3/4 ට ආසන්න ප්‍රමාණයකි. පුහුණු වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ ලබාගැනිම පිළිබඳව විමසීමේ දී ද මුලු නියැදියෙන් 173ක් එනම් සියයට 77.2 ප්‍රකාශ කර සිටින්නේ මෙම සේවාස්ථ සැසි වලින් ඉදිරි පුහුණු වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ ලැබුණ බවයි.

සේවාස්ථ සැසි අත්දැකිම් තම වෘත්තීය සංවර්ධනයට ඉවහල් කරගත හැකි ද යන්න විමසීමේදී ඒ සඳහා එකඟතාවය පළකර ඇත්තේ නියැඳියන් 180ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස 80.4කි. නමුත් නියැදියෙන් 25 සැසි වලින් තම වෘත්තීය සංවර්ධනය සඳහා සෘජු පිටුවහලක් නොලැබුණ බව ප්‍රකාශ කරයි.

සැසි ඇගයීම පිළිබඳ සමස්ත වාර්තාව විමසීමේදී ඒ සඳහා මුලු ප්‍රතිචාර 672ක් ලැබී තිබුණි. ඉන් 519 න් එනම් සියයට 77.23 පමණක් ඇගයිම යටතේ ලබාදුන් ප්‍රකාශවලට එකඟතාවය පළකර

ඇත. ඉතිරි ප්‍රතිචාර 80 මගින් පැහැදිලි වන්නේ සැසි මඟින් වෘත්තීය සංවර්ධනයට දායක වීම. ප්‍රමාණවත් නොවන බවයි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 11.90 ක් වේ.

### 4.1.2 ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලද 2015 නව විෂයමාලා සංශෝධන හඳුන්වාදීමේ සේවාස්ථ පුහුණු වැඩසටහන් ආශ්‍රිත ගැටලු, විසඳුම් හා සංවර්ධන උපාය මාර්ග

නියැදිය සඳහා යොදාගනු ලැබූ විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන්ට සැසි පිළිබඳ ඔවුන් මුහුණ දුන් ගැටලු විවෘතව සාකච්ඡා කිරීම සඳහා ප්‍රශ්නාවලියෙන් ඉඩ සලසා තිබුණි. ඒ සඳහා ඔවුන් දක්වන ලද ප්‍රතිචාර මතු දැක්වේ. ඔවුන් විසින් ලිඛිතව ඉදිරිපත් කර ඇති විස්තරාත්මක අදහස් ගුණාත්මකව ඇගයීම තුළින් මතු දැක්වෙන තේමා හා උප තේමා මතු කරගත හැකි විය.

ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත් වූ සේවාස්ථ සැසි පිළිබඳ සහභාගී වූවන් මුහුණ දුන් ගැටලු හා සංවර්ධන උපාය මාර්ග පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර 4 ඔස්සේ ගොනු කිරීමේ අවස්ථාව ප්‍රශ්නවලියෙන් (ප්‍රශ්න 4) සලසා දී තිබිණි.

1. සංවිධානය
2. අන්තර්ගතය
3. ක්‍රමවේදය
4. ඇගයීම

ඔවුන් විසින් ලිඛිතව ඉදිරිපත් කර ඇති විස්තරාත්මක අදහස් ඇසුරින් මතු දැක්වෙන තේමා හා උප තේමා මතු කර ගත හැකි විය

1. සංවිධානය -
   - I. වැඩ සංවිධානය පිළිබඳ ගැටලු හා යෝජනා
   - II. කාලය / දින ගණන පිළිබඳ ගැටලු හා යෝජනා
   - III. සැසි පවත්වන දිනය පිළිබඳ ගැටලු හා යෝජනා
   - IV. සම්පත් පුද්ගලයින් පිළිබඳ ගැටලු හා යෝජනා
   - V. වැඩමුළු පැවත් වූ ස්ථානය පිළිබඳ ගැටලු හා යෝජනා
   - VI. සම්පත් පුද්ගලයින් ආශ්‍රිත පිළිබඳ ගැටලු හා යෝජනා
   - VII. ප්‍රතිපත්තිමය ගැටලු හා යෝජනා
2. අන්තර්ගතය -
   - I. අන්තර්ගතය ක්‍රියාත්මක කිරීමේ ගැටලු හා යෝජනා
   - II. අන්තර්ගතයේ දැනුම් මූලාශ්‍ර පිළිබඳ ගැටලු හා යෝජනා
   - III. විෂය සන්ධාරය පිළිබඳ ගැටලු හා යෝජනා
   - IV. අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ ගැටලු හා යෝජනා
3. ක්‍රමවේදය -
   - I. සම්පත් පුද්ගල ආශ්‍රිත ගැටලු හා යෝජනා
   - II. තාක්ෂණික ගැටලු ආශ්‍රිත ගැටලු හා යෝජනා
   - III. ඉගෙනුම් උපකරණ පිළිබඳ ගැටලු හා යෝජනා

4. ඇගයීම - I. පෞද්ගලික ක්‍රමවේදය ඇගයීම ආශ්‍රිත ගැටලු හා යෝජනා

II. ඇගයීම් ක්‍රමයේ ගැලවීම් ආශ්‍රිත ගැටලු හා යෝජනා

III. ඇගයීම් ක්‍රම ප්‍රමාණවත් නොවීම ආශ්‍රිත ගැටලු හා යෝජනා

IV. පසු විපරම ආශ්‍රිත ගැටලු හා යෝජනා

ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත් වූ සේවාස්ථ පුහුණු සැසි මාලාවට සහභාගී වූ දෙමළ හා සිංහල යන මාධ්‍ය දෙකේම විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන් ප්‍රධාන ක්ෂේත්‍ර 4 ඔස්සේම ප්‍රතිචාර දක්වා තිබිණ. ගැටලු ආශ්‍රිතව ලබා දුන් සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාව ගණනය කිරීමේ දී ගැටලුවලට වැඩි වශයෙන් මුහුණ දුන් ක්ෂේත්‍ර අනු පිළිවෙළින්, 1. සංවිධානය 2. අන්තර්ගතය 3. ක්‍රමවේදය 4. ඇගයීම වශයෙන් හඳුනාගැනීමට හැකි විය.

4.12 වන වගුව: අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන් හඳුනාගත් ගැටලු ක්ෂේත්‍ර හා ලබාදුන් ප්‍රතිචාර

| | ගැටලු ක්ෂේත්‍ර | ප්‍රතිචාර - මාධ්‍ය අනුව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | % | දෙමළ | % | එකතුව | % |
| 01 | සංවිධානය | 118 | 27.1 | 47 | 10.8 | 165 | 37.9 |
| 02 | අන්තර්ගතය | 81 | 18.6 | 45 | 10.3 | 126 | 29.1 |
| 03 | ක්‍රමවේදය | 58 | 13.3 | 23 | 5.2 | 81 | 18.6 |
| 04 | ඇගයීම | 39 | 08.9 | 24 | 5.5 | 63 | 14.4 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2015

වගු අංක 01 අනුව සමස්ත ගැටලු ක්ෂේත්‍ර අනුපිළිවෙළ හා සිංහල මාධ්‍ය ගැටලු ක්ෂේත්‍ර සංඛ්‍යාවේ අනුපිළිවෙළ හි සමාන බවක් දක්නට ලැබුණු අතර දෙමළ මාධ්‍ය ප්‍රතිචාර සංඛ්‍යා වේ අනු පිළිවෙළ වුයේ සංවිධානය, අන්තර්ගතය, ඇගයීම හා ක්‍රමවේදය වශයෙන් ය.

සිංහල 27.1% හා දෙසළ මාධ්‍ය 10.8% ප්‍රතිචාරිකයන් සියලු දෙනාම වැඩිම ගැටලු සංඛ්‍යාවකට මුහුණ දී තිබුණේ සංවිධානය හා සම්බන්ධයෙන් ය.

### 4.1.2 - 1 විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු <u>පුහුණු සැසි සංවිධානය</u> පිළිබඳව ඉදිරිපත් කල ගැටලු, විසඳුම් හා සංවර්ධන උපාය මාර්ග

විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පුහුණු සැසි වලට සහභාගීවීමේ දී සංවිධානය ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් ගැටලු ක්ෂේත්‍ර 7ක් පදනම් ව කරුණු ඉදිරිපත් කර තිබිණි.

1. පුහුණු සැසි සංවිධානය පිළිබඳ ගැටලු
2. කාලය / දින ගණන පිළිබඳ ගැටලු
3. ස්ථානය හා සම්බන්ධ ගැටලු
4. සම්පත් ආශ්‍රිත ගැටලු
5. සැසි පැවැත්විය යුතු අවස්ථා (වර්ෂය තුළ)
6. ප්‍රතිපත්තිමය ගැටලු
7. සම්පත් පුද්ගලයින් පිළිබඳ ගැටලු

4.13 වන වගුව: විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු මුහුණදුන් සංවිධානය ආශ්‍රිත ගැටලු

| | සංවිධානය ආශ්‍රිත සුවිශේෂී ගැටලු ක්ෂේත්‍ර | ප්‍රතිචාර - මාධ්‍යය අනුව | | | |
|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | මුලු ප්‍රතිචාර | ප්‍රතිශතය |
| 01 | පුහුණු සැසි සංවිධානය පිළිබඳ ගැටලු | 35 | 21 | 56 | 33.9 |
| 02 | කාලය / දින ගණන පිළිබඳ ගැටලු | 25 | 02 | 27 | 16.4 |
| 03 | ස්ථානය හා සම්බන්ධ ගැටලු | 15 | 09 | 24 | 14.5 |
| 04 | සම්පත් ආශ්‍රිත ගැටලු | 21 | 02 | 23 | 13.9 |
| 05 | සැසි පැවැත්විය යුතු අවස්ථා (වර්ෂය තුළ) | 05 | 10 | 15 | 9.1 |
| 06 | ප්‍රතිපත්ති සම්බන්ධ ගැටලු | 10 | 01 | 11 | 6.7 |
| 07 | සම්පත් පුද්ගලයින් පිළිබඳ ගැටලු | 07 | 02 | 09 | 5.5 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

සිංහල හා දෙමළ මාධ්‍ය විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන්ට අදාළ සැසි ආශ්‍රිතව මුහුණ දීමට සිදු වු ගැටලු අතරින් වැඩිම ප්‍රතිචාර සංඛ්‍යාවකින් පෙන්වා දුන් ගැටලුව වුයේ පුහුණු සැසි සංවිධානය පිළිබඳවයි. (33.9%) අනු පිළිවෙළින් කාලය / දින ගණන (16.4) පුහුණු සැසි පැවැත් වු ස්ථාන (14.5%) හා සම්පත් ආශ්‍රිත ගැටලු (13.9%) හඳුනාගෙන තිබිණි. ප්‍රතිපත්තිමය ගැටලු (6.7%) සාපෙක්ෂව අවමව පැවති බව ප්‍රතිචාරිකයින් පෙන්වා දුන්හ.

## විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පුහුණු සැසි සංවිධානය ආශ්‍රිත ව ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා

අදාළ ප්‍රතිචාරිකයන් ඔවුන් මුහුණ දෙන ලද ගැටලු සංවර්ධනාත්මක ව විසදා ගැනිම සඳහා විසඳුම් යෝජනා ද කර තිබිණ. සිංහල හා දෙමළ මාධය ප්‍රතිචාරිකයන් ඔවුන් වැඩිපුරම යෝජනා ඉදිරිපත් කර තිබුණේ ද සංවිධානය පිළිබඳව ය (වගු අංක 4.14).

4.14 වන වගුව: සංවිධානය ආශ්‍රිත සංවර්ධන යෝජනා

| | සංවිධානය ආශ්‍රිත සංවර්ධන යෝජනා | ප්‍රතිචාර - මාධ්‍යය අනුව | | | |
|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | මුලු ප්‍රතිචාර | ප්‍රතිශතය |
| 01 | පුහුණු සැසි සංවිධානය පිළිබඳ යෝජනා | 51 | 04 | 55 | 34.3 |
| 02 | කාලය / දින ගණන පිළිබඳ යෝජනා | 35 | 15 | 50 | 31.3 |
| 03 | සම්පත් සැපයීම පිළිබඳ යෝජනා | 17 | 04 | 21 | 13.1 |
| 04 | සම්පත් පුද්ගලයින් තෝරාගැනීම පිළිබඳ යෝජනා | 17 | - | 17 | 10.6 |
| 05 | සැසි පැවැත්විය යුතු අවස්ථා (වර්ෂය තුළ) | 12 | - | 12 | 7.5 |
| 06 | ස්ථානය හා සම්බන්ධ යෝජනා | - | 02 | 02 | 1.3 |
| 07 | ප්‍රතිපත්තිමය යෝජනා | 02 | - | 02 | 1.3 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2015

විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් වැඩි වශයෙන්ම ප්‍රතිචාර ඉදිරිපත් කර විසඳුම් අවශ්‍යතාවක් ඇති බව පෙන්වා දී ඇත්තේ සැසි සංවිධාන ස්වරූපය ක්‍රමයෙන් සංවර්ධනාත්මකව වෙනස් විය යුතු බවය. එය සංවිධානය සම්බන්ධයෙන් ඉදිරි පත් කරන ලද සමස්ථ ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 34.4% ක ප්‍රමාණයකි. ප්‍රමුඛතා අනුපිළිවෙළෙහි දෙවන ස්ථානයට කාලය/දින ගණන පිළිබඳ යෝජනා සඳහා ප්‍රතිචාර ලබා දී තිබූ අතර තෙවන ස්ථානයට ප්‍රතිචාරිකයන් සංවර්ධනය වීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත්තේ සම්පත් පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීමටයි. (13.1%) පිළිවෙළින් සම්පත් පුදගලයින් තෝරාගැනීමේදී සැලකිලිමත් විම පදනම් කරගත් යෝජනා සඳහා ප්‍රතිචාරිකයන් ලබාදුන් ප්‍රතිචාර 10.6% විය. මුලු ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 7.5% ක් සැසි පැවැත්විය යුතු අවස්ථා වෙනස් විය යුතු යැයි පැවසිය. ස්ථානය හා සම්බන්ධ යෝජනා ඉදිරිපත් කළ යුතුයැයි අවධාරණය කළ පුද්ගලයින් ලබාදුන් ප්‍රතිචාර ප්‍රතිශතය 1.9% වූ අතර ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කරන ලද ප්‍රතිචාර ප්‍රතිශතය 1.3% වූ අතර ප්‍රතිචාර අවම සංඛ්‍යාවක් (1.3) ක් දක්වා ඇත්තේ ප්‍රතිපත්තිමය යෝජනා ක්ෂේත්‍රය පිළිබඳවය. මෙහිදී සුවිශේෂී තත්වයක් වූයේ සිංහල මාධ්‍යය විෂය ගුරු උපදේශකවරු ස්ථානය හා සම්බන්ධව යෝජනා ඉදිරිපත් නොකරන ලද අතර දෙමළ මාධ්‍යය විෂය අධ්‍යක්ෂවරු සැසි පවත්වන දිනය ආශ්‍රිතව ද සම්පත් පුද්ගලයින් පිළිබඳව හා ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කර නොතිබීමයි.

සංවිධානය ක්ෂේත්‍රය ඔස්සේ විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන් ඉදිරිපත් කරන ලද ගැටලු හා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද විසඳුම් යෝජනා මෙතැන් සිට සවිස්තරව ඉදිරිපත් කෙරේ.

## 1. පුහුණු සැසි සංවිධානය පිළිබඳ ගැටලු හා යෝජනා

**i.** ගැටලුව

ජාතික අධ්‍යාපන ආයතනයේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (2015) ඉදිරිපත් කල අවස්ථාව වන විට ප්‍රමාණවත් පරිදි ගුරු මාර්ගෝපදේශ ප්‍රතාචාරිකයින්ට සපයා නොතිබුණු බවත් සැසියේදී භාවිතය සඳහා ප්‍රමාණවත් කරම් පෙළපොත්ද ලබා දී නොතිබූ බව සමහර ප්‍රතිචාරිකයන් පෙන්වා දුන්හ.

**යෝජනා**

සැසි ආරම්භ කිරීමට පෙර පෙළපොත් හා ගුරු මාර්ගෝපදේශ සහභාගිවන්නනට ලබාදීම අත්‍යවශ්‍ය වන අතර එය ඉටු කිරීමට අපහසු වන්නේ නම් එම ද්‍රව්‍ය මුද්‍රණයෙන් හා පාසල්වලට නිකුත් කිරීමෙන් පසුව සැසි පැවැත්වීම හෝ ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් සැසියට ලබා ගැනීමෙන් පසුව සැසි පැවැත්වීම ඵලදායී යැයි ප්‍රතිචාරිකයින් යෝජනා කළහ. (34.4%)

**ii.** ගැටලුව

නව ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත් කිරීම් ජාතික අධ්‍යාපන ආයතනය කේන්ද්‍රකොට පමණ සිදු කරනු ලැබූ හෙයින් සහභාගී වූ කණ්ඩායම විශාල වූ අතර සහභාගිවීමේ දී කාලය අපතේ යාමක් ද සිදුවූ බව සමහර විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන් හ.

**යෝජනා**

එම වැඩමුළු පළාත් මට්ටමෙන් පැවැත්වීමේ අවශ්‍යතාව ඔවුන් පෙන්වා දුන් අතර එමඟින් කාලය අපතේ යාම වළකින බැව් පැහැදිලි කළහ. කුඩා කණ්ඩායම් වශයෙන් සහභාගී වීමෙන් සියලු දෙනාට ක්‍රියාකාරීව සම්බන්ධ වීමට අවස්ථාව හිමි වන බවත් එමඟින් ඵලදායීත්වය ඉහළ යා හැකි බවත් සමහරු පෙන්වා දුන් හ.

**iii.** ගැටලුව

නොවැළැක්විය හැකි හේතු නිසා විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන්ට වැඩමුලු සඳහා සහභාගීවීමට නොහැකි වුවහොත් නැවත ඔවුන් වෙනුවෙන් අවස්ථාවක් ලබානොදීම නිසා සමහර ප්‍රතිචාරිකයන්ට ගැටලුවක් වූ බව පෙන්වා දුන්හ.

**යෝජනා**

ජාතික අධ්‍යාපන ආයතනයේදී ඔවුහු පුහුණුවන්නන් වශයෙන් පමණක් නොව පුහුණුකරුවන් වශයෙන් ද දැනුවත් වුහ. අවස්ථාව නොලැබුවන් ස්වකිය භූමිකාව ඉටු කිරීමට යාමේදී ඔවුන්ගේ සාධනීය භාවය ප්‍රමාණවත් නොවී අපහසුතාවට පත් වන බැවින් යළි පුහුණුවීමේ අවස්ථාව සලසන ලෙස යෝජනා කළහ.

**iv.** ගැටලුව

අදාළ සැසියට පෙර අන්තර්ගතය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධයක් ලබා නොදීමෙන් මනා පූර්ව සුදානමකින් හා අවශ්‍යතා පූර්ණත්වයට පත් ව පැමිණීමට අපොහොසත් වූ බව දැන්වුහ.

**යෝජනා**

සමරහ විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශනවරුන් සැසියේ දී සාකච්ඡා කිරීමට අපෙක්ෂා කරන විෂය ක්ෂේත්‍රය පිළිබඳ සුවිශේෂීව පූර්ව දැනුවත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන්හ. එමඟින් අන්තර්ගතය පිළිබඳ අමතර තොරතුරු සපයා ගැනීමටත් අවශ්‍ය මූලාශ්‍ර ගෙන ඒමටත් හැකිවන බව පෙන්වා දී තිබිණ.

**iv.** ගැටලුව

කල් ඇතිව දැනුවත් නොකිරිම නිසා වෙනත් අත්‍යවශ්‍ය රාජකාරිවලට සම්බන්ධවීමට සිදුවීමේ ගැටලුවට මුහුණ දුන් බව පෙන්වා දුන්හ.

**යෝජනා**

සැසියට පෙර ප්‍රමාණවත් කාලයක් ලබාදීමෙන් වෙනත් රාකාරි සඳහා දින වෙන් කිරීම සැලසුම් සහගතව කළ හැකි බවත් එමඟින් ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණු සැසි සඳහා ගැටලුවකින් තොරව සහභාගී විය හැකි බවත් පෙන්වා තිබිණි.

**v.** ගැටලුව

2015 නව සංශෝධන පිළිබඳ මෙතෙක් කර ඇති දැනුවත් කිරීම් ප්‍රමාණවත් නොවන බවත් ප්‍රායෝගික තලයේ දී තවදුරටත් ගැටලු සහගත තැන් පවතින බවත් පැහැදිලි කළහ. නව සංශෝධන වශයෙන් අන්තර්ගත කරන ලද විෂය ක්ෂේත්‍ර පිළිබඳ කාලීන වශයෙන් වැදගත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් නොවූ බව දැක්වීය.

**යෝජනා**

තවදුරටත් දැනුම වර්ධනය කිරීමේ සැසි පැවැත්වීමෙන් ප්‍රායෝගික තලයේ දී ඇතිවන ගැටලු විසදාගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලීමක් කළහ.

## 2. කාලය / දින ගණන ආශ්‍රිත සංවර්ධන යෝජනා

4.15 වන වගුව: කාලය / දින ගණන ආශ්‍රිත සංවර්ධන යෝජනා

| කාලය/දින ගණන ආශ්‍රිත යෝජනා | ප්‍රතිචාර - මාධ්‍යය අනුව | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | එකතුව | ප්‍රතිශතය |
| A. දින ගණන වැඩි කිරීම | 17 | 09 | 26 | 52 |
| B. කාලය ඵලදායී ලෙස කළමනාකරණය | 13 | 05 | 18 | 36 |
| C. වරකට දින 02 බැගින් යොදා ගැනීම | 05 | 01 | 06 | 12 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2015

### A. දින ගණන වැඩි කිරීම

**ගැටලුව**

නව ප්‍රතිසංස්කරණ සඳහා පුහුනු සැසි දින ගණන ප්‍රමාණවත් නොවීය.

**යෝජනා**

ජාතික අධ්‍යාපන ආයතනයේදී විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන් වැඩි පිරිසක් පුහුණු කිරීමේ දින ගණන වැඩි විය යුතු යැයි එම ක්ෂේත්‍රය සඳහා ප්‍රතිචාර දැක්වුවන් 52% ක් ප්‍රකාශ කර තිබිණ. (වගු අංක 4.5 ) සමස්ත සංශෝධන හා සාපේක්ෂව එම කාලය ප්‍රමාණවත් නොවන හෙයින් තවදුරටත් දැනුවත් කිරීමේ සැසි පවත්වන ලෙස ඔවුන් ඉල්ලා සිටිය හ.

### B. කාලය ඵලදායී ලෙස කළමනාකරණය

**ගැටලුව**

පුහුණු සැසි පැවැත්වීමේදී කාලය අපතේ යාමක් සිදු වු බව ප්‍රතිචාරිකයෝ සඳහන් කළහ.

**යෝජනා**

එයට හේතුව කාලය ඵලදායී ලෙස කළමනාකරණය වී නොතිබූ බව ගුරු උපදේශකවරු හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ අදහස විය. මෙම තත්ත්වයට ඔවුන් වැඩි වශයෙන් මුහුණු දුන්නේ පළමු දිනයේ දී බවත් සැසි ආරම්භය හා අවසානය නියමිත වේලාවට සිදු කළ යුතු බවත් ඔවුහු

සඳහන් කළ හ.  එසේම කාලය උපරිම ලෙස කාර්යක්ෂම ව භාවිත කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන ලද්දේ දින ගණන ද සීමාසහිත හෙයින් ය.

### C. වරකට දින 02 බැගින් යොදා ගැනීම

**ගැටලුව**

පුහුණු සැසිය සඳහා වරකට දින 02කට වඩා යොදා ගැනීම ගැටලු සහගත බව පෙන්වා දුන්නේ එක දිගට දින කීපයක් රාජකාරි ස්ථාන වලින් බැහැරව සිටීම ගැටලු සහගත වන හෙයින් ය.

**යෝජනා**

දුර බැහැර ප්‍රදේශ වලින් පැමිණෙන සමහර ප්‍රතිචාරිකයන් පෙන්වා දුන්නේ දින 04ක වැඩමුලුවක් සඳහා ඔවුන් යාමට ඒමට දින 02ක් වශයෙන් දින 06ක් සේවා ස්ථානයෙන් බැහැරවීමට සිදුවන හෙයින් දින 02ක වැඩමුලු පවත්වන ලෙස ඉල්ලා සිටිය හ.

## 3. ස්ථානය හා සම්බන්ධ යෝජනා

**ගැටලුව**

ජාතික අධ්‍යාපන ආයතනය වැනි දුර බැහැර ප්‍රදේශයකට පැමිණ නේවාසිකව නැවතී සිටීමට සිදුවීම ගැටලු සහගත බව දෙමළ මාධ්‍ය ප්‍රතිචාරිකයන් පමණක් පෙන්නා දී තිබිණ.

**යෝජනා**

ජාතික අධ්‍යාපන ආයතනයේ පමණක් වැඩමුලු පැවැත්වීම වෙනුවට සෑම දෙනාටම සහභාගී වීමට පහසු වන පරිදි වෙනත් ප්‍රධාන නගරය කේන්ද්‍ර කරගත් මධ්‍යස්ථානයකද වැඩමුලු පවත්වන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

**ප්‍රතිපත්තිමය යෝජනා**

- සිංහල මාධ්‍යයෙන් පමණක් ප්‍රතිචාර අවම ප්‍රමාණයක් සඳහන් කරමින් ඉදිරිපත් කර තිබු එක් යෝජනාවක් වුයේ නව ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත් කිරීමේ වගකීම්  ජාතික අධ්‍යාපන ආයතනය පමණක් නොව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද භාරගත යුතු බවය.
- අනෙක් යෝජනාව වශයෙන් නව නිර්දේශ අනුව පාසල්වලට සම්පත් ලබාදීමට කටයුතු කරන ලෙස සඳහන් කර තිබිණ.

## 4. සම්පත් ආශ්‍රිත ගැටලු හා යෝජනා

I   සම්පත් සැපයීම

II  සම්පත් පුද්ගලයින්  තෝරා ගැනීම

**I සම්පත් සැපයීම**

4.16 වන වගුව: සම්පත් සැපයීම පිළිබඳ යෝජනා

| සම්පත් සැපයිම පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර | ප්‍රතිචාර - මාධ්‍යය අනුව | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | එකතුව | ප්‍රතිශතය |
| A. ප්‍රායෝගික වැඩ සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීම | 08 | 03 | 11 | 52.4 |
| B. අදාළ ඉගෙනුම් ආධාරක කලට වෙලාවට සැපයීම | 04 | 01 | 06 | 28.6 |
| C. අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබාදීම | 04 | - | 04 | 19.4 |

මූලාශ්‍රය :නියැදි සමීක්ෂණය 2015

**A ප්‍රායෝගික වැඩ සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීම**

**ගැටලුව**

වැඩමුලු සඳහා සමහර අවස්ථාවලදී ප්‍රායෝගික වැඩ සඳහා ප්‍රමාණවත් සම්පත් සපයා නොතිබු බව සමහර විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරු පෙන්වා තිබිණ. එමගින් සෑම දෙනාටම ක්‍රියාකාරීව වැඩමුළුවට සහභාගීවීමට අවස්ථාව නොලුබුණ බව එම ප්‍රතිචාරිකයන් පෙන්වා දුන්හ. ඉගෙනුම් ආධාරක කලට වෙලාවට ලබා නොදීම ගැටලුවක් වු බව දෙවනුවට ප්‍රතිචාර දක්වමින් අවධාරණය කළහ.

**යෝජනා**

ප්‍රායෝගික වැඩ සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීමෙන් ක්‍රියාකාරීව සහභාගීවීමේ අවස්ථාව හිමිවීමෙන් වඩාත් ඵලදායී සේවයක් ලබාගත හැකි බව එම විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු වැඩි දෙනෙක් පෙන්වා දුන් හ. එසේම කලට වේලාවට ඉගෙනුම් ආධාරක සැපයීම ද ඔවුහු අපේක්ෂා කළහ.

**C. අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබාදීම**

**ගැටලුව**

අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා නොදීම ද ගැටලුවක් වු බව සමහර විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශනවරුන් සඳහන් කර තිබිණ.

**යෝජනා**

ඔවුන් සඳහන් කරන ලද්දේ විශේෂයෙන් වැදගත් මුලාශ්‍ර උපුටා ගැනීම් ඇතුළත් අත් පත්‍රිකා හෝ ඡායා පිටපත් ලබාදිම ඉතා වැදගත් බවය. ( 19.4%) කඩිනමින් අමතර තොරතුරු සපයා ගැනිමට නොහැකි ප්‍රතිචාරිකයන් සිටින බවත්, සීමිත කාලයක් තුළ සැසි පවත්වන හෙයින් වැඩි තොරතුරු ප්‍රමාණයක් ඉක්මණින් ග්‍රහණය කර ගැනීමේ අවශ්‍යතාව පැවිත බවත් ලිපි ලේඛණ ලබාදීමෙන් එම අවශ්‍යතා පූර්ණය සඳහා සහාය වන බවත් ඔවුහු පෙන්වා දුන්හ.

### II  සම්පත් පුද්ගලයින්  තෝරා ගැනීම

4.17 වන වගුව: සම්පත් පුද්ගලයින්  තෝරා ගැනීම ආශ්‍රිත යෝජනා

| සම්පත් සැපයිම පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර | ප්‍රතිචාර - මාධ්‍යය අනුව | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | එකතුව | ප්‍රතිශතය |
| A. ප්‍රායෝගික අත්දැකීම් ඇති සම්පත් පුද්ගලයින් සහාය කරගැනීම. | 11 | - | 11 | 64.7 |
| B. ප්‍රශ්න පත්‍ර සකස් කරන්නන් සම්පත් පුද්ගලයින් වශයෙන් ගැනීම. | 03 | - | 03 | 17.6 |
| C. විශ්ව විද්‍යාල ආචාර්යවරු සම්පත් පුද්ගලයින් වශයෙන් ගැනීම. | 02 | - | 02 | 11.8 |
| D. ඉංග්‍රීසි මාධ්‍යයට අයත් සම්පත් පුද්ගලයින් වැඩි කිරීම. | 01 | - | 01 | 5.9 |

මූලාශ්‍රයඃනියැදි සමීක්ෂණය 2015

#### i ගැටලුව

ජාතික අධ්‍යාපන ආයතනයේ පවත්වන ලද පුහුණු සැසි සඳහා යොදාගන්නා ලද සමහර සම්පත් පුද්ගලයන්ගෙන් අපෙක්ෂිත දනුම ප්‍රමාණවත් ව ලබාගත නොහැකිවිම ගැටලුවක් වූ බව සඳහන් කළහ.

**යෝජනා**

- මෙහිදී සම්පත් පුද්ගලයන් තෝරාගැනීමේ යෝජනා අතරින් වැඩිම ප්‍රතිචාර ප්‍රතිශතයක් (64.7%) දෙමින් විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන්නේ සම්පත් පුද්ගලයන් වශයෙන් ප්‍රායෝගික අත්දැකිම් සහිත පුද්ගලයන් යොදා ගැනිම අවශ්‍ය බව ය.  බොහෝ විට ගැටලු ඇතිවන්නේ ප්‍රායෝගික ඉගැන්වීම් අවස්ථාවලදී හෙයින් ප්‍රායොගික අත්දැකිම් සහිත පුද්ගලයන් යොදා ගැනිම අවශ්‍ය බවය.  බොහෝ විට ගැටලු ඇතිවන්නේ ප්‍රායෝගික ඉගැන්විම් අවස්ථාවලදී හෙයින් ප්‍රායෝගික ඇති පුද්ගලයින් සම්බන්ධ කරගැනීම අවශ්‍ය බව පෙන්වා දුන් හ.
- සමහර ප්‍රතිචාරිකයින් (ප්‍රතිචාර 17.6%) දෙවන ස්ථානය සඳහන් කරන ලද්දේ ප්‍රශ්න පත්‍ර සකස් කරන්නන් සම්පත් පුද්ගලයන් වශයෙන් පත් කිරීම යෝග්‍ය බවය.  එම යෝජනාවද ප්‍රායෝගික අංශයෙන් එනම් විභාගය අවසානයේ අරමුණු කර ඉගැන්වීමට සිදුවන හෙයින් එබඳු සම්පත් පුද්ගලයන් සම්බන්ධ කර ගන්නේ නම් යෝග්‍ය බැව් සඳහන් කර තිබිණ.
- සම්පත් පුද්ගලයින් තෝරා ගැනීම පිළිබඳ ලබා දී තිබූ ප්‍රතිචාරවලින් 11.8% කින් පැහැදිලි වුයේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සම්පත් පුද්ගලයන් වශයෙන් යොදා ගැනීම යෝග්‍ය බවය.  ඔවුන් විසින් තවදුරටත් පෙන්වා දුන්නේ විෂය ප්‍රවීණයන්ගේ සහාය නව ප්‍රතිසංස්කරණ පිළිබඳ දනුවත් වීමේ දී අත්‍යවශ්‍ය බවයි.
- අවම ප්‍රතිචාර ප්‍රතිශතයක් (5.9%) මගින් පෙන්වා දී තිබුණේ ඉංග්‍රීසි මාධ්‍යයට අයත් සම්පත් පුද්ගලයින් වැඩි කිරීමේ අවශ්‍යතාවය.

## 5. සැසි පැවැත්විය යුතු අවස්ථා පිළිබඳ ගැටලු හා යෝජනා

4.18 වන වගුව: සැසි පැවැත්විය යුතු අවස්ථා පිළිබඳ යෝජනා

| **(වර්ෂය තුළ) සැසි පැවැත්විය යුතු අවස්ථා පිළිබඳ යෝජනා** | **ප්‍රතිචාර - මාධ්‍යය අනුව** | | | |
|---|---|---|---|---|
| | **සිංහල මාධ්‍යය** | **දෙමළ මාධ්‍යය** | **එකතුව** | **ප්‍රතිශතය** |
| A. වර්ෂය මුලදී සැසි පැවැත්වීම | 04 | 04 | 08 | 33.3 |
| B. නිවාඩු කාලවල සැසි පැවැත්වීම | 04 | 04 | 08 | 33.3 |
| C. සති අන්තයේ සැසි පැවැත්වීම | 02 | 02 | 04 | 16.7 |
| D. සතියේ දිනවල සැසි පැවැත්වීම | 02 | 02 | 04 | 16.7 |

මූලාශ්‍රයඃනියැදි සමීක්ෂණය 2015

**ගැටලුව**

සැසි පැවැත් වු සමහර අවස්ථා (වර්ෂය තුළ) වලදී ගැටලුවලට මුහුණ දුන් බව සමහර විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු සඳහන් කළහ.

**යෝජනා**

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ වැඩමුලු වර්ෂය මුලදී පැවැත්වීම උචිත බැව් ගුරු උපදේශක හා විෂය අධ්‍යක්ෂවරු සඳහන් කළහ. එයින් නව දැනුම පාසල් වර්ෂය ආරම්භයේ සිටම ශිෂ්‍යයින්ට ලබා දිය හැකි බව ඔවුන් පෙන්වා දුන්හ.

- ප්‍රතිචාර 33.3% ක් ලබාදී තිබුනේ පාසල් නිවාඩු කාලවල සැසි පැවැත්වීම වඩාත් සුදුසු බව පෙන්වා දෙමිණි. පාසල් කාලයේ රාජකාරියෙන් පාසලෙන් ඉවත්වීමට සිදුවීමෙන් ශිෂ්‍යයින්ගේ හා විභාග කටයුතු වලට බාධා ඇතිවන හෙයින් එම කාලය පුහුණු සැසි සඳහා යොදා නොගන්නා ලෙස පෙන්වා දී තිබිණි

- සති අන්තයේ සැසි පැවැත්වීම වඩාත් උචිත බව පෙන්වා දෙමින් ප්‍රතිචාර (16.7%) ක් ලබා දී තිබිණ. ඔවුන් අවධාරණය කරන්නේ ද එයින් රාජකාරි කටයුතු බාධාවකින් තොරව ඉටු කල හැකි බවයි. එසේම වරකට දින 2 බැගින් සැසි සඳහා යොදා ගැනිමද යෝග්‍ය බව සමහර ප්‍රතිචාර දැක්වුවන් පෙන්වා දෙන ලදී.

- සතියේ දිනවල සැසි පැවැත්විම සුදුසු බව අවම ප්‍රතිචාර ප්‍රමාණයකින් පෙන්වා දෙන ලද නමුත් එයට හේතු කිසිවක් සඳහන් කර නොතිබිණ

## 4.1.2 - 2 විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පුහුණු සැසි වල අන්තර්ගතය පිළිබඳව ඉදිරිපත් කල ගැටලු, විසඳුම් හා සංවර්ධන උපාය මාර්ග

විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පුහුණු සැසි වලට සහභාගීවීමේ දී පුහුණු සැසි අන්තර්ගතය පිළිබඳ ව ප්‍රධාන වශයෙන් ගැටලු ක්ෂේත්‍ර 4ක් පදනම් ව කරුණු ඉදිරිපත් කර තිබිණි.

4.19 වන වගුව: පුහුණු සැසි අන්තර්ගතය පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර

| පුහුණු සැසි අන්තර්ගතය පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| 1. අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා | 21 | 03 | 24 | 32 |
| 2. අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා | 11 | 10 | 21 | 28 |
| 3. දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා | 11 | 06 | 17 | 22 |
| 4. විෂය සන්ධාරය පිළිබඳ යෝජනා | 10 | 03 | 13 | 17 |

මූලාශ්‍රයඃනියැදි සමීක්ෂණය 2015

පුහුණු සැසිවල දී විෂය අධ්‍යක්ෂවරු සහ ගුරු උපදේශකවරුන්ට ගැටලුවලට මුහුණ දුන් බැව් ප්‍රකාශ කරමින් සමස්ත ප්‍රතිචාර අතරෙන් දෙවැනියට ඉදිරිපත් කරන ලද ක්ෂේත්‍රය වූයේ අදාළ පුහුණු සැසි මාලාව සඳහා භාවිත වූ විෂය අන්තර්ගතයයි. එම තොරතුරු ක්‍රියාත්මක කිරීම (28%) අන්තර්ගතයේ ප්‍රමාණය (28%) දැනුම් මූලාශ්‍ර (22%) හා විෂය සන්ධාරය (17%) යන ක්ෂේත්‍ර 04 යටතේ ඉදිරිපත් කර තිබිණි. අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රය යටතේ සිංහල මාධ්‍යයෙන් වැඩි ම යෝජනා ප්‍රමාණයක් (21) පෙන්වා දී තිබිණ.

දෙමළ මාධ්‍ය ප්‍රතිචාරිකයන් වැඩි ම පිරිසක් (10) එසේ හඳුනා ගන්නා ලද්දේ අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ ව ය. සිංහල හා දෙමළ මාධ්‍ය විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන් යෝජනා වෙනුවෙන් අවම සංඛ්‍යාවක් ප්‍රතිචාර දක්වා තිබුණේ විෂය සන්ධාරය සංවර්ධනය විය යුතු ආකාරය පිළිබඳ ව ය. පුහුණු සැසි අන්තර්ගතය සංවර්ධනය විය යුතු ආකාරය යන ක්ෂේත්‍රය යටතේ ඔවුන් ඉදිරිපත් කරන ලද යෝජනා සුවිශේෂ ව පහත දැක්වේ.

### 1. අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා

4.20 වන වගුව: අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා

| අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a විෂය කරුණු සරල ව ඉදිරිපත් කිරීම | 08 | 01 | 09 | 37.5 |
| b සියලු ම නිපුණතා පදනම් ව අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම | 07 | 02 | 09 | 37.5 |
| c සමස්ත අන්තර්ගතය පැහැදිලි ව ඉදිරිපත් කිරීම. | 06 | - | 06 | 25 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඉදිරිපත් කර තිබූ යෝජනා කරුණු 3ක් එනම් විෂය කරුණු සරල වීම (37.5%), නිපුණතා පාදක වීම (37.5%) හා පැහැදිලි බව යන මතෘකා ඔස්සේ සඳහන් කර තිබිණි. සිංහල මාධ්‍ය ප්‍රතිචාරිකයන් වැඩ පිරිසක් විෂය කරුණුවල සරල වීම අපේක්ෂා කළ අතර නිපුණතා පදනම් ව ක්‍රියාත්මක කිරීම සිංහල මාධ්‍ය ප්‍රතිචාරිකයින් වැඩි දෙනෙකුගේ අපේක්ෂාව වී තිබිණි. අවම ප්‍රතිචාර (06) සිංහල මාධ්‍යයෙන් ලබා දී තිබූ සමස්ත අන්තර්ගතය පැහැදිලි ව ඉදිරිපත් කිරීම යන කරුණු පිළිබඳ දෙමළ මාධ්‍ය ප්‍රතිචාරිකයන් අදහස් දක්වා නොතිබිණි.

**a විෂය කරුණු සරල ව ඉදිරිපත් කිරීම**

**ගැටලුව**

පුහුණු සැසියේ දී කරුණු සරල ව ඉදිරිපත් නොකිරීම ගැටලුවක් වුව ද ප්‍රතිචාරිකයින්ගේ අදහස විය.

**යෝජනාව**

විෂය කරුණු න්‍යායාත්මක හා සංකීර්ණ වූ හෙයින් ඒවා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා උචිත වන පරිදි සරල ව ඉදිරිපත් කිරීම සංවර්ධනාත්මක වෙනසක් උදෙසා වැදගත් බව පෙන්වා දුන්හ. (37.5%)

**b සියලු ම නිපුණතා පදනම් ව අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම**

**ගැටලුව**

පුහුණු සැසියේ දී නව ප්‍රතිසංස්කරණ ඇතුළත් අන්තර්ගතය නිපුණතා පාදක ව ක්‍රියාත්මක නොකිරීම ගැටලුවක් වූ බව ගුරු උපදේශකවරු හා විෂය අධ්‍යක්ෂවරු අවධාරණය කළහ.

**යෝජනාව**

ප්‍රායෝගික ව පන්ති කාමරයේ දී නිපුණතා පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාදාමය ඵලදායී කර ගැනීම උදෙසා සහාය වීමේ දී සැසියෙන් ලැබෙන සජීවී අත්දැකීම් වැදගත් බව ප්‍රතිචාරකයෝ පැහැදිලි කළහ.

**c සමස්ත අන්තර්ගතය පැහැදිලි ව ඉදිරිපත් කිරීම**

ගැටලුව

සැසි මාලාවේ දී සමස්ත අන්තර්ගතය පැහැදිලි ව ඉදිරිපත් කිරීමක් සිදු නොවීම ගැටලුවක් වූ බව පෙන්ව දී තිබිණි. (25%)

යෝජනාව

නව ප්‍රතිසංස්කරණ පමණක් නොව සමස්ත අන්තර්ගතය පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාව පවතින බවත් එවිට නවීකරණාත්මක මෙන්ම දැනුම යාවත්කාලීන කර ගැනීම අවශ්‍ය සහාය ලැබෙන හෙයින් එම සාධනීය වෙනස්කම අත්‍යවශ්‍ය බව යෝජනා කෙරිණි.

## 2. අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා

4.21 වන වගුව: අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා

| අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a නව සංශෝධන පිළිබඳ අන්තර්ගතය වැඩි කිරීම | 04 | 03 | 07 | 33.3 |
| b වැඩි වශයෙන් පැහැදිලි කළ යුතු කොටස් පිළිබඳ වැඩි අවදානයක් දීම | 03 | 02 | 05 | 23.8 |
| c විෂය නිර්දේශයේ සෑම කොටසක් ම ඇතුළත් කිරීම | 02 | 02 | 04 | 19.1 |
| d විෂය අන්තර්ගතය ප්‍රමාණයෙන් අඩු කිරීම. | 02 | 01 | 03 | 14.3 |
| e කාලච්ඡේදයකට ගැළපෙන පරිදි විෂය අන්තර්ගතයේ කොටස් වෙන් කිරීම. | - | 02 | 02 | 9.5 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ ගැටලුවලට මුහුණ දුන් ප්‍රතිචාරියකයන් අංශ 5ක් යටතේ සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කර තිබිණි. ඒවා පහතපිරිදිෙ

**a නව සංශෝධන පිළිබඳ අන්තර්ගතය වැඩි කිරීම**

ගැටලුව

සැසිවල දී ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන් විසින් භාවිත කරන ලද විෂය අන්තර්ගතයෙහි ඇතුළත් වූ 2015 නව විෂය සංශෝධනවලට අයත් අන්තර්ගතය ප්‍රමාණවත් නොවීම ගැටලුවක් වූ බැව් පෙන්වා දී තිබිණි.

යෝජනාව

නව විෂය සංශෝධන පිළිබඳ සැසියේ දී එයට අදාළ පාසල් විෂය මාලාවේ නව කොටස් සියල්ල ඇතුළත් කිරීමේ අවශ්‍යතාව විෂය අධ්‍යක්ෂවරු සහ ගුරු උපදේශකවරු පෙන්වා දෙන ලද්දේ වර්ෂය ආරම්භයේ සිට ම පාසල් සිසුන්ට සංශෝධන ආශ්‍රිත දැනුම සංගතතාවයකින් ලබා දිය හැකි හෙයින් ය.

**b වැඩි වශයෙන් පැහැදිලි කළ යුතු කොටස් පිළිබඳ වැඩි අවදානයක් දීම**

ගැටලුව

නව සංශෝධන පිළිබඳ දැනුවත් කිරීමේ දී වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු එනම් විෂය දැනුම බාහිරින් ලබා ගැනීම අපහසු මෙන් ම ප්‍රායෝගික ව ශිෂ්‍යයා වෙනුවෙන් පන්ති කාමරයේ ක්‍රියාත්මක කිරීම සඳහා අත්දැකීම් ලබා ගැනීමේ අවශ්‍යතාව පවතින කොටස් අවධාරණය ප්‍රමාණවත් නොවූ බව (23.8%) ප්‍රතිචාරිකයන් පෙන්වා දුන් හ. එමගින් සමහර අත්‍යවශ්‍ය කොටස් මග හැරී ගිය බැව් ප්‍රකාශිත විය.

යෝජනාව

C අත්‍යාවශ්‍ය පාඩම් මග නොහැරෙන පරිදි විධිමත් පෙළ ගැසීමකින් නව සංශෝධන ඉදිරපත් කිරීම හා කාලීන වශයෙන් වැදගත් කරුණු සුවිශේෂ ව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන් හ. උදාහරණයක් වශයෙන් ඉතිහාසය හා සාහිත්‍ය මෙන් ම මව් බස ආශ්‍රිත නව විෂය සංශෝධන පිළිබඳ වැඩි දුර කරුණු ඉදිරිපත් කිරීම යෝජනා කෙරිණි.

**c විෂය නිර්දේශයේ සෑම කොටසක් ම ඇතුළත් කිරීම**

**ගැටලුව**

විෂය නිර්දේශයේ සෑම කොටසක් ම ඇතුළත් නොකිරීම ගැටලුවක් වූ බව විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු සඳහන් කළ හ.

යෝජනාව

සමස්තයක් ලෙස විෂය නිර්දේශය ආවරණය වීම අවශ්‍ය බවත් එහි දී නව නිර්දේශය සඳහා වැඩි කාලයක් හා අනෙකුත් කොටස් කෙටි කාලයක් තුළ දී සම්පූර්ණ කිරීම ද ප්‍රමාණවත් වන බැව් ඔවුහු පෙන්වා දුන්හ.

**d විෂය අන්තර්ගතය ප්‍රමාණයෙන් අඩු කිරීම**

ගැටලුව

විෂය අන්තර්ගතය විශාල වීම නිසා කාලය හා සාපේක්ෂ ව අරමුණු ඉටු කර ගැනීමට අපහසු වීම ගැටලුවක් වූ බැව් විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් පෙන්වා දුන්හ.

යෝජනාව

විෂය අන්තර්ගතය අත්‍යාවශ්‍ය නව සංශෝධන කොටස් ඉදිරිපත් කිරීමේ දී මැනවින් කළමනාකරණය කර ගැනීම මගින් 21 වන සියවසේ අවශ්‍යතා ඉටු වන අයුරින් ඉදිරිපත් කිරීම වඩාත් උචිත බැව් විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු යෝජනා කළහ.

**e කාලච්ඡේදයකට ගැළපෙන පරිදි විෂය අන්තර්ගතයේ කොටස් වෙන් කිරීම**

ගැටලුව

පුහුණු සැසිවල දී භාවිත කරන ලද විෂය අන්තර්ගතයේ කොටස් කාලච්ඡේද වශයෙන් වෙන් නොකිරීම ගැටලුවක් වූ බව විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන්හ.

යෝජනාව

විෂය අන්තර්ගතය පැහැදිලි කිරීමේ දී කාලච්ඡේදයකට ගැළපෙන පරිදි සුවිශේෂ ව කුඩා කොටස්වලට වෙන් කර ඉදිරිපත් කිරීමෙන් වඩාත් පැහැදිලි ව අවබෝධ කර ගත හැකි අතර පන්ති කාමර ක්‍රියාකාරිත්වය හා සෘජු ව සමගාමී වන හෙයින් කාර්යක්ෂම ව අරමුණු කරා යොමු විය හැකි බව ප්‍රතිචාරිකයන් පෙන්වා දුන්හ.

## 3. අන්තර්ගත දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා

4.22 වන වගුව: අන්තර්ගත දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා

| අන්තර්ගත දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a මූලාශ්‍ර හා විෂය නිර්දේශ ගැළපීම. | 05 | 01 | 06 | 33.3 |
| b අතිරේක තොරතුරු පොත්පත් ලබා දීම. | 02 | 03 | 05 | 27.8 |
| c සිතියම්වල ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීම. | 02 | 02 | 04 | 22.2 |
| d මූලාශ්‍ර පැහැදිලි ව විද්‍යුත් මාර්ගයෙන් ලබා දීම | 02 | 01 | 03 | 16.7 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

අන්තර්ගත දැනුම් මූලාශ්‍ර ආශ්‍රිත ගැටලුව ඔස්සේ අංශ 4 ඔස්සේ තොරතුරු ලැබී තිබිණි. මූලාශ්‍ර හා විෂය නිර්දේශයේ ගැළපීම (33.3%) අතිරේක පොත් පත් හා තොරතුරු සැසියේ දී ලබා දීම (27.8%) සිතියම්, සඳහා මූලාශ්‍ර ඉදිරිපත් කිරීම (22.2%) හා මූලාශ්‍ර පැහැදිලි ව විද්‍යුත් මාර්ගයෙන් ලබා දීම (16.7%) යන කරුණු ඔස්සේ අනුපිළිවෙළින් ප්‍රතිචාර දක්වා තිබිණි.

**a මූලාශ්‍ර හා විෂය නිර්දේශ ගැළපීම**

**ගැටලුව**

සැසියට ඉදිරිපත් කරන ලද විෂය නිර්දේශ අන්තර්ගතය හා සමහර මූලාශ්‍ර අතර ගැළපීමක් නොමැති වීමේ ගැටලුවට මුහුණු දුන් බව ප්‍රතිචාරකයින් පෙන්වා දුන්හ.

**යෝජනාව**

විෂය නිර්දේශයේ නව සංශෝධන ඇතුළත් අන්තර්ගතය හා අදාළ මූලාශ්‍ර අතර මනා ගැළපීමක් තිබීමෙන් පුහුණු වන්නන්ට ස්වකීය භූමිකාව නිසි අයුරින් ඉටු කිරීමට සහාය වන හෙයින් ඔවුහු එහි අවශ්‍යතාව පෙන්වා දුන්හ

**b අතිරේක තොරතුරු පොත්පත් ලබා දීම**

**ගැටලුව**

සැසියේ දී අතිරේක තොරතුරුවලට අදාළ පොත පත ලබා නොදීම නිසා නිවැරදි ව යථාවබෝධයක් ලබා ගැනීමට නොහැකි වීම ගැටලුවක් වශයෙන් හඳුනා ගෙන තිබිණි.

**යෝජනා**

- නව සංශෝධනවලට අදාළ අතිරේක තොර පොත් පත් සීමිත ප්‍රමාණයක් හෝ සැසියේ දී ලබා දීම මගින් පූර්ණ අවබෝධයක් ලැබෙන බවත්, අවශ්‍ය තොරතුරු උපුටා ගැනීමට හැකි

වීම මගින් ඵලදායී සේවයක් ඉටු කළ හැකි බවත් පෙන්වා දෙමින් මෙම යෝජනාව ඉදිරිපත් කළහ.

- ඒ සඳහා ඔවුන් ඉදිරිපත් කරන ලද තවත් යෝජනාවක් වූයේ මූලාශ්‍ර පැහැදිලි ව විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමයි.

**c සිතියම්වල ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීම**

**ගැටලුව**

පෙළ පොත්වල සඳහන් සිතියම් අඩුපාඩු සහිත හෙයින් ඒවාට අදාළ මූලාශ්‍ර ඉදිරිපත් නොකිරීම ගැටලුවක් වශයෙන් පෙන්වා දුන්හ.

**යෝජනාව**

සිතියම්වල අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අදාළ මූලාශ්‍ර ඉදිරිපත් කිරීම අවශ්‍යතාවක් වශයෙන් යෝජනා කළහ. විශේෂයෙන් ම පැරණි ඉතිහාසය හා සම්බන්ධ සිතියම් සපයා ගැනීම විශේෂයෙන් අපහසු නිසා ඒවා සැපයීම වැදගත් බව දක්වා තිබිණි.

## 4. විෂය සන්ධාරය පිළිබඳ යෝජනා

4.23 වන වගුව: විෂය සන්ධාරය පිළිබඳ යෝජනා

| විෂය සන්ධාරය පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a සන්ධාරය ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන ලෙස ඉදිරිපත් කිරීම. | 06 | 02 | 08 | 61.5 |
| b විෂය නිර්දේශයේ විෂය ඒකකවල අනුපිළිවෙළ අනුව ගලා යන පරිදි ඉදිරිපත් කිරීම. | 02 | 01 | 03 | 23.1 |
| c 8.9 විෂය සන්ධාරය වඩා වැඩි කරුණු ප්‍රමාණයක් 10, 11 විෂය සන්ධාරය වෙනුවෙන් ඉදිරිපත් කිරීම. | 02 | - | 02 | 15.4 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

**ගැටලුව**

විෂය සන්ධාරය පිළිබඳ ගැටලු ක්ෂේත්‍ර 3 ඇසුරෙන් තොරතුරු ඉදිරිපත් කර තිබිණි. එහි ප්‍රධාන ගැටලුව වූයේ නව විෂය සංශෝධන සමස්තයක් වශයෙන් ඉදිරිපත් කිරීම හේතුවෙන් ඇති වූ ගැටලුයි.

a විෂය සන්ධාරය ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන ආකාරයට ඉදිරිපත් නොකිරීම (61.5%).

b විෂය නිර්දේශයේ විෂය ඒකක අනුපිළිවෙළ ගලා නොයාම (23.1%)

c 8,9 ශ්‍රේණිවල විෂය සන්ධාරය වඩා 10, 11 විෂය සන්ධාරය වෙනුවෙන් වැඩිපුර කරුණු, තොරතුරු ඉදිරිපත් නොකිරීම.

**යෝජනා**

- අදාළ විෂය සන්ධාරය ශ්‍රේණි අනුව වෙන් වෙන් ව ඉදිරිපත් කිරීම සමස්තයක් වශයෙන් කරුණු ඉදිරිපත් කරනවාට වඩා යෝග්‍ය බැව් පෙන්වා දී තිබිණි. ඔවුන් එමගින් කරුණු ගිලිහී යාම සිදු නොවන බව ද පෙන්වා දුන්හ.
- ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන විෂය කරුණු සරල බවින් සංකීර්ණත්වය පරිවර්තනය වීමේ අවස්ථා ප්‍රායෝගික පන්ති කාමර අත්දැකීම් හා සම්බන්ධ කළ හැකි පරිදි විෂය සන්ධාරය පෙළ ගැස්වීම උචිත බව යෝජනා කළහ.
- විශේෂයෙන් ම උදාහරණ වශයෙන් 8/9 ශ්‍රේණිවලට වැඩි කරුණු 10/11 ශ්‍රේණි සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව නව සංවර්ධනාත්මක යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ විශේෂයෙන් ම මෙහි දී පුහුණුවන්නන් පසුව ක්ෂේත්‍රයේ දී පුහුණු කරන්නන් වශයෙන් වගකීම භාරගත යුතු හෙයින් ය.

## 4.1.2 - 3 විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පුහුණු සැසි වල ක්‍රමවේදය පිළිබඳව ඉදිරිපත් කල ගැටලු, විසඳුම් හා සංවර්ධන උපාය මාර්ග

ක්‍රමවේදය පිළිබඳ යෝජනා විෂය අධ්‍යක්ෂවරු ගුරු උපදේශකවරු ක්ෂේත්‍ර 3ක් ඔස්සේ පැහැදිලි කර තිබිණි.

4.24 වන වගුව: ක්‍රමවේදය ආශ්‍රිත යෝජනා ක්ෂේත්‍රය

| ක්‍රමවේදය ආශ්‍රිත යෝජනා ක්ෂේත්‍රය | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| 1. සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා | 37 | 03 | 40 | 62.5 |
| 2. තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා | 06 | 07 | 13 | 20.3 |
| 3. ඉගෙනුම් උපකරණ භාවිතය පිළිබඳ යෝජනා | 05 | 06 | 11 | 17.2 |

මුලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන් වැඩිම ප්‍රතිචාර ප්‍රමාණයක් එනම් 62.5 ක් සඳහන් කරමින් සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී. සිංහල මාධ්‍ය ප්‍රතිචාරිකයන් වැඩි ම පිරිසක් ද දෙමළ මාධ්‍ය ප්‍රතිචාරකයින් අවම පිරිසක් ද ප්‍රතිචාර දක්වා තිබුණේ ඉහත සඳහන් යෝජනාව පිළිබඳවයි. ඔවුන් දෙවන ස්ථානයට ප්‍රතිචාර (06) දැක්වූ තාක්ෂණික ගැටලු ආශ්‍රිත යෝජනා පිළිබඳවයි. එම ගැටලුව දෙමළ මාධ්‍ය විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු වැඩි ම ප්‍රතිචාර (07) ලබා දුන් යෝජනා ක්ෂේත්‍රය විය. ක්‍රමවේදය පිළිබඳ සමස්ත යෝජනා අතරින් ඉගෙනුම් උපකරණ භාවිතය පිළිබඳ යෝජනා ඉදිරිපත් කර තිබුණේ අවම වශයෙන් (17.2%)

## 1. සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා

4.25 වන වගුව: සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා

| සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කිරීම | 27 | 01 | 28 | 70 |
| b පෙළ පොතින් නිදර්ශන ගැනීම | 03 | 02 | 05 | 12.5 |
| c ගැටලු නිරාකරණ සාධකවල වැඩිපුර අවස්ථා දීම | 03 | - | 03 | 7.5 |
| d ඉගෙනුම් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම් දීම | 01 | 01 | 02 | 05 |
| e ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම භාවිතය | 02 | - | 02 | 05 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

සම්පත් පුද්ගලයන් පිළිබඳ යෝජනා සැලකීමේ දී වැඩිම ප්‍රතිචාර සංඛ්‍යාවක් එනම් 70%ක් ම ඉදිරිපත් කර තිබුණේ පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කිරීමට යෝජනා කරමින් ය. ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද 2015 නව ප්‍රතිසංස්කරණ යෝජනාවලට අදාළ පුහුණු සැසි සංවිධනාත්මක ව වෙනස් කිරීමේ අභිප්‍රායෙන් වැඩි ම ප්‍රතිචාරිකයින් පිරිසක් විසින් පෙන්වා දුන් යෝජනාව වූයේ පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කිරීම පිළිබඳ යි.

**a පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කිරීම.**

**ගැටලුව**

ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලද පුහුණු සැසිවල දී පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරන ලද්දේ අවම වශයෙන් ය. හඳුනා ගත් ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් නොලැබුණු බව සමහර ප්‍රතිචාරයකයෝ පෙන්වා දුන්හ.

**යෝජනාව**

විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පුහුණුව පුහුණුකරුවන් වශයෙන් ගුරුවරුන්ට සම්ප්‍රේෂණය කිරීමේ වගකීම ද දරන හෙයින් පුහුණු සැසිවල දී පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කරන ලෙස යෝජනා කර තිබිණි. ඒ 70%ක් ප්‍රතිචාර ඒ සඳහා ලබා දෙමින් ය.

**b පෙළ පොතින් නිදර්ශන ගැනීම**

**ගැටලුව**

සැසිය මෙහෙයවීමේ දී පෙළපොතෙන් උදාහරණ ගැනීම අවම වීම ගැටලුවක් වූ බව පෙන්වා දුන්හ.

**යෝජනාව**

නව විෂය දැනුම පෙළපොතේ අන්තර්ගතය හා සමගාමී ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමයේ දී භාවිත කෙරෙන හෙයින් පෙළ පොතේ උදාහරණ ඇසුරෙන් පැහැදිලි කළේ නම් යෝග්‍ය බැව් පෙන්වා දුන්හ.

**c ගැටලු නිරාකරණ සාධකවල වැඩිපුර අවස්ථා දීම.**

**ගැටලුව**

ගැටලු සහගත සංකීර්ණ කොටස් පිළිබඳ වැඩි අවධානයක් නොයෙදීම ගැටලුවක් ලෙසින් විෂය අධ්‍යක්වරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන්හ.

**යෝජනාව**

සංකීර්ණ හා ගැටලු සහගත කොටස් පිළිබඳ විවිධ ප්‍රවීණයන් විවිධ මත ප්‍රකාශ කර ඇති හෙයින් සමාජයේත් පොත්පත්වලත් විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ පෙන්වා දී ඇති කරුණු සැසිවල දී පුළුල් සාකච්ඡාවලට යොමු කර පාසල් තලයට සංගතභාවයකින් ගෙන යාමට ඉඩ සැසිවල දී ලබා දෙන ලෙස යෝජනා කළහ.

**ගැටලුව**

සැසිවල දී ගැටලු නිරාකරණය කර ගත හැකි වන පරිදි සාකච්ඡා අවස්ථා නොලැබිණි.

**යෝජනා**

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන දැනුවත් කිරීම් උදෙසා පුහුණු වන්නන් විශේෂයෙන් ම පැමිණෙන්නේ ඔවුනට ප්‍රායෝගික තලයේ දී මුහුණ දීම සිදු වන ගැටලු රාශියක් සමගින් ය. ඒ නිසා නිරන්තරයෙන් සාකච්ඡා සම්මුති මගින් පුහුණු සැසිවල දී ගැටලු නිරාකරණ අවස්ථා වැඩි කිරීමට යෝජනා කළහ.

**d ඉගෙනුම් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම් දීම**

**ගැටලුව**

ඉගෙනුම් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දීම ප්‍රමාණවත් ව සිදු නොවූ බව ගැටලුවක් වශයෙන් විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන්හ. (5.1%)

යෝජනාව

ඉගෙනුම් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දීම ආදර්ශන පාඩම් ඉදිරිපත් කිරීම මගින් කළ හැකි බව ප්‍රතිචාර දක්වන්නන් පෙන්වා දුන්හ. නව සංශෝධනවලට අදාළ ව උපකරණ පිළිබඳ විස්තර කිරීස ප්‍රමාණවත් නොවන බව අවධාරණය කරන ඔවුහු ඉගෙනුම් උපකරණ සැකසීමේ හා භාවිත කිරීමේ අවස්ථා වැඩි කිරීම ඵලදායි බව පෙන්වා දී තිබිණ.

**e ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම භාවිතය**

**ගැටලුව**

දේශන ක්‍රමවලට වැඩි අවධානයක් ලබා දීම සැසියේ දී සිදු වූ බව පුහුණු වන්නන් විසින පෙන්වා දෙන ලදී. එම තත්වය යටතේ සැසි ඒකාකාරී බවක් ද පෙන්නුම් කළ බැව් දක්වා තිබිණ.

යෝජනාව

සැසියේ දී ශිෂ්‍ය කෙන්ද්‍රීය ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීම මගින් පුහුණු වන්නන්ට සජීවී අත්දැකීම් ලබා ගැනීමට හැකි වන බව පෙන්වා දුන්හ. ආදර්ශ පාඩම් ඉදිරිපත් කිරීම්, අවස්ථාවෝචිත නාට්‍යමය අවස්ථා - ගීත, සංවාද, චිත්‍රපට කොටස් ඇසුරෙන් ඉදිරිපත් කිරීමෙන් පුහුණුවන්නන්ට ද සජීවී ව සහභාගි වීමේ අවස්ථා ලබා දෙන මෙන් ඉල්ලීම් කළහ.

**2. තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා**

4.26 වන වගුව: තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා

| තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a නව තාක්ෂණ උපකරණ භාවිතය | 06 | 04 | 10 | 76.9 |
| b අන්තර්ජාල පහසුකම් ලබා දීම | - | 03 | 03 | 23.1 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා නව තාක්ෂණ උපකරණ භාවිතය (76.9%) හා අන්තර්ජාල පහසුකම් ලබා දීම (23.1%) වශයෙන් ප්‍රතිචාර දක්වා තිබිණ. තාක්ෂණික ගැටලු සඳහා යෝජනා යටතේ සිංහල මාධ්‍ය විෂය අධ්‍යක්ෂවරුන්ට හා ගුරු උපදේශකවරුන්ට ගැටලු සහගත වූයේ නව තාක්ෂණ උපකරණ භාවිතය පමණක් ගැටලුවක් වූ බව ය. දෙමළ මාධ්‍ය ප්‍රතිචාරිකයින් අංශ දෙක යටතේ ම ගැටලු හා යෝජනා පෙන්වා දුන්හ.

**a නව තාක්ෂණ උපකරණ භාවිතය**

**ගැටලුව**

නව තාක්ෂණ උපකරණ භාවිතය සැසියේ දී ප්‍රමාණවත් තරම් සිදු නොවූ බව සමහර ප්‍රතිචාරිකයන් පෙන්වා දෙන ලදී.

**යෝජනාව**

ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත් වූ පුහුණු සැසිවල දී නව තාක්ෂණය භාවිතය සංවර්ධනාත්මක ව සිදු කළ යුතු යැයි වැඩි ම ප්‍රතිචාර සංඛ්‍යාවක් එනම් 76.9% ක් ලබා දී තිබුණි.

**b අන්තර්ජාල පහසුකම් ලබා දීම**

**ගැටලුව**

පුහුණු සැසිවල දී අන්තර්ජාල පහසුකම් ලබා ගනිමින් තොරතුරු ලබා ගැනීම් සිදු කිරීම අවම වශයෙන් කෙරුණු බව සමහර ප්‍රතිචාරිකයන් ගැටලුවක් වශයෙන් ඉදිරිපත් කළහ.

**යෝජනාව**

පුහුණු සැසිවල දී අන්තර්ජාල පහසුකම් මගින් තොරතුරු හුවමාරු කර ගැනීමේ අවස්ථාව ලබා දුන්නේ නම් කාලයෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට හැකි බැව් පෙන්වා දුන්හ.

**ගැටලුව**

නව ඉගෙනුම් උපකරණ ප්‍රමාණවත් පරිදි භාවිත නොවීම ගැටලුවක් වූ බව සඳහන් කර තිබිණ. සිංහල/දෙමළ මාධ්‍ය දෙකට ම අයත් විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු ඒ පිළිබඳ ප්‍රතිචාර දක්වූහ.

**යෝජනාව**

නව ප්‍රතිසංස්කරණ පන්ති කාමරයේ දී හඳුන්වා දීමට අදාළ නව ඉගෙනම්-ඉගැන්වීම් උපකරණ සැසියේ දී භාවිත කිරිමට යොමු වන ලෙස ත්, එහි දී සකස් කරනු ලබන උපකරණ පුහුණුවන්නන්ට ලබා දිය හැකි ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු ඉල්ලීමක් කර තිබිණි.

### 4.1.2 - 4 විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු <u>පුහුණු සැසි ඇගයීම පිළිබඳව</u> ඉදිරිපත් කල ගැටලු, විසඳුම් හා සංවර්ධන උපාය මාර්ග

4.27 වන වගුව: ඇගයීම පිළිබඳ යෝජනා

| ඇගයීම පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| 1. ඇගයීම් ක්‍රමය ප්‍රමාණවත් වීම | 16 | 09 | 25 | 37.9 |
| 2. පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම | 10 | 08 | 18 | 27.2 |
| 3. ඇගයීම් ක්‍රමයේ ගැළපීම | 08 | 04 | 12 | 18.2 |
| 4. පසු විපරම ප්‍රමාණවත් ව සිදු කිරීම | 08 | 03 | 11 | 16.6 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

ඇගයීම් ක්‍රමවේදය පිළිබඳ ක්ෂේත්‍ර 04 ඔස්සේ තොරතුරු ගොනු කිරීමට හැකි විය. වැඩි ම ප්‍රතිචාර ප්‍රමාණයක් සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් ම ලබා දී තිබුණේ ඇගයීම ප්‍රමාණවත් ව සිදු නොකළ බවයි. (37.9%) පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම ප්‍රතිචාර 27.3% ක් වශයෙන් ලබා

දෙමින් දෙවන තැනට පත් වී තිබිණි. (27.3%) ඇගයීම් ක්‍රමයේ ගැළපීම (18.2%) හා අවම ප්‍රතිචාර ප්‍රමාණයක් ලැබී තිබුණේ පසු විපරම ප්‍රමාණවත් නොවීම යටතේ යි.

## 1. ඇගයීම් ක්‍රමය ප්‍රමාණවත් නොවීම

4.28 වන වගුව: ඇගයීම ක්‍රම ප්‍රමාණවත් නොවීම

| ඇගයීම් ක්‍රමයේ ප්‍රමාණවත් බව පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a ඇගයීම් අවස්ථා වැඩි කිරීම | 05 | 05 | 08 | 32 |
| b සියලුම අංශ ආවරණය වන සේ ඇගයීම | 05 | 03 | 08 | 32 |
| c ඇගයීම් ක්‍රමය පැහැදිලි ව ඉදිරිපත් කිරීම | 03 | - | 03 | 12 |
| d අඛණ්ඩ ව ඇගයීම සිදු කිරීම | 03 | 02 | 05 | 20 |
| e නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ඇගයීම | 02 | 01 | 03 | 12 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

### a ඇගයීම් අවස්ථා වැඩි කිරීම

ගැටලුව

ඇගයීම් ක්‍රමය ප්‍රමාණවත් නොවූ ජාතික අධ්‍යාපන ආයතනය පුහුණු සැසිවලට සහභාගි වූ විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු ප්‍රකාශ කර තිබිණ.

යෝජනාව

තවදුරටත් විවිධ අවස්ථාවල ඇගයීම් සිදු කිරීමේ අවශ්‍යතාව වැඩි ම ප්‍රතිචාර සංඛ්‍යාවකින් පෙන්වා දී තිබිණි. (32%)

### b සියලුම අංශ ආවරණය වන සේ ඇගයීම

ගැටලුව

විටින් විට ඇගයීම් සිදු කෙරුණු අතර සමස්ත වැඩසටහන ඇගයීමට ලක් නොවූ බව ප්‍රතිචාරකයින්ගෙන් ප්‍රකාශ විණ.

යෝජනාව

සැසිවල සියලුම අංශ ආවරණය වන ලෙස ඇගයීම් සිදු කිරීම සංවර්ධනාත්මක යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර තිබිණ. (32%) එසේ ම එමගින් ගැටලු සාකච්ඡා නිරාකරණය කිරීමට අවස්ථාව ලබා දීමේ වැදගත්කම ද අවධාරණය කෙරිණි.

### c ඇගයීම් ක්‍රමය පැහැදිලි ව ඉදිරිපත් කිරීම

**ගැටලුව**

ඇගයීම් ක්‍රමය පැහැදිලි ව ඉදිරිපත් නොවූ  බව සමහර ප්‍රතිචාරිකයන් පෙන්වා දුන් ගැටලුවකි.

**යෝජනාව**

ඇගයීමෙන් ඇගයීමට අපේක්ෂිත අංශ නිවැරදි ව පැහැදිලි ව සඳහන් කිරීම මෙන් ම අපේක්ෂිත තොරතුරු අනාවරණය හැකි පරිදි සරල ව ඉදිරිපත් කිරීම යෝග්‍ය බැව් පෙන්වා දුනි. (12%)

### d අඛණ්ඩ ව ඇගයීම සිදු කිරීම

**ගැටලුව**

අඛණ්ඩ ව ඇගයීමක් සිදු නොවීම ගැටලුවක් වූ අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දුන්හ.

**යෝජනාව**

අඛණ්ඩ ව ඇගයීම මගින් සැසියේ සාර්ථක අසාර්ථක බව හඳුනා ගැනීම අරමුණු කර ගන්නා හෙයින් සැසිය පිළිබඳ සෑම අංශයක් ම අඛණ්ඩ ව ඇගයීමට ලක් කරමින් සංවර්ධනාත්මක වෙනස්කම් අඛණ්ඩ ව සිදු කිරීමෙන් සැසිය වඩාත් ඵලදායී කර ගැනීමට යොමු වන ලෙස පුහුණුවන්නන් (12%) ප්‍රකාශ කරන ලදී.

### e නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ඇගයීම

**ගැටලුව**

ඇගයීම සඳහා නව තාක්ෂණ ක්‍රම භාවිත නොවූ බව ගැටලුවක් ලෙස සමහර ප්‍රතිචාරකයින්ගේ අදහස් දක්වා තිබිණි.

**යෝජනාව**

නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ඇගයීම කාර්යක්ෂම වන හෙයින් අනාගතයේ සංවර්ධනාත්මක යෝජනාවක් වශයෙන් එය ඉදිරිපත් කර තිබිණි. එය විවිධත්වයක් ඇති කිරීමට ද හේතු වන බව දක්වා තිබිණි.

## 2. පෞද්ගලිකව ක්‍රමවේදය ඇගයීම

**ගැටලුව**

ඇගයීම සඳහා ප්‍රමාණවත් කාලයක් යොදා ගැනීමේ අවස්ථාව විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු විසින් සඳහන් කරන ලදී. පෞද්ගලිකව ක්‍රමවේදය ඇගයීම සඳහා සිංහල මාධ්‍ය ප්‍රතිචාර 03 ක් හා දෙමළ මාධ්‍යයට අදාළ ප්‍රතිචාර 03 ක් ඒ සඳහා ලැබී තිබිණි.
ඇගයීම් ක්‍රමයේ ගැළපීමයි.

### 3. ඇගයීම් ක්‍රමයේ ගැළපීම

4.2 වන වගුව 9: ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ යෝජනා

| ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ යෝජනා | ප්‍රතිචාර | | | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව | % |
| a ඇගයීම් සඳහා විධිමත් උචිත ක්‍රම යොදා ගැනීම | 04 | 02 | 06 | 50 |
| b ඇගයීම් ක්‍රමය සඳහා අමතර කාලයක් යෙදවීම | 03 | 01 | 04 | 33.3 |
| c ඇගයීම් ක්‍රමය ප්‍රායෝගික වීම | 01 | 01 | 02 | 16.7 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

**ගැටලුව**

ඇගයීම් ක්‍රමය සමහර අවස්ථාවල දී ගැටලු සහගත වූ බව ප්‍රතිචාරිකයන් පෙන්වා දුන්හ.

**යෝජනාව**

ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ අංශ 3 ඔස්සේ එනම් ඇගයීම සඳහා විධිමත් උචිත ක්‍රම යොදා ගැනීම (50%) ඇගයීම් ක්‍රමය සඳහා අමතර කාලයක් යෙදවීම (33.3%) හා ඇගයීම් ක්‍රමය ප්‍රායෝගික වීම (16.7% ක්) වශයෙන් ප්‍රතිචාරය දක්වා තිබිණි. සිංහල හා දෙමළ මාධ්‍ය ප්‍රතිචාරිකයන් දෙකොටස ම වැඩි ම ප්‍රතිචාර ප්‍රමාණයක් ලබා දී තිබුණෙ ඇගයීම සඳහා විධිමත් උචිත ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාව පෙනවා දීම උදෙස් ය.

### 4. පසු විපරම ප්‍රමාණවත් ව සිදු කිරීම

**ගැටලුව**

පසු විපරම ප්‍රමාණවත් ව සිදු නොවූ බව විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු පෙන්වා දී තිබිණි.

**යෝජනාව**

පසු විපරම සඳහා කාර්යක්ෂම ක්‍රමවේද සැකසීමේ අවශ්‍යතාව, පසු විපරම සඳහා ගුරු ශිෂ්‍ය දෙපක්ෂය ම සහභාගි කරවා ගැනීම, වැඩසටහන්වල ඵලදායීතාව පිළිබඳ අඛණ්ඩ ව අදහස් ලබා ගැනීමෙන් පසු විපරම සංවර්ධනය කළ හැකි යෝජනා ඉදිරිපත් කළහ.

## පුහුණු සැසි පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා

4.30 වන වගුව: පුහුණු සැසි පිළිබඳ යෝජනා

| ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණු සැසි පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා | | විෂය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරු ලබා දුන් ප්‍රතිචාර සංඛ්‍යාව ADE + ISA | | මුළු එකතුව |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | |
| A | සැසිය පෙර පෙළපොත් ගුරු මාර්ගෝපදේශ ලබා දීම | 20 | 02 | 22 |
| B | පළාත්/ කලාප මට්ටමින් සැසි පැවැත්වීම | 13 | - | 13 |
| C | සහභාගි නොවූ අයට නැවත සැසි පැවැත්වීම | 06 | - | 06 |
| D | සැසියට පෙර අන්තර්ගතය පිළිබඳ දැනුවත් කිරීම | 05 | - | 05 |
| E | කල් ඇතිව දැනුවත් කිරීම | 03 | 02 | 05 |
| F | තවදුරටත් නව සංශෝධන හඳුන්වා දීම | 04 | - | 04 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

## 4.2 දෙවන පියවර - විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් විසින් ගුරු භවතුන් සඳහා පැවැත්වූ පුහුණු සැසි පිළිබඳ විශ්ලේෂණය

විෂයමාලා නවීකරණ සම්බන්ධයෙන් කලාප මට්ටමින් සිදු කරනු ලැබූ පුහුණු සැසිවල, සංවිධානය, අන්තර්ගතය, ක්‍රමවේදය හා ඇගයීම පිළිබඳ පළාත් මට්ටමේ හා කලාප මට්ටමේ සැසි සංවිධානය කරනු ලබන ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය පිළිබඳ ඇගයීමට ලක් කිරීම හා ඔවුන්ගේ ප්‍රතිචාර හරහා ඉදිරියේ දී කලාප මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සේවාස්ථ සැසි සඳහා මාර්ගෝපදේශ සැපයීම අධ්‍යයනය මෙම කොටසේ ප්‍රධාන අරමුණ වේ. මේ අනුව ප්‍රාදේශීය වශයෙන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ නියැදිය පිළිබඳ ව සංක්ෂිප්ත තොරතුරු මතු දැක්වේ.

4.31 වන වගුවඃපළාත් මට්ටමින් පර්යේෂණය සඳහා යොදා ගනු ලැබූ ගුරු සංඛ්‍යාව

| පළාත | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. මධ්‍යම | 79 | 6.9 |
| 2. නැගෙනහිර පළාත | 84 | 7.4 |
| 3. උතුරු මැද | 59 | 5.2 |
| 4. උතුරු පළාත | 135 | 11.9 |
| 5. වයඹ පළාත | 58 | 5.1 |
| 6. සබරගමුව පළාත | 59 | 5.2 |
| 7. දකුණු පළාත | 67 | 5.9 |
| 8. ඌව පළාත | 47 | 4.1 |
| 9. බස්නාහිර පළාත | 85 | 7.5 |
| එකතුව | 673 | 100 |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය 2015

4.32 වන වගුවඃ අධ්‍යයනය සඳහා යොදාගනු ලැබූ ගුරු භවතුන්ගේ පාසල් නියෝජනය

| පාසල් වර්ගය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. 3 වර්ගය | 4 | 0.4 |
| 2. II වර්ගය | 151 | 13.3 |
| 3. 1 - C වර්ගය | 217 | 19.1 |
| 4. 1 - AB වර්ගය | 240 | 21.1 |
| 5. 1 – AB – S | 61 | 5.4 |

මූලාශ්‍රය - නියැදි සමීක්ෂණය - 2015

4.33 වන වගුව: නියැදිය සඳහා යොදා ගනු ලැබූ ගුරුභවතුන්ගේ ස්ත්‍රී/ පුරුෂ භාවය

| ස්ත්‍රී/පුරුෂ භාවය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. ස්ත්‍රී | 460 | 68.3 |
| 2. පුරුෂ | 213 | 31.6 |
| එකතුව | 673 | 100.0 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.34 වන වගුව:නියැදිය සඳහා යොදා ගනු ලැබූ ගුරු භවතුන් ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යය

| භාෂා මාධ්‍ය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. සිංහල | 396 | 34.8 |
| 2. දෙමළ | 200 | 17.6 |
| 3. ඉංග්‍රීසි | 77 | 6.8 |
| එකතුව | 673 | 100.0 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.35 වන වගුව:නියැදිය සඳහා යොදාගනු ලැබූ ගුරු භවතුන්ගේ ප්‍රධාන හර විෂයන්

| හර විෂය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. සිංහල | 120 | 10.6 |
| 2. ඉංග්‍රීසි | 113 | 9.9 |
| 3. ආගම | 90 | 7.9 |
| 4. ඉතිහාසය | 108 | 9.5 |
| 5. විද්‍යාව | 122 | 10.7 |
| 6. ගණිතය | 120 | 10.6 |
| එකතුව | 673 | 100.0 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.36 වන වගුව: ආගම විෂය ඉගැන්වීම් කරන ගුරු භවතුන්ගේ ව්‍යාප්තිය

| ආගම - විෂයය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. බුද්ධාගම | 58 | 64.4 |
| 2. හින්දු ආගය | 19 | 21.1 |
| 3. ක්‍රිස්තියානි ආගම | 9 | 10.0 |
| 4. මුස්ලිම් (ඉස්ලාම්) | 4 | 4.4 |
| එකතුව | 90 | 100 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.37 වන වගුව: නියැදිය සඳහා යොදා ගත් ගුරුභවතුන් ඉගැන්වීම් කරන ශ්‍රේණි

| ආගම - විෂයය | ප්‍රමාණය |
|---|---|
| 1. 8 ශ්‍රේණිය | 389 |
| 2. 10 ශ්‍රේණිය | 584 |
| | |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.38 වන වගුව: නියැදිය සඳහා යොදා ගත් ගුරුභවතුන්ගේ සේවා පළපුරුද්ද

| සේවා පළපුරුද්ද | ප්‍රමාණය |
|---|---|
| 1. වසර අවු. 5ට වඩා අඩු | 157 |
| 2. වසර 5-10 අතර | 171 |
| 3. වසර 10ට වඩා වැඩි | 345 |
| එකතුව | 673 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

4.39 වන වගුව: නියැදිය සඳහා තෝරාගත් ගුරුභවතුන්ගේ වෘත්තීය සුදුසුකම්

| වෘත්තීය සුදුසුකම් | සංඛ්‍යාව |
|---|---|
| 1. නුපුහුණු ගුරුභවතුන් | 15 |
| 2. පුහුණු ගුරුභවතුන් | |
| 2.1 ජා. ශි. විද්‍යා ඩිප්ලෝමා | 199 |
| 2.2 පුහුණු ගුරු | 184 |
| 3. උපාධි ගුරුභවතුන් | 227 |
| 4. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ගුරුභවතුන් | 193 |
| 5. අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිධාරීන් | 40 |

එක් ගුරු භවතෙකු කාණ්ඩ කිහිපයකට අයත් විය හැක.
මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

### 4.2.1. විෂය අධ්‍යක්ෂවරුන් සහ ගුරු උපදේශකවරුන් කලාප මට්ටමින් පවත්වනු ලැබූ සැසි පිළිබඳව ගුරුභවතුන්ගේ සංජානන විශ්ලේෂණය

මෙම අධ්‍යයනයේ දී විෂය අධ්‍යක්ෂවරුන් සහ ගුරු උපදේශකවරුන් කලාප මට්ටමින් සංවිධානය කරන ලද 2014 වර්ෂයේ විෂයමාලා සංශෝධනවලට අදාළ ව පවත්වන ලද සැසි පිළිබඳ ව එම සැසිවලට සහභාගි වූ ගුරුභවතුන්ගේ සංජානනය ප්‍රධාන තේමා හතරක් යටතේ විමසීම සිදු කරන ලදී. ඒ අනුව, සේවාස්ථ සැසි සංවිධානය, අන්තර්ගතය, ක්‍රමවේදය හා ඇගයීම පිළිබඳ ව ගුරු

භවතුන්ගේ ප්‍රතිචාර වරණ 5ක් යටතේ ලබා ගැනීම සිදුකරන ලදී. එක් එක් තේමාවට අදාළ වන පරිදි ප්‍රකාශ ලබා දුන් අතර, නියැදියේ ප්‍රතිචාරය,

1. තරයේ එකඟවෙමි　　2. එකඟ වෙමි
3. අදහස් ප්‍රකාශ කළ නොහැකි ය　　4. එකඟ නොවෙමි
5. තරයේ එකඟ නොවෙමි

මෙම ප්‍රතිචාර පුළුල් වශයෙන් සලකා අංක 1 හා 2 එකඟවෙමි යනුවෙන් ද අංක 3 අදහසක් ප්‍රකාශ කළ නොහැකි ය වශයෙන් ද අංක 4 හා 5 එකඟ නොවෙමි වශයෙන් ද සලකා ගුරු භවතුන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ඇත

විෂය අධ්‍යක්ෂවරුන් සහ ගුරු උපදේශකවරුන් කලාප මට්ටමින් පවත්වනු ලැබූ සැසි පිළිබඳව ගුරුභවතුන්ගේ සංජානනය පහත සදහන් තේමා ඔස්සේ විශ්ලේෂණය ගොනු කරනු ලැබිණ.

4.2.1-1 පුහුණු සැසිවල සංවිධානය පිළිබඳ ව ගුරුභවතුන්ගේ සංජානනය

4.2.1-2 පුහුණු සැසිවල අන්තර්ගතය පිළිබඳ ව ගුරුභවතුන්ගේ සංජානන

4.2.1-3 පුහුණු සැසිවල ක්‍රමවේදය පිළිබඳ ව ගුරුභවතුන්ගේ සංජානන

4.2.1-4 පුහුණු සැසිවල ඇගයීම පිළිබඳ ව ගුරුභවතුන්ගේ සංජානන

## 4.2.1-1 පුහුණු සැසිවල සංවිධානය පිළිබඳ ව ගුරුභවතුන්ගේ සංජානනය

4.40 වන වගුව: පුහුණු සැසි සංවිධානය

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | | ප්‍රතිචාර එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | අදහසක් ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | | |
| | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | |
| 1. පහසු ස්ථානයක සැසි සංවිධානය කර තිබුණි. | 50 | 7.4 | 14 | 2.1 | 608 | 90.5 | 673 |
| 2. කාල කළමනාකරණය සතුටුදායක විය. | 86 | 12.8 | 42 | 6.2 | 545 | 81.0 | 673 |
| 3. සැසිය සඳහා හොඳ පූර්ව සූදානමක් විය. | 49 | 7.3 | 57 | 8.5 | 567 | 84.2 | 673 |
| 4. සම්බන්ධවීමට පහසු දිනවල සැසි සංවිධානය කර තිබුණි | 99 | 14.7 | 48 | 7.1 | 526 | 78.2 | 673 |
| 5. සැසිය පවත්වන ලද දින ගණන ප්‍රමාණවත් විය | 229 | 34.0 | 98 | 14.6 | 346 | 51.4 | 673 |
| 6. ප්‍රමාණවත් කාලයක් සහිතව පූර්ව දැනුම් දීම් සිදු විය. | 50 | 7.4 | 26 | 3.9 | 597 | 88.7 | 673 |
| එකතුව | 563 | 13.9 | 285 | 7.05 | 3189 | 78.97 | 4038 |

N = 673

මූලාශ්‍රයः නියැදි සමීක්ෂණය 2015

විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් විසින් සංවිධානය කරන ලද පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතුරු සැසි පිළිබඳ පාසල් මට්ටමේ ගුරුභවතුන්ගේ ප්‍රතිචාර විමසීම සිදු කරන ලදී.

පහසු ස්ථානයක සැසි සංවිධානය කිරීම පිළිබඳ විමසීමේ දී ඒ සඳහා එකඟතාව දැක්වූ පිරිස 608 ක් විය. එය සමස්ත ගුරු ප්‍රතිශතයෙන් සියයට 90.5 විය. එමෙන් ම මේ පිළිබඳ පැහැදිලි අදහස් ඉදිරිපත් නොකළ පිරිස 14 විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 2.1 විය. සැසි සංවිධානය කර තිබූ ස්ථානය පිළිබඳ ව එකඟතාවක් නොදැක්වූ පිරිස සුලුතරයක් විය. එය මුළු නියැදියෙන් සියයට 7.4 ක් එනම් 50 විය. 673 ක් වූ මුළු නියැදියෙන් 608 ක් ප්‍රකාශ කර ඇත්තේ ගුරු භවතුන්ට ළඟා වීමට පහසු ස්ථානය සැසි සංවිධානය කළ බවයි.

සැසියේ කාල කළමනාකරණය පිළිබඳ ව විමසීමේ දී කාල කළමනාකරණය සතුටුදායක බව ප්‍රකාශ කර ඇති ප්‍රමාණය 545 ක් විය. එහි ප්‍රතිශත අගය 81.0 කි. කාල කළමනාකරණය පිළිබඳ එකඟතාවක් නොදැක්වූ පිරිස සුළුතරයක් විය. එය 86 ක් විය. එහි ප්‍රතිශත අගය 12.8 ක් විය.

එමෙන් ම, සැසිය සඳහා සංවිධායකයින් තුළ තිබූ පෙර සූදානම පිළිබඳ එකඟතාවක් දැක්වූයේ 567 ක් පමණි. එහි ප්‍රතිශත අගය 84.2 ක් විය. එනමුත්, නියැදියෙන් 49 ක් එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 7.3 ක් පූර්ව සූදානම පිළිබඳ දක්වා තිබුණේ, ප්‍රකාශයට එකඟ නොවෙමි යන්නයි. මේ අනුව බහුතරයක් පිරිසගේ ප්‍රතිචාරය වී ඇත්තේ සම්පත් දායකයන් විසින් පූර්ව සූදානමක් සහිත ව සැසි පවත්වා ඇති බවයි.

ගුරුභවතුන්ට සම්බන්ධ වීමට පහසු දිනවල සැසි සංවිධානය කිරීම පිළිබඳ විමසීමේ දී නියැදියෙන් සියයට 78.2 ක් ප්‍රකාශ කර ඇත්තේ සැසි පහසු දිනවල සංවිධානය කර තිබූ බවයි. නමුත් සියයට 14.7 ක් ප්‍රකාශ කර ඇත්තේ ගුරුභවතුන්ට සම්බන්ධ වීමට පහසු දිනවල සැසි සංවිධානය කර නොතිබූ බවයි.

සැසිය පවත්වන ලද දින ගණන පිළිබඳ ප්‍රතිචාරය වූයේ, සියයට 51.4 දින ගණන පිළිබඳ ව සෑහීමට පත්ව ඇති බවයි. සියයට 14.6 මේ පිළිබඳ ඔවුන් දක්වන අදහස් ප්‍රකාශ නොකළ අතර, 229 එනම් සියයට 34.0 ප්‍රකාශ කර ඇත්තේ දින ගණන ප්‍රමාණවත් නොවන බවයි.

සැසිය සඳහා සම්බන්ධ වීමට ප්‍රමාණවත් කාලයක් සහිත ව දැනුම් දීම සිදු කිරීම සම්බන්ධයෙන් විමසීම සිදු කරන ලදී. මේ සඳහා ලැබුණු ප්‍රතිචාරය වූයේ ප්‍රමාණවත් කාලයක් සම්බන්ධවීමට ලැබුණු බව ප්‍රකාශ කළ ප්‍රතිශතය නියැදියෙන් සියයට 88.7 ක් විය. එය සංඛ්‍යාත්මක ව ගත් විට 597 ක් විය. එනමුත් සහභාගිවූවන් 50 ප්‍රකාශ කර සිටියේ සැසියට සම්බන්ධ වීමට ප්‍රමාණවත් කාලයක් සහිත ව දැනුම් දීම සිදු නොකළ බවයි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 7.4 කි.

අදාළ වැඩසටහන් සංවිධානය යන්න පෙර දක්වන ලද ප්‍රකාශ 6ක් මගින් සහභාගිවන්නන්ගේ ප්‍රතිචාරය ඇගයීමට ලක්කරන ලදී. මේ අනුව නියැදියේ ප්‍රමාණය 673 වන අතර පොදුවේ සියලු

ප්‍රකාශ සඳහා (ප්‍රකාශ 6) නියැදියට ප්‍රතිචාර අවස්ථාවන් 4038 ක් ලබා දීම සිදු කර ඇත. එම ප්‍රතිචාර අවස්ථා සමස්තයක් ලෙස විශ්ලේෂණය කිරීමේ දී සියලු ප්‍රකාශ සඳහා එකඟ වෙමි යනුවෙන් ප්‍රතිචාර දැක්වූ ප්‍රමාණය 3189 වේ. එය ප්‍රතිශතයක් ලෙස මුළු ප්‍රතිචාර සංඛ්‍යාවෙන් සියයට 78.97 විය. අදහස් ප්‍රකාශ නොකළ සංඛ්‍යාව 285 විය. එහි ප්‍රතිශත අගය සියයට 7.05 විය. සුළුතරයක් වූ එකඟ නොවෙමි විකල්පය යටතේ තම ප්‍රතිචාරය දැක් වූ සංඛ්‍යාව 563 ක් විය. එහි ප්‍රතිශත අගය සියයට 13.9 විය. මේ අන්දමට නියැදියේ බහුතරයක ප්‍රකාශ තුළ ඇත්තේ සැසි සංවිධානය පිළිබඳ එකඟතාවයක් දැක්විය හැකි බවයි.

### 4.2.1 - 2 පුහුණු සැසිවල අන්තර්ගතය පිළිබඳව ගුරුභවතුන්ගේ සංජානන

4.41 වන වගුව: විෂය අන්තර්ගතය පිළිඳව ගුරු භවතුන්ගේ ප්‍රතිචාර

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | | ප්‍රතිචාර එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | අදහසක් ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | | |
| | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | |
| 3.2.1 දැනුවත් කිරීම් ලද විෂය සන්ධාරය ප්‍රමාණවත් වේ. | 179 | 26.6 | 66 | 9.8 | 428 | 63.6 | 673 |
| 3.2.2 විෂය අන්තර්ගතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකිවන ලෙස සැසි සංවිධානය කර තිබුණි. | 114 | 16.8 | 82 | 12.2 | 478 | 71.0 | 673 |
| 3.2.3 නව සංශෝධන පිළිබඳ දැනුම විෂය ඉගැන්වීමට ප්‍රමාණවත් ය. | 189 | 28.1 | 88 | 13.1 | 396 | 58.8 | 673 |
| 3.2.4 දැනුවත් කරන ලද විෂය අන්තර්ගතයට අදාළ ව මූලාශ්‍රවලට යොමු කිරීමක් කෙරිණි. | 139 | 20.7 | 101 | 15.0 | 432 | 64.3 | 673 |
| එකතුව | 621 | 23.05 | 337 | 12.51 | 1734 | 64.41 | 2692 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය 2015

අදාළ වැඩසටහන්වල අන්තර්ගතය පිළිබඳ සැසි සඳහා සහභාගි වූ ගුරුභවතුන්ගේ ප්‍රතිචාරය විමසීම සිදු කරන ලදී. සැසිවල දී දැනුවත්කිරීම් ලද විෂය සන්ධාරයේ ප්‍රමාණය පිළිබඳ විමසීම් සිදු කරන ලදී. විෂය සන්ධාරය ප්‍රමාණවත් බව ප්‍රකාශ කර ඇත්තේ නියැදියෙන් 428 ක් පමණි. විෂය සන්ධාරය ප්‍රමාණවත් නොවන බව 179 ක් ප්‍රකාශ කර ඇත.

විෂය අන්තර්ගතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි සැසි සංවිධානය කර තිබුණිද යන්නට එකඟතාව සඳහන් කරන ලද්දේ නියැදියෙන් 478 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 71.0 ක් විය. නමුත් නියැදියෙන් 114 ක් ප්‍රකාශ කර තිබුණේ ප්‍රායෝගික අත්දැකීම් ලබා

ගත හැකි ලෙස සැසිය සංවිධානය කර නොතිබූ බවයි. එය ප්‍රමාණාත්මක ව 114 ක් වන අතර ප්‍රතිශතය ලෙස සියයට 16.8 විය.

එමෙන්ම නව සංශෝධන පිළිබඳ දැනුම විෂය ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ය යන්නට එකඟ වූයේ නියැදියෙන් 396 ක් පමණි. එයට එකඟතාව පළ නොකරන ලද පිරිස 189 විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 28.1 විය.

සැසිවල දී ඉදිරි දැනුවත් කිරීම් සඳහා අවශ්‍ය මූලාශ්‍රවලට යොමු කිරීම පිළිබඳ විමසීම සිදු කරන ලදී. ඒ අනුව ඉදිරි මූලාශ්‍ර කරා යොමු කළ බවට එකඟතාව පළකර ඇත්තේ 432 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 64.3 කි. එමෙන්ම, ඉදිරි මූලාශ්‍ර කරා යොමු කිරීම සිදු කිරීම පිළිබඳ එකඟතාව පළ නොකරන ලද පිරිස 139 ක් විය. එහි ප්‍රතිශත අගය සියයට 20.7 කි. මේ අනුව සහභාගිවන්නන්ගෙන් බහුතරයක් ඉදිරි මූලාශ්‍ර කරා සැසිවල දී නිවැරදි යොමු කිරීමක් සිදු කර ඇති බවට ප්‍රතිචාර දක්වා ඇත.

සහභාගිවන්නන්ගේ ප්‍රතිචාර සමස්තය ලෙස විමසීමේ දී විෂය අන්තර්ගතය සම්බන්ධ ව සමස්ත ප්‍රතිචාරය විමසීම වැදගත් වේ. සැසියේ අන්තර්ගතය පිළිබඳ සහභාගිවන්නන්ගේ ප්‍රතිචාර 2692 ක් ලබා ගත හැකිව ඇත. ඉන් ප්‍රතිචාර 1734 ක් එනම් සියයට 64.41 ක් ලබා දී ඇත්තේ සැසියේ අන්තර්ගතය පිළිබඳ සෑහීමකට පත් විය හැකි බවයි. එමෙන් ම අන්තර්ගතය පිළිබඳ සෘජු අදහසක් ප්‍රකාශයට පත් නොකරන පිරිස 337 ක් විය. එහි ප්‍රතිශත අගය 12.51 කි. නමුත් සුලුතරයක් ප්‍රකාශ කරනු ලබන්නේ, සැසියේ අන්තර්ගතය පිළිබඳ එකඟතාවකට පත්විය නොහැකි බවයි. එය ප්‍රමාණාත්මක ව 621 ක් ප්‍රතිචාර දක්වා ඇත. එහි ප්‍රතිශත අගය සියයට 23.5 කි. මේ අනුව සැසියේ අන්තර්ගතය පිළිබඳ සහභාගිවන්නන්ගේ ප්‍රතිචාර පැහැදිලි වේ.

### 4.2.1 - 3 පුහුණු සැසිවල ක්‍රමවේදය පිළිබඳව ගුරුභවතුන්ගේ සංජානන

4.42 වන වගුව: සැසි පවත්වනු ලැබූ ක්‍රමවේදය පිළිබඳ ගුරු භවතුන්ගේ ප්‍රතිචාර

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | | ප්‍රතිචාර එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | අදහසක් ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | | |
| | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | |
| 3.3.1 සැසියේ අරමුණු පිළිබඳ දැනුවත් කරන ලදී. | 15 | 2.2 | 9 | 1.3 | 649 | 96.4 | 673 |
| 3.3.2 සැසි සඳහා භාවිත ඉගැන්වීම් ක්‍රමවේදය සැසියේ අරමුණු හා ගැළපී තිබුණි. | 56 | 8.3 | 87 | 12.9 | 530 | 78.8 | 673 |
| 3.3.3 උචිත පරිදි ඉගැන්වීම් ආධාරක යොදා ගැණුනි. | 221 | 32.8 | 89 | 13.2 | 363 | 53.9 | 673 |
| 3.3.4 ප්‍රායෝගික ක්‍රියාකාරකම් ප්‍රමාණවත් පරිදි උපයෝගී කරගෙන තිබුණි. | 134 | 19.9 | 104 | 15.5 | 435 | 64.6 | 673 |
| 3.3.5 නවෝත්පාදන ඉගැන්වීම් ක්‍රම භාවිත කෙරුණි. | 186 | 27.6 | 123 | 18.3 | 364 | 54.1 | 673 |
| 3.3.6 නවීන තාක්ෂණය භාවිත විය. | 200 | 29.7 | 102 | 15.2 | 371 | 55.1 | 673 |
| 3.3.7 යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා පවත්වා ගන්නා ලදී. | 44 | 6.5 | 41 | 6.1 | 587 | 87.4 | 673 |
| 3.3.8 සහභාගිවන්නන් මුහුණදෙන ගැටලු විසඳීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලැබුණි. | 122 | 18.1 | 98 | 14.6 | 453 | 67.3 | 673 |
| එකතුව | 978 | 18.16 | 653 | 12.12 | 3752 | 69.68 | 5384 |

මූලාශ්‍රය :- නියැදි පරීක්ෂණය 2015

සැසිය සංවිධානය කරනු ලැබූ ක්‍රමවේදය පිළිබඳ සහභාගි වූ ගුරුභවතුන්ගේ එකඟතාව විමසීම සිදු කරන ලදී. සැසිය ආරම්භයට ප්‍රථම සැසියේ අරමුණ පිළිබඳ නිවැරදි දැනුවත් කිරීම පිළිබඳ එකඟතාව නොදක්වන ලද පිරිස 15 විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 2.2 විය. එමෙන් ම සැසි අරමුණු පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ අදහස් පළ නොකළ කණ්ඩායම 09ක් විය. බහුතරයක් වන 649 ක් දෙන ප්‍රකාශ කර ඇත්තේ, සැසියට පෙර සැසි අරමුණ පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ එකඟතාවයක් දැක්විය හැකි බවයි. එම ප්‍රතිශතය සියයට 96.4 විය. එමෙන් ම සැසි සඳහා භාවිත කරනු ලැබූ ඉගැන්වීම් ක්‍රමවේදය සැසි අරමුණ හා ගැළපීම සම්බන්ධයෙන් සහභාගිවන්නන්ගේ එකඟතාව විමසීම සිදුකරන ලදී. එහි දී එකඟතාව පළ කරන ලද සංඛ්‍යාව 530 කි. එකඟතාව පළ නොකරන ලද සංඛ්‍යාව 56 කි. එය ප්‍රතිශතයක් ලෙස සමස්ත නියැදියෙන් සියයට 8.2 කි. මේ අනුව

බහුතරයක් නියැදියේ මතය වී අත්තේ සැසි සඳහා භාවිත කරනු ලැබූ ඉගැන්වීම් ක්‍රමවේද සැසි අරමුණ හා මනාව ගැළපෙන බවයි.

පුහුණු සැසියේ දී ඉගැන්වීම් ආධාරක භාවිතය පිළිබඳ ගුරුභවතුන්ගේ එකඟතාව විමසීමට ලක්කරන ලදී. නව ඉගැන්වීම් ආධාරක භාවිතට පිළිබඳ නියැදියෙන් සියයට 53.9 ප්‍රතිචාර දක්වා තිබුණි. නියැදියෙන් 221 එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 32.8 ක් ප්‍රකාශ කර ඇත්තේ යෝග්‍ය ඉගැන්වීම් ආධාරක භාවිතය පිළිබඳ එකඟතාවයට පත් නොවන බවයි.

ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ප්‍රමාණවත් භාවය පිළිබඳ විමසීමේ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් ප්‍රමාණවත් බවට ප්‍රතිචාර දක්වා ඇත්තේ නියැදියෙන් සියයට 64.6 කි. නමුත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවන බව නියැදියෙන් සියයට 19.9 ක් ප්‍රකාශ කර ඇත.

නවෝත්පාදන ඉගැන්වීම් භාවිතය පිළිබඳ නියැදියෙන් 364 ක් එනම් සියයට 54.1 ක් එකඟ වූ අතර සුළුතරයක් වන 186 එනම් සියයට 27.6 නවෝත්පාදන ඉගැන්වීම් ක්‍රම සැසිවල දී භාවිත නොවුණු බව ප්‍රකාශ කර ඇත.

සැසියේ දී නවීන තාක්ෂණය භාවිතය පිළිබඳ සියයට 55.1 ක් එකඟතාව පළ කළ අතර සියයට 29.7 නවීන තාක්ෂණ භාවිතය පිළිබඳ එකඟතාවයට පත් වී නොමැති බව පැහැදිලි වේ.

සැසි කාල සීමාව තුළ යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතාවක් පැවැත්වීම පිළිබඳ නියැදියෙන් සියයට 87.4 ක් එකඟතාව පළ කර තිබුණි.

සහභාගිවන්නන් මුහුණදෙන ගැටලු විසඳීමේ දී සැසියේ සම්පත්දායකයින්ගේ ක්‍රියාකාරී භූමිකාව පිළිබඳ විමසීමේ දී සියයට 67.3 ක ප්‍රතිචාරය වී ඇත්තේ ගැටලු විසඳීමේ ක්‍රියාවලිය පිළිබඳ එකඟතාවකට පත් විය හැකි බවයි.

සමස්ත සැසියේ ක්‍රමවේදය පිළිබඳ විමසීමේ දී ප්‍රතිචාර 5384 ලබා ගත හැකි විය. ඉන් ප්‍රතිචාර 3752 ක් එනම් සියයට 69.68 වෙන්ව තිබුණේ සැසියේ ක්‍රමවේදය පිළිබඳ එකඟතාවක් දක්වන බවයි. එමෙන්ම ලැබුණු ප්‍රතිචාර 653 ක් එනම් සියයට 12.12 අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර සුළුතරයක් වන 978 ගෙන් ප්‍රතිචාරය ලැබී තිබුණේ සැසියේ ක්‍රමවේදය පිළිබඳ එකඟතාවයකට පත්විය නොහැකි බවයි. මේ අනුව සැසි සංවිධානය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ බහුතරයක් ගුරු භවතුන්ගේ එකඟතාවක් පවතින බව ගම්‍ය වේ.

### 4.2.1 - 4 පුහුණු සැසිවල ඇගයීම පිළිබඳව ගුරුභවතුන්ගේ සංජානන

4.43 වන වගුව: සේවාස්ථ සැසි ඇගයීම පිළිබඳ ගුරු භවතුන්ගේ ප්‍රතිචාර

| ප්‍රකාශය | ප්‍රතිචාරය | | | | | | ප්‍රතිචාර එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | එකඟ නොවෙමි | | අදහසක් ප්‍රකාශ කළ නොහැක | | එකඟ වෙමි | | |
| | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | ප්‍රමාණය | ප්‍රතිශත | |
| 3.4.1 සැසිවලින් ලබාගත් අත්දැකීම් පන්ති කාමර ඉගැන්වීමට ප්‍රමාණවත් වේ. | 183 | 27.2 | 90 | 13.4 | 400 | 59.4 | 673 |
| 3.4.2 සැසි අත්දැකීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරමකට/ ඇගයීමකට ලක්විය. | 137 | 20.4 | 122 | 18.1 | 414 | 61.5 | 673 |
| 3.4.3 ලැබූ සේවාස්ථ අත්දැකීම් ගුරු වෘත්තිය සංවර්ධනය සඳහා උපයෝගී වේ. | 40 | 6.00 | 49 | 7.3 | 583 | 86.6 | 673 |
| එකතුව | 360 | 17.8 | 261 | 12.92 | 1397 | 69.19 | 2019 |

මූලාශ්‍රය :- නියැදි පරීක්ෂණය 2015

ක්‍රියාත්මක කරන සැසිවල ඇගයීම් ක්‍රමවේදය පිළිබඳ ව විමසීම සිදුකරන ලදී. සැසි අත්දැකීම් පන්තිකාමර ඉගැන්වීම් කටයුතු සඳහා ප්‍රමාණවත් වේ ද යන්න පිළිබඳ නියැදියේ මතය විමසීමේ දී ඒ සඳහා එකඟතාව පළකරන ලද්දේ 400 පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 59.4 ක් වේ. එසේ නමුත් 183 පිරිසක් සැසි අත්දැකීම් ඉගැන්වීම් කටයුතු සඳහා ඍජු ඇගයීමක් ලැබීම පිළීබඳ එකඟතාව පළ නොකරන ලදී. එම පිරිස ප්‍රතිශතයක් ලෙස 27.2 කි.

සැසිවල කටයුතු පසු විපරම් කිරීම පිළිබඳ විමසීමේ දී පසු විපරම් ක්‍රියාවලිය පිළිබඳ සැහීමකට පත් ව ඇත්තේ, නියැදියෙන් 414 එනම් සියයට 61.5 පමණි. නියැදියෙන් සියයට 20.4 පසු විපරම් ක්‍රියාවලිය පිළිබඳ සැහීමට පත් ව නැති බව ප්‍රතිචාර දක්වා ඇත.

එමෙන්ම සමස්ත සැසිය තුළින් ලැබූ අත්දැකීම් තම ගුරු වෘත්තිය සංවර්ධනය සඳහා දායකත්වයක් ලබා ගත හැකි බව ප්‍රකාශ කර ඇති සංඛ්‍යාව 583 වන අතර එය සියයට 86.6 කි. නියැදියෙන් 40 ක් සැසි අත්දැකීම් ගුරු වෘත්තිය සංවර්ධනයට දායක වීම පිළිබඳ එකඟත්වයක් දක්වා නොමැත.

සැසි ඇගයීම පිළිබඳ සමස්ත ඇගයීම විමසීමේ දී ඇගයීම සම්බන්ධයෙන් නියැදියේ සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව 2019 කි. ඉන් ප්‍රතිචාර 1397 ක් ඇගයීම පිළිබඳ එකඟතාවක් ඇති බව සඳහන් කර ඇත. ප්‍රතිචාර 360 ක් එනම් සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාවෙන් සියයට 17.8 ක් දක්වා ඇත්තේ සැසි පිළිබඳ පසු විපරම් හා ඇගයීම, පිළිබඳ එකඟතාවක නොමැති බවයි. ඒ අනුව සේවාස්ථ සැසිවල ඇගයීම් ක්‍රමවේදය පිළිබඳ නියැදියේ ප්‍රතිචාර සුළුතරයක් එකඟතාවක් නොමැති බව පැහැදිලි වේ.

මතු දක්වන ලද්දේ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් විසින් සංවිධානය කරන ලදුව ගුරුභවතුන් සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ සේවාස්ථ සැසි පිළිබඳ ව, සැසි සංවිධානය, අන්තර්ගතය, ක්‍රමවේදය හා ඇගයීම යන ක්ෂේත්‍ර ඔස්සේ නියැදියේ ප්‍රතිචාර පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයකි.

## 4.2.2 සේවාස්ථ සැසි වලදී ගුරු භවතුන් මුහුණ දුන් ගැටලු හා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා

ජාතික අධ්‍යාපන ආයතනයේ දී 2015 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව පුහුණුවන්නන් ලෙස දැනුවත් වූ විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු තම වෘත්තීය භූමිකාවට අයත් ප්‍රදේශයේ ගුරුවරු දැනුවත් කිරීමේ කාර්යයට පුහුණුකරුවන් වශයෙන් සහභාගි වූහ. එහි දී පුහුණුවන්නන් ලෙස ලැබූ දැනුම හා අත්දැකීම් සම්ප්‍රේක්ෂණය කරමින් ගුරු භූමිකාව ශක්තිමත් කිරීම උදෙසා සහාය වීමට වෙන් වෙන් වශයෙන් වැඩමුළු පවත්වා තිබිණ. ඒවාට සහභාගි වූ ගුරුවරුන්ගෙන් ද වැඩමුලු ආශ්‍රිත ගැටලු සංවර්ධනාත්මක විසඳුම් යෝජනා පිළිබඳ ව මෙම පර්යේෂණයේ දී විමසන ලදී. විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරුන්ගෙන් මෙන්ම ගුරුවරුන්ගේ ද දත්ත රැස් කරන ලද්දේ වැඩමුළු සංවිධානය, අන්තර්ගතය, ක්‍රමවේදය හා ඇගයීම යන ක්ෂේත්‍ර ඔස්සේ ය. සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගෙන් දත්ත ලබා ගත් අතර ඔවුන් ලබා දුන් සමස්ත ප්‍රතිචාර වගු අංක 4.44 න් දැක්වේ.

4.44 වන වගුව: ගැටල ක්ෂේත්‍ර පිළිබඳ සමස්ත ගුරු ප්‍රතිචාර

| ගැටලු ක්ෂේත්‍ර | සමස්ත ප්‍රතිචාර | ප්‍රතිශතය |
|---|---|---|
| සංවිධානය පිළිබඳ ගැටලු | 494 | 35.0 |
| ක්‍රමවේදය පිළිබඳ ගැටලු | 364 | 25.8 |
| අන්තර්ගතය පිළිබඳ ගැටලු | 343 | 24.3 |
| ඇගයීම හා සම්බන්ධ ගැටලු | 211 | 14.9 |

මුළු ප්‍රතිචාර සංඛ්‍යාව = 1412
නියැදි පරීක්ෂණය 2015

දැනුවත් කිරීමේ වැඩමුළුවල දී මුහුණ දුන් ගැටලු පිළිබඳ සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරුන් සියලු දෙනා දුන් ප්‍රතිචාර සංඛ්‍යාව ගණනය කිරීමේ දී එහි අනුපිළිවෙළ සංවිධානය, ක්‍රමවේද, අන්තර්ගතය හා ඇගයීම වශයෙන් සකස් විණි.

ප්‍රතිචාර ලබා දුන් ගුරුවරු වැඩිම ප්‍රතිචාර සංඛ්‍යාවක් ලබා දී පැහැදිලි කර තිබුණේ සංවිධානය ආශ්‍රිත ගැටලුවලට මුහුණ දුන් බව ය. එය සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 35%ක් විය. දෙවන ස්ථානයට ප්‍රතිචාර 25.8% ක් වශයෙන් පෙන්වා තිබූ ක්‍රමවේදය ආශ්‍රිත ගැටලු ක්ෂේත්‍රයයි. අනුපිළිවෙළින් අන්තර්ගත ක්ෂේත්‍රය සඳහා ප්‍රතිචාර 24.3% ක් ලෙස හා අවම ප්‍රතිචාර ප්‍රතිශතයක් එනම් 14.9% ක් සඳහන් කරන ලද්දේ ඇගයීම් හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැටලු සහගත වූ බවයි.

4.45 වන වගුව: ගැටලු ක්ෂේත්‍ර පිළිබඳ ගුරු ප්‍රතිචාර - මාධ්‍ය අනුව

| ගැටලු ක්ෂේත්‍ර | ප්‍රතිචාර | | මාධ්‍ය අනුව මුළු ප්‍රතිචාර | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය |
| සංවිධානය පිළිබඳ ගැටලු | 24.5 | 10.5 | 346 | 148 |
| ක්‍රමවේදය පිළිබඳ ගැටලු | 17.4 | 8.4 | 246 | 118 |
| අන්තර්ගතය පිළිබඳ ගැටලු | 16.2 | 8.1 | 229 | 114 |
| ඇගයීම හා සම්බන්ධ ගැටලු | 9.7 | 5.2 | 137 | 74 |

සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව = 1412
නියැදි පරීක්ෂණය 2015

ගැටලු ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රතිචාර අනුපිළිවෙළ සකස් වීමේ දී සිංහල මාධ්‍ය ප්‍රතිචාර ප්‍රතිශත අනුපිළිවෙළ හා සමස්ත ප්‍රතිචාර ප්‍රතිශත අනුපිළිවෙළ සමාන බව පැහැදිලි විය. එසේ ම දෙමළ මාධ්‍ය අනුපිළිවෙළ ද එයම විය. සමස්ත ප්‍රතිචාර ප්‍රතිශතය එනම් සිංහල මාධ්‍ය සමස්ත ප්‍රතිචාරවලින් 24.5% ක් හා දෙමළ මාධ්‍ය සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාවෙන් 10.5% ක් වශයෙන් වැඩි ම ගැටලු ඇතැයි සඳහන් කරන ලද ගැටලු ක්ෂේත්‍රය වූයේ සංවිධානය හා සම්බන්ධ ක්ෂේත්‍රයයි. සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙහි ම ප්‍රතිචාර සංඛ්‍යා හැසිරීම් රටාවේ සමාන බවක් දක්නට ලැබුණු අතර එමගින් පැහැදිලි වූයේ ගැටලු අතර මාධ්‍ය වශයෙන් වෙනසක් නොමැති බවයි. දෙවන ස්ථානයට ගැටලු පිළිබඳ සඳහන් කරන ලද්දේ දෙමළ මාධ්‍ය 8.4 හා සිංහල මාධ්‍ය 17.4% වශයෙන් ක්‍රමවේදය ආශ්‍රිත ගැටලු පැවති බවයි. අනතුරු ව ගැටලු වශයෙන් හඳුනා ගන්නා ලද්දේ අන්තර්ගතය පිළිබඳ ව ය. ඒ දෙමළ මාධ්‍ය 8.1% ක් හා සිංහල මාධ්‍ය 16.2 වශයෙන් ය. එසේ ම ගැටලු අවම ක්ෂේත්‍රයක් වශයෙන් සිංහල මාධ්‍ය (9.7%) හා දෙමළ මාධ්‍ය (5.2%) ගුරුවරු විසින් ප්‍රතිචාර දක්වා තිබුණේ ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍රය පිළිබඳ වයි

## පුහුණු සැසි පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා

2015 නව විෂය නිර්දේශය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි සඳහා සහභාගි වූ ගුරුවරුන්ගෙන් ඉහත සඳහන් ගැටලු සංවර්ධනාත්මක ව විසඳා ගැනීම උදෙසා ඔවුන්ගේ අදහස් හා යෝජනා ද සංවිධානය, ක්‍රමවේදය, අන්තර්ගතය හා ඇගයීම යන ක්ෂේත්‍ර ඔස්සේ එක් රැස් කෙරිණි

4.46 වන වගුව: සංවර්ධනාත්මක යෝජනා පිළිබඳ ගුරු ප්‍රතිචාර

| යෝජනා ක්ෂේත්‍ර | ප්‍රතිචාර | |
|---|---|---|
| | සමස්ත ප්‍රතිචාර | ප්‍රතිශතය |
| 1. සංවිධානය පිළිබඳ යෝජනා | 648 | 47.1 |
| 2. ක්‍රමවේදය පිළිබඳ යෝජනා | 322 | 23.4 |
| 3. අන්තර්ගතය පිළිබඳ යෝජනා | 262 | 19.1 |
| 4. ඇගයීම හා සම්බන්ධ යෝජනා | 143 | 10.4 |

මුළු ප්‍රතිචාර සංඛ්‍යාව = 1375
නියැදි පරීක්ෂණය 2015

සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරු වැඩිම ප්‍රතිචාර ප්‍රතිශතයකින් යෝජනා ඉදිරිපත් කර තිබුණේ සංවිධානය පිළිබඳ ව ය. (47.1%) නව ප්‍රතිසංස්කරණ පිළිබඳ පුහුණුවන්නන් විසින් දෙවනුව ක්‍රමවේද ආශ්‍රිත සංවර්ධනාත්මක යෝජනා (23.4%). අනතුරු ව හඳුනා ගන්නා ලද්දේ වැඩමුළුව සඳහා භාවිත කරන ලද විෂය අන්තර්ගතය සංවර්ධනය විය යුතු ආකාරය පිළිබඳ ව යි. (19.1%) අවම ප්‍රතිචාර සඳහන් කරමින් සංවර්ධනය උදෙසා යෝජනා ඉදිරිපත් කරන ලද්දේ ඇගයීම පිළිබඳ ව ය. (10.4%)

ලැබූ ප්‍රතිචාර අනුව පුහුණු සැසි පැවැත්වීමේ දී සංවර්ධනය විය යුතු අංශ පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමේ දී ද අනුපිළිවෙළින් සංවිධානය. ක්‍රමවේදය, අන්තර්ගතය හා ඇගයීම යන ක්ෂේත්‍ර සඳහා උපරිම සිට අවම වශයෙන් ප්‍රතිචාර දක්වා තිබුණි.

4.48 වන වගුව: සංවර්ධන යෝජනා පිළිබඳ ගුරු ප්‍රතිචාර (යෝජනා ආදී)

| ගැටලු ක්ෂේත්‍ර | මුළු ප්‍රතිචාර | | |
|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව |
| සංවිධානය පිළිබඳ යෝජනා | 432 | 216 | 648 |
| ක්‍රමවේදය පිළිබඳ යෝජනා | 235 | 87 | 322 |
| අන්තර්ගතය පිළිබඳ යෝජනා | 177 | 85 | 262 |
| ඇගයීම හා සම්බන්ධ යෝජනා | 87 | 56 | 143 |

සමස්ත ප්‍රතිචාර: 1375
නියැදි පරීක්ෂණය 2015

සිංහල මාධ්‍ය ගුරුවරු හා දෙමළ මාධ්‍ය ගුරුවරු අතර යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රමාණාත්මක අනුපිළිවෙළ අතර වෙනසක් නොවී ය

### 4.2.2-1 සංවිධානය පිළිබඳ යෝජනා

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන්නට යෙදුණු නව විෂය සංශෝධන පිළිබඳ මෙන්ම ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිළිබඳ ගුරුවරුන්ගෙන් ලබා ගත් තොරතුරු කේතගත කරන ලද ද කාලය හා දින ගණන, වැඩමුළු සංවිධානය, සැසි පැවැත්වූ දිනය, සම්පත් පුද්ගලයින්, ප්‍රතිපත්තිමය යෝජනා, වැඩමුළු පැවැත්වූ ස්ථාන හා සම්පත් පිළිබඳ යෝජනා වශයෙනි.

4.49 වන වගුව: සංවිධාන ක්ෂේත්‍රය පිළිබඳ ගුරු ප්‍රතිචාර

| **සංවිධාන ක්ෂේත්‍ර** | **මුළු ප්‍රතිචාර** | | |
|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව |
| A වැඩමුළු සංවිධානය පිළිබඳ යෝජනා | 120 | 103 | 223 |
| B කාලය හා දින ගණන පිළිබඳ යෝජනා | 124 | 56 | 180 |
| C සැසි පැවැත්වූ දිනය පිළිබඳ යෝජනා | 70 | 26 | 96 |
| D සම්පත් පුද්ගලයින් තෝරා ගැනීම පිළබඳ යෝජනා | 41 | 09 | 50 |
| E ස්ථානය හා සම්බන්ධ යෝජනා | 26 | 19 | 45 |
| F ප්‍රතිපත්තිමය යෝජනා | 27 | - | 27 |
| G සම්පත් පිළිබඳ යෝජනා | 24 | 03 | 27 |

සමස්ත ප්‍රතිචාර සංඛ්‍යාව = 648
නියැදි පරීක්ෂණය 2015

සංවිධාන ක්ෂේත්‍රය හා සම්බන්ධ යෝජනා වෙනුවෙන් සිංහල මාධ්‍ය ගුරුවරු වැඩි ම ප්‍රතිචාර දක්වන ලද්දේ කාලය හා දින ගණන පිළිබඳවයි. ඒ සිංහල මාධ්‍ය 19.1% එකක් වශයෙන් ය. නමුත් දෙමළ මාධ්‍ය ගුරුවරු (8.6%) ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලද්දේ දෙවන ස්ථානයට ය. වැඩමුළු සංවිධානය කිරීමේ දී සංවර්ධනාත්මක ව වෙනස් විය යුතු ආකරය පෙන්වා දීම උදෙසා දෙමළ මාධ්‍ය ගුරුවරු වැඩි පිරිසක් ප්‍රතිචාර ලබා දී තිබිණි. (15.9%) සිංහල මාධ්‍ය ගුරුවරු එම යෝජනා ක්ෂේත්‍රය උදෙසා ප්‍රතිචාර ලබා දී තිබුණේ දෙවැනි ස්ථානයට ය (18.5%). අනතුරුව සැසි පැවැත්වූ දිනය පිළිබඳ සිංහල මාධ්‍ය (10.8%) හා දෙමළ මාධ්‍ය ගුරුවරු (4.0%) තෙවන ස්ථානයට ප්‍රතිචාර දක්වා තිබිණ. ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කරන ලද්දේ සිංහල මාධ්‍ය ගුරුවරු පමණකි (4.2%). ස්ථානය හා සම්බන්ධ යෝජනා 4% ක් වශයෙන් සිංහල මාධ්‍ය ගුරුවරු හා දෙමළ මාධ්‍ය ගුරුවරු 2.9 වශයෙන් ප්‍රතිචාර දැක්වූහ. මාධ්‍ය දෙකේ ම ගුරුවරු අවම වශයෙන් යෝජනා දක්වා තිබුණේ සම්පත් පිළිබඳ ව ය. වැඩමුළු සංවිධානය කිරීමේ දී කාර්යක්ෂම ව උපරිම ප්‍රතිඵල ලබාගත හැකි ආකාරයට වෙනස්කම් සිදු කළ ආකාරය පිළිබඳ ව ගුරුවරු ඉදිරිපත් කළ යෝජනා පහත ආකාරයට ය.

A වැඩමුළු සංවිධානය පිළිබඳ යෝජනා

1. සැසියට පෙර පෙළපොත්/ගුරුමාර්ගෝපදේශ සංග්‍රහ ලබා දීම. 64
2. විෂය අනුව වෙන් ව සැසි සංවිධානය. 56
3. කලාප/කොට්ඨාශ මට්ටමින් සැසි පැවැත්වීම. 30
4. තවදුරටත් දැනුවත් කිරීම. 25
5. කුඩා කණ්ඩායම් වශයෙන් පුහුණු කිරීම. 24
6. කල් ඇතිව දැනුම් දීම. 18
7. වැඩි ගුරු පිරිසක් සහභාගි කරවීම. 06

B වැඩමුළු පැවැත්වූ කාලය/දින ගණන පිළිබඳ යෝජනා

| | | |
|---|---|---|
| 1. | දින ගණන වැඩි කිරීම | 114 |
| 2. | ප්‍රායෝගික පුහුණු දින ගණන වැඩි කිරීම | 29 |
| 3. | කාලය ඵලදායී ලෙස කළමනාකරණය | 17 |
| 4. | දින 3කට එක් සැසියක් සීමා කිරීම | 11 |
| 5. | නියමිත වේලාවට සැසි ඇරඹීම | 08 |

C සැසි පවත්වන දිනය පිළිබඳ යෝජනා

| | | |
|---|---|---|
| 1. | සතියේ දිනවල සැසි පැවැත්වීම | 55 |
| 2. | නිවාඩු කාලවල සැසි පැවැත්වීම | 22 |
| 3. | ගුරුවරුන්ට පහසු දිනවල සැසි පැවැත්වීම | 08 |
| 4. | පාසල් වේලාවෙන් පසු සැසි පැවැත්වීම | 06 |
| 5. | සති අන්තයේ සැසි පැවැත්වීම | 05 |

D සම්පත් පුද්ගලයින් තෝරා ගැනීම පිළිබඳ යෝජනා

| | | |
|---|---|---|
| 1. | ප්‍රායෝගික අත්දැකීම් ඇති ප්‍රවීණ පුද්ගලයින් සහභාගි කරවීම | 26 |
| 2. | විෂය විශේෂඥ සහාය ගැනීම | 19 |
| 3. | සම්පත් පුද්ගලයින් වැඩි කිරීම | 03 |
| 4. | පෙළ පොත් ලේඛක/උපදේශකවරුන් සහාය ගැනීම | 02 |

E *ස්ථානය හා සම්බන්ධ යෝජනා*

| | | |
|---|---|---|
| 1. | ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් සහිත වීම | 32 |
| 2. | ගමනාගමන පහසුකම් සහිත වීම | 13 |

F සම්පත් පිළිබඳ යෝජනා

| | | |
|---|---|---|
| 1. | ප්‍රායෝගික වැඩ සඳහා සම්පත් සැපයීම | 17 |
| 2. | CD සැපයීම | 06 |
| 3. | ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටල ලබා දීම | 05 |

G ප්‍රතිපත්තිමය යෝජනා

| | | |
|---|---|---|
| 1. | පාසල්වලට නව නිර්දේශ අනුව සම්පත් ලබා දීම | 18 |
| 2. | පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ගුරු අත්පොතක් සැකසීම | 05 |
| 3. | විෂය උගන්වන සියලු ගුරුවරු දැනුවත් කිරීම | 04 |

**4.2.2 - 2 අන්තර්ගතය පිළිබඳ යෝජනා**

පුහුණු සැසිවල දී භාවිත වූ විෂය අන්තර්ගතය හා සම්බන්ධ යෝජනා, අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම, දැනුම් මූලාශ්‍ර, විෂය සන්ධාරය, අන්තර්ගතයේ ප්‍රමාණය යන තේමා ඔස්සේ තොරතුරු කේත ගත කරන ලදී.

4.50 වන වගුව : අන්තර්ගතය පිළිබඳ සමස්ත ගුරු ප්‍රතිචාර

| අන්තර්ගතය පිළිබඳ ක්ෂේත්‍ර | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව |
|---|---|---|---|
| A අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා | 82 | 25 | 107 |
| B දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා | 42 | 12 | 54 |
| C අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා | 25 | 27 | 52 |
| D විෂය සන්ධාරය පිළිබඳ යෝජනා | 28 | 21 | 49 |

නියැදි පරීක්ෂණය 2015

සිංහල මාධ්‍ය ගුරුවරු වැඩි ම පිරිසක් පෙන්වා දෙන ලද්දේ අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව පැවති ගැටලු ඉවත් කරමින් වඩාත් ඵලදායී ලෙස ඔවුන්ගේ අපේක්ෂා ඉටු කිරීමට හැකි අයුරින් යළි සකස් වීමේ අවශ්‍යතාව පවතින බවයි. (31.3%) සිංහල මාධ්‍ය ගුරුවරු 16% ක් දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම දෙවන තැනට ද දෙමළ මාධ්‍ය ගුරුවරු විෂය සන්ධාරය පිළිබඳ යෝජනා (10.3%) වැඩි ම සංඛ්‍යාවක් තෝරා තිබිණ. සිංහල මාධ්‍ය ගුරුවරු විෂය සන්ධාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලද්දේ අවම වශයෙන් (10.7%) අන්තර්ගතයේ ප්‍රමාණය ආශ්‍රිත යෝජනා දෙමළ මාධ්‍ය ගුරුවරු 8%ක ප්‍රමාණයක් පෙන්වා දුන්හ. ඒ සඳහා සිංහල මාධ්‍ය ගුරුවරු 10.7% යෝජනා සඳහන් කළහ.

**A අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | විෂය කොටස් සියල්ල පිළිබඳ දැනුවත් කිරීම | 42 |
| 2. | ක්‍රියාකාරකම් ප්‍රමාණවත් ව ඇතුළත් කිරීම | 20 |
| 3. | ගුරු අත්පොත් හා පෙළපොත් අතර සහසම්බන්ධතාවක් පැවතීම | 16 |
| 4. | ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීම | 16 |
| 5. | නව නිපුණතා මට්ටම් හඳුන්වා දීම | 05 |
| 6. | අන්තර්ගතය පිළිබඳ සැසිවල දී දැනුවත් කිරීම | 04 |
| 7. | නව ප්‍රායෝගික සොයා ගැනීම්වලට මගිපෙන්වීම | 04 |

**B දැනුම් මූලාශ්‍ර පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | අවශ්‍ය මූලාශ්‍ර සැසියේ දී ලබා දීම | 15 |
| 2. | සුදුසු නව මූලාශ්‍ර හඳුන්වා දීම | 11 |
| 3. | මූලාශ්‍රවල උදෘත ඇතුළත් අත්පත්‍රිකා ලබා දීම | 11 |

4. මූලාශ්‍රවල නව කරුණු ප්‍රමාණවත් ව ලබා දීම 09
5. සැසියේ දී මූලාශ්‍රවල උද්‍ධෘත ඇතුළත් අත්පොතක් සැකසීම 06

C **විෂය සන්ධාරය පිළිබඳ යෝජනා**

1. විෂය සන්ධාරය ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන පරිදි යොදා ගැනීම 10
2. දනුම සඳහා ඉගෙනුම් ක්‍රම ඇතුළත් කිරීම 09
3. තවදුරටත් විෂය සන්ධාරය පිළිබඳ දනුවත් කිරීම 08
4. සරල වාක්‍ය රටා භාවිතය 07
5. සෑම පැතිකඩක් ම ආවරණය වන සේ සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීම 06
6. සැසිවල දී විෂය සන්ධාරය පැහැදිලි කිරීම සඳහා නව තාක්ෂණය භාවිතය 04
7. විෂය සන්ධාරය පිළිබඳ සැසියට පෙර දන්වීම 04
8. ඉගෙනුම් පල පිළිබඳ ඇතුළත් කිරීම 04

D **අන්තර්ගතයේ ප්‍රමාණය පිළිබඳ යෝජනා**

1. විෂය කරුණු පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන සේ අන්තර්ගතය තෝරා ගැනීම 14
2. අන්තර්ගතයේ ප්‍රමාණය වැඩි කිරීම 11
3. අදාළ අරමුණුවලට අනුව අන්තර්ගතය සැකසීම 08
4. මූලාශ්‍ර පෙළ පොතට ඇතුළත් කිරීම 06
5. පැරණි විෂය මාලාවට වඩා මෙහි ඇති විශේෂත්වය පැහැදිලි කිරීම 04
6. වාරයෙන් වාරයට වෙන් ව පාඩම් ඒකක සැකසීම 03
7. නිපුණතා සඵල වන සේ විෂය මාලා අන්තර්ගතය සැකසීම 03

### 4.2.2 - 3 ක්‍රමවේදය පිළිබඳ යෝජනා

ඒ ඒ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දී විවිධ ප්‍රාදේශීය සම්පත් පුද්ගලයින් යොදා ගනිමින් නව ප්‍රතිසංස්කරණ පිළිබඳ දනුවත් කිරීම් සිදු කරන ලදී. එහි දී භාවිත කළ ක්‍රමවේදය හා සම්බන්ධ ගැටලු ආශ්‍රිත යෝජනා පහත සඳහන් මාතෘකා ඔස්සේ කේතගත කිරීමට හැකි විය.

4.51 වන වගුව: ක්‍රමවේදය පිළිබඳ ගුරු ප්‍රතිචාර

| ක්‍රමවේදය පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව |
|---|---|---|---|
| A සම්පත් පුද්ගල ආශ්‍රිත යෝජනා | 150 | 38 | 188 |
| B තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා | 65 | 25 | 90 |
| C ඉගෙනුම් උපකරණ පිළිබඳ යෝජනා | 20 | 24 | 44 |

මුළු ප්‍රතිචාර සංඛ්‍යාව = 322
නියැදි පරීක්ෂණය 2015

ක්‍රමවේදය ආශ්‍රිත යෝජනා කේත ගත කිරීමේ දී වැඩි ම ප්‍රතිචාර සංඛ්‍යාවක් එනම් සිංහල මාධ්‍ය 46.7% ක් හා දෙමළ මාධ්‍ය 11.8% ක් හිමි වූයේ සම්පත් පුද්ගල ආශ්‍රිත යෝජනා පිළිබඳ ව යි. දැනුම යාවත්කාලීන කිරීමේ දී විශේෂ කාර්ය භාරයක් හිමි වන්නේ ඒවා පවරා දෙනු ලබන සම්පත් පුද්ගලයන් වෙත ය. එසේ ම පුහුණු වන්නන් විසින් අවධාරණය කරනු ලැබුවේ ක්‍රියාකාරකම් පදනම් වූ පුහුණු සැසි පවත්වා ගැනීමේ අවශ්‍යතාව යි.

දෙවනුව සිංහල මාධ්‍ය (20.2%) මෙන්ම දෙමළ මාධ්‍ය ගුරුවරු ඔවුන් මුහුණ දුන් අත්දැකීම් පාදක කොට ගෙන තාක්ෂණය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී. තාක්ෂණය මෙන් ම ඉගෙනුම් උපකරණ ද පුහුණු සැසියක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය ඵලදායී වීමට බලපායි. අවම ප්‍රතිශත 6 සංඛ්‍යාවකින් එනම් සිංහල මාධ්‍ය 6.2% හා දෙමළ මාධ්‍ය 7.4% ක් වශයෙන් ඉගෙනුම් උපකරණ පිළිබඳ යෝජනා ඉදිරිපත් කර තිබිණි. ඒ ඒ තේමා යටතේ ඔවුන් සංවර්ධනය උදෙසා පහත සඳහන් පරිදි යෝජනා ඉදිරිපත් කරන ලදී.

**A සම්පත් පුද්ගලයින් පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | පන්ති කාමර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි කිරීම | 81 |
| 2. | නව ක්‍රමවේද භාවිතය | 58 |
| 3. | මනා පූර්ව සූදානම | 15 |
| 4. | ආදර්ශන පාඩම් ඉදිරිපත් කිරීම | 14 |
| 5. | ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම යොදා ගැනීම | 09 |
| 6. | පෙළ පොතේ පාඩම් මාතෘකා අනුව ඉදිරිපත් කිරීම | 04 |
| 7. | සරල ව පැහැදිලි ව සාකච්ඡා කිරීම | 04 |
| 8. | පුහුණුවන්නන්ට සහභාගි වීමේ අවස්ථා වැඩි කිරීම | 03 |

**B තාක්ෂණික ගැටලු පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | නව තාක්ෂණ භාවිතය | 48 |
| 2. | බහු මාධ්‍ය භාවිතය | 18 |
| 3. | තාක්ෂණ ආශ්‍රිත නව ඉගෙනුම් ඉගැන්වීම් භාවිතය | 10 |
| 4. | තාක්ෂණික විෂය තේමා පුළුල් ව සාකච්ඡා කිරීම | 07 |
| 5. | භාවිත උපාංග යාවත්කාලීන කිරීම | 04 |
| 6. | පුහුණුවන්නන්ට ද තාක්ෂණ පහසුකම් ලබා දීම | 03 |

**C ඉගෙනුම් උපකරණ භාවිතය පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | තාක්ෂණ භාවිතය විෂයානුබද්ධ වීම | 21 |
| 2. | නව ඉගෙනුම් උපකරණ භාවිතය | 17 |
| 3. | උපකරණ නිර්මාණය පිළිබඳ දැනුවත් කිරීම | 04 |
| 4. | පොත් පත්, සංයුක්ත තැටි භාවිතය | 02 |

### 4.2.2 - 4 ඇගයීම පිළිබඳ යෝජනා

ඇගයීම පිළිබඳ ව ලබාගත් තොරතුරු පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම, ඇගයීම් ක්‍රමයේ ගැළපීම, ඇගයීම් ක්‍රම ප්‍රමාණවත් නොවීම හා පසු විපරම යන තේමා ඔස්සේ කේත ගත කරන ලදී. ඒ සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරු විසින් පෙන්වා දුන් ප්‍රතිචාර පහත සඳහන් වේ.

4.52 වන වගුව: ඇගයීම පිළිබඳ ගුරු ප්‍රතිචාර

| ඇගයීම පිළිබඳ යෝජනා ක්ෂේත්‍ර | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | එකතුව |
|---|---|---|---|
| A පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම | 30 | 15 | 45 |
| B ඇගයීම් ක්‍රමයේ ගැළපීම | 25 | 14 | 39 |
| C ඇගවීම් ක්‍රමයේ ප්‍රමාණවත් බව | 15 | 20 | 35 |

මුළු ප්‍රතිචාර සංඛ්‍යාව = 143
නියැදි පරීක්ෂණය 2015

වැඩිම ප්‍රතිචාර සංඛ්‍යාවකින් යෝජනා ඉදිරිපත් කරන ලද්දේ සිංහල මාධ්‍ය 21.0% ක් වශයෙන් ය. දෙමළ මාධ්‍ය ගුරුවරු විසින් වැඩිම ප්‍රතිචාර සංඛ්‍යාවකින් යෝජනා ඉදිරි කරන ලද්දේ ඇගයීම් ක්‍රමය ප්‍රමාණවත් නොවීම පිළිබඳ ව ය. දෙවනුව ප්‍රතිචාර දක්වා (17.5%) ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අතර දෙමළ මාධ්‍ය ගුරුවරු පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම ආශ්‍රිත 10.4% ක් ප්‍රතිචාර දක්වා තිබිණ. සැසියේ දී භාවිත ඇගයීම් ක්‍රමය ප්‍රමාණවත් නොවූ බව සිංහල මාධ්‍ය ගුරුවරු 10.5% ක් ප්‍රතිචාර දක්වා සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කළහ. ඒ අනුව අවම ප්‍රතිචාර සංඛ්‍යාවකින් එනම් 4.9% කින් පෙන්වා දී තිබුණේ පසු විපරමක් ප්‍රමාණවත් ව නොවූ හෙයින් සංවර්ධනාත්මක ව පසු විපරමක් සිදු කිරීම උදෙසා ධනාත්මක යෝජනා

**A පෞද්ගලික ව ක්‍රමවේදය ඇගයීම**

| | | |
|---|---|---|
| 1. | ඇගයීම් විධිමත් හා ක්‍රමවත් ව සිදු කිරීම | 11 |
| 2. | නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතය | 10 |
| 3. | ප්‍රශ්නාවලී මගින් ඇගයීම සිදු කිරීම | 08 |
| 4. | ප්‍රායෝගික ඉගැන්වීමේ ප්‍රමුඛතා හා දුර්වලතා බැලීම | 07 |
| 5. | ඇගයීමේ නව ක්‍රමවේද හඳුන්වා දීම | 05 |
| 6. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇගයීම ලක් කළ යුතු ය | 04 |

**B ඇගයීම් ක්‍රමයේ ගැළපීම පිළිබඳ යෝජනා**

| | | |
|---|---|---|
| 1. | විවිධ ඇගයීම් හා ප්‍රතිපෝෂණ ක්‍රම භාවිතය | 14 |
| 2. | ඇගයීම් ප්‍රමාණවත් ව යොදා ගැනීම | 10 |
| 3. | ඇගයීම් ක්‍රමය පැහැදිලි ව ඉදිරිපත් කිරීම | 05 |

4. වාචික ව ද ඇගයීම යොදා ගැනීම 05

5. පළාත් මගින් දෙන ඇගයීම විෂය අමතර ව යොදා ගැනීම 05

**C ඇගයීම් ක්‍රමයේ ප්‍රමාණවත් බව හා සම්බන්ධ යෝජනා**

1. ඇගයීම සඳහා දේශක හා ගුරු පිරිස යන දෙපාර්ශවය ම සම්බන්ධ වීම 10
2. සැසි මගින් මගින් ප්‍රායෝගික ව ඇගයීම් අවස්ථා පුහුණු කිරීම 09
3. ලිඛිත ඇගයීම් ක්‍රම භාවිතය 08
4. 6-10 ශ්‍රේණි ඇගයීම් අවස්ථා වැඩි කිරීම 08

❖ **පසු විපරම පිළිබඳ යෝජනා**

1. පසු විපරම පාඩම් අනුව සිදු කිරීම 17
2. සෑම පියවරක් අවසානයේ දී ම ඒවා තහවුරු වූ ආකාරය පිළිබඳ පසු විපරමක් කිරීම 07

# පස්වන පරිච්ඡේදය
# යෝජනා හා නිර්දේශ

**1. සේවාස්ථ පුහුණුව සඳහා නව පුහුණු ආකෘතියක් හඳුන්වා දීම හෝ පවත්නා (පියගැට) පුහුණු ආකෘතිය දැඩි වෙනස්කම්වලට භාජනය කිරීම**

පියගැට (Cascade) ආකෘතිය, ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියෙහි සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් සඳහා යොදා ගන්නා ප්‍රධාන පුහුණු ක්‍රමවේදය වේ. මූලධර්මයක් ලෙස පියගැට ආකෘතිය මහා පරිමාණයෙන් කෙරෙන සේවාස්ථ පුහුණුව සඳහා භාවිත කළ හැකි ප්‍රායෝගික, පිරිවැය-ඵලදායී, පරිශීලක-මිතුරු ප්‍රවේශයක් බව පෙනෙන්නට තිබේ. කෙසේ වුව ද, පියගැට ආකෘතිය, ඵලදායී පුහුණුවක් දීමට අසමත්, අප්‍රමාණවත් ක්‍රමයක් ලෙස දැඩි දෝෂ දර්ශනයට ද පාත්‍ර වී ඇත්තේ ය. බොහෝ සේවාස්ථ පුහුණු වැඩසටහන්වල දී තොරතුරු ප්‍රචලිත කිරීමේ මාර්ගයක් ලෙස මේ ආකෘතිය පිළිගැනීමට ලක් වී ඇතත්, අධ්‍යාපනඥයන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම අතින් බලන කල එය බොහෝ දුරට ම අසමත් වී ඇති බවක් දක්නට ලැබේ. පළාත් මට්ටමේ පුහුණුකරුවන් පවා හැම විට ම විෂයමාලාව පිළිබඳ මනා අවබෝධයකින් නොසිටින බවට ගුරුවරුන් පැමිණිලි කර ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ වැදගත් තොරතුරු විකෘති වීමට භාජන වීමත් ඒවා පහළ තලවලට ගමන් කිරීමේ දී අනුක්‍රමික ව 'දියාරු' වී යෑමත් ය. මේ නිසා, පුහුණුවේ ගුණාත්මක බව වර්ධනය කරනු වස් සේවාස්ථ ගුරු පුහුණුව සඳහා නව පුහුණු ආකෘතියක් හඳුන්වා දීමට හෝ පවත්වන පුහුණු ක්‍රමවේදය දැඩි පරිවර්තනයකට භාජන කිරීමට යෝජනා කෙරේ.

**2. සේවාස්ථ පුහුණු ක්‍රියාවලිය පුරා ක්‍රියාත්මක වන ප්‍රබල නියාමන පද්ධතියක අවශ්‍යතාව**

විෂයමාලා නවීකරණය, සංකීර්ණ බහුමාන ප්‍රපංචයකි. මේ අනුව, විෂයමාලා සම්පාදකවරයාගේ මේසයෙහි සිට පන්තිකාමරය කරා පැමිණීමේ අවස්ථාව ලබන කවර හෝ නවීකරණ වෙත් නම් එහි සංක්‍රමණික ක්‍රියාවලිය පරෙස්සමින් ක්‍රියාත්මක විය යුතු ය. මේ නිසා, සමස්ත ක්‍රියාවලිය ආවරණය වන ප්‍රබල නියාමන යාන්ත්‍රණයක අවශ්‍යතාව මෙහි ලා අවධාරණය කෙරේ. ජාතික අධ්‍යාපන ආයතනයේ දෙපාර්තමේන්තු නිලධාරීන්, අදාළ ස්ථාන වෙත පැමිණ, දෙවැනි මට්ටමේ පුහුණුකරුවන් සේ ක්‍රියා කරන විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් විසින් පවත්වනු ලබන සැසි අධීක්ෂණයට හා නියාමනයට භාජනය කළ යුතු ය.

**3. ජාතික අධ්‍යාපන ආයතනයේ පළාත් ඒකක විසින් පළාත් මට්ටමේ දී සිදු කෙරෙන නියාමනය**

බොහෝ හේතු නිසා පළාත් මට්ටමේ දී අධ්‍යක්ෂවරුන් හා අනෙකුත් නිලධාරීන් විසින් සේවාස්ථ වැඩසටහන් නිසියාකාර ව නියාමනය නොකෙරෙන බව පෙනෙන්නට තිබේ. ඔවුන් නියාමනය කරන අවස්ථාවල දී පවා එය එම මට්ටමේ දී සිදු කෙරෙන සේවාස්ථ වැඩසටහන් පරිපාලනයට හා සංවිධානයට අදාළ කටයුතුවලට පමණක් සීමා වන්නේ ය. මේ නිසා ඒ ඒ පළාත වෙනුවෙන් වෙන් වෙන් නියාමන ඒකක පිහිටුවීමට යෝජනා කෙරේ. එම ඒකක ජාතික අධ්‍යාපන ආයතනයේ දෙපාර්තමේන්තුවල නියෝජිතයන්ගෙන් හා පළාත් මට්ටමේ ඒකක හෝ

දෙපාර්තමේන්තු ඒකක වෙත් නම්, සංවිධානය, පැවැත්වීම, නියාමනය හා ඇගයීම ඇතුළු සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන්වලට අදාළ සියලු කටයුතු නියමානුකූල ව ඉටු කළ හැකි ය.

## 4. විවිධ මට්ටම්වල පුහුණුකරුවන් අතර අන්තර්සන්නිවේදනය

විෂයමාලා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව දෙවැනි මට්ටමේ පුහුණුකරුවන් (විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන්) වෙනුවෙන් පුහුණු සැසි ආරම්භ කිරීමට පෙරාතුව, ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුකරුවන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ නිරත ගුරුවරුන් නියැදියක් සඳහා සැසි එකක් හෝ දෙකක් පැවැත්විය යුතු ය. දෙවැනි මට්ටමේ පුහුණුකරුවන් දඳහා සැසි පැවැත්විය යුත්තේ එම නියැදියෙහි ගුරුවරුන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගැනීමෙන් පසු ව පමණි. තව ද, පළමු මට්ටමේ පුහුණුකරුවන් අවම වශයෙන් පාසල් නියැදියක් වෙත ගොස් ගුරුවරුන් මුහුණ දෙන ගැටලු හා ප්‍රස්තුත පිළිබඳ අත්දැකීමට් ලැබිය යුතු ය. මේ ගමන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුකරුවන්ට ප්‍රතිපාදන සැපයිය යුතු ය.

## 5. ගුරු උපදේශකවරුන්ට වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් දීම

ජාතික අධ්‍යාපන ආයතනයේ දෙපාර්තමේන්තු විසින් ගුරු උපදේශකවරුන්ට හා විෂය අධ්‍යක්ෂවරුන්ට දෙන පුහුණුව සේ ම ගුරු උපදේශකවරුන් විසින් ගුරුවරුනට දෙන පුහුණුව එතරම් ඵලදායී නොවන බව අධ්‍යයනයෙන් අනාවරණය වෙයි. 'වැඩිහිටි අධ්‍යාපන ක්‍රම' පිළිබඳ ව ප්‍රමාණවත් දැනුමක් හා කුසලතා නොමැති වීම මේ ඌණ ඵලදායකත්වයට එක් හේතුවක් බව පෙනෙන්නට තිබේ. පළපුරුදු ගුරුවරුන් වුව ද, විශේෂයෙන් ම ගුරු උපදේශකවරු, ගුරුවරුන්ට විෂය මාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන අවස්ථාවල දී වැඩිහිටියන් සඳහා යෝග්‍ය පුහුණු ක්‍රමවේද භාවිතයට නොගනිති. මේ නිසා ගුරු උපදේශකවරුන් සඳහා වැඩිහිටි පුහුණු ක්‍රම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සුදුසු යැයි යෝජනා කෙරේ.

## 6. සේවාස්ථ වැඩසටහන්වල සංවිධානයට අදාළ යෝජනා

i. සියලු ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අවශ්‍ය වේ.
   පුහුණුව සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙනුයේ විෂය අනුව ය. එහි දී එම විෂය ඉගැන්වීමෙහි යෙදෙන ගුරුවරුන් සංඛ්‍යාව සැලකිල්ලට නොගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගුරුවරුන් විශාල ප්‍රතිශතයක් පුහුණුවේ ප්‍රතිලාභ නොලබති. මේ නිසා පුහුණුව සඳහා ගුරුවරුන් තෝරාගැනීමේ දී, වසර 3/4 කාලයක් ඇතුළත සියලු ගුරුවරුන් ගේ සහභාගිත්වය තහවුරු කෙරෙන, පළාත් පදනම් කරගත්, සාධාරණ ස්ථාවර ක්‍රමයක් අනුගමනය කිරීම නිර්දේශ කෙරේ. එක් සැසියක් සඳහා සියලු ගුරුවරුන් කැඳවීම වෙනුවට, ගුරුවරුන් කණ්ඩායම් වශයෙන් කැඳවීමට යෝජනා කෙරේ. නවක ගුරුවරුන් සඳහා වෙන ම කණ්ඩායම් පිහිටුවා ගත යුතු ය.

ii. ඉගැන්වීමේ මාධ්‍ය තුන සඳහා වෙන වෙන ම සැසි පැවැත්විය යුතු අතර එය ද විෂය හා ශ්‍රේණි අනුව වෙන වෙන ම විය යුතු ය. එක් ශ්‍රේණියක් සඳහා අවම වශයෙන් දින දෙකක් වෙන් විය යුතු ය.

iii. පුහුණු දින ගණන හා සැසි ගණන වැඩි කළ යුතු ය. වසරකට අවම වශයෙන් සැසි තුනක් අවශ්‍ය වේ.

iv. හැකිතාක් දුරට සැසි පැවැත්වීම සති අන්තවලටත්, පාසල් නිවාඩු කාලවලටත් සීමා කළ යුතු ය. එය ගුරුවරුනට පහසුවකි. පාසල්වල ඉගැන්වීම් කටයුතුවලට බාධා වන හෙයින් බොහෝ ගුරුවරුන් පාසල් දිනවල පුහුණු සැසි පැවැත්වීම පිළිබඳ නොසතුට පළ කරයි.

v. කේන්ද්‍රීය ස්ථානයක සැසි පැවැත්විය යුතු ය.
පුහුණු මධ්‍යස්ථානවල පිහිටීම හා පවත්නා පහසුකම් පිළිබඳ ව ඇතැම් ගුරුවරුන් තෘප්තිමත් නැත. සැසි පැවැත්වීම සඳහා තෝරාගෙන ඇති ඇතැම් මධ්‍යස්ථාන හා ශාලා අපිරිසිදු වන අතර ප්‍රමාණවත් අවකාශයෙන් හා පහසුකම්වලින් තොර ය. කලාපය තුළ යම් කේන්ද්‍රීය ස්ථානයක සැසි පැවැත්වීමේ හා ඉගෙනුම්ලාභීන්ට හිතකර පරිසරයක අවශ්‍ය පහසුකම් සපයා දීමට කටයුතු කිරීමේ අවශ්‍යතාව ගුරුවරු අවධාරණය කරති.

vi. පුහුණු මධ්‍යස්ථානවල අවශ්‍ය පහසුකම් සපයා ඒවායේ ඉගෙනුම්ලාභී-මිතුරු පරිසරයක් ගොඩනැගිය යුතු ය.
ගුරුවරුන් විසින් පෙන්වා දී ඇති පරිදි පුහුණු මධ්‍යස්ථානවල පවත්නා පහසුකම් පවා සුදුසු තත්වයට නොපවතී. ඇතැම් මධ්‍යස්ථානවල ආපනශාලා පහසුකම් ද ප්‍රමාණවත් නැත. ගුණාත්මක පුහුණුවක් සඳහා මේ සියල්ල ප්‍රමාණවත් ව සැපයිය යුතු බව ඔවුහු පෙන්වා දෙති.

vii. පෙළ පොත්, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, ගුරු අත්පොත් හා අනෙකුත් විෂයමාලා ද්‍රව්‍ය කල් ඇති ව මුද්‍රණය කොට බෙදා දිය යුතු ය. එය සිදු කළ නොහැකි නම් එම ද්‍රව්‍ය සැපයීමට අවකාශ ලැබෙන තෙක් පුහුණු සැසි කල් තැබීම සුදුසු ය.

viii. විශේෂයෙන් පාඩම් හා පෙළපොත් සම්පාදන කටයුතුවල නිරත වූ පුද්ගලයන් ඇතුළු ප්‍රවීණ, පළපුරුද්දක් ඇති සම්පත් පුද්ගලයන්ගේ සහාය පුහුණු කටයුතු සඳහා ලබා ගත යුතු ය. පුහුණු සැසිවල දී විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් දෙන ලද සේවා දායකත්වය බොහෝ දෙනෙකුගේ ඇගයීමට ලක් වී ඇත.

## 7. සේවාස්ථ පුහුණුවේ අන්තර්ගතය හා සම්බන්ධ යෝජනා

i. පුහුණුවේ අන්තර්ගතය පෙළපොත හා ගැළපිය යුතු අතර ඊට අදාළ විය යුතු ය.

ii. පාසල් විෂයමාලාවේ සිදු කරන ලද සියලු ප්‍රතිසංස්කරණ පුහුණු සැසිවල අන්තර්ගතයට ඇතුළත් විය යුතු ය.

iii. අන්තර්ගතය බෙහෙවින් න්‍යායික හා සංකීර්ණ වේ. ඊට නිපුණතා පදනම් විය යුතු අතර ඊට නවෝත්පාදක හා කාලීන තොරතුරු ඇතුළත් විය යුතු ය. එසේ ම ඊට සරල, ප්‍රායෝගික හා සජීවී අත්දැකීම් ඇතුළත් විය යුත්තේ ය.

iv. නවීන තාක්ෂණික ප්‍රවර්ධනවලට අනුකූල ව අන්තර්ගතය සංස්කරණය වීම හා සංවර්ධනය වීම සිදු විය යුතු ය.

v. අන්තර්ගතය පිළියෙල විය යුත්තේ සුහග සිසුන් සේ ම දුර්වල සිසුන් ද ඉලක්ක කර ගනිමිනි.

vi. ගුරුවරයාට තව තවත් සම්පත් ද්‍රව්‍ය වෙත ප්‍රවේශ වෙමින් තම දැනුම පුළුල් කර ගැනීම පහසු කරන පිණිස, අවශ්‍ය හා අන්තර්ගතයට අදාළ මූලාශ්‍ර හා සම්පත් පිළිබඳ යොමු විෂයමාලා ද්‍රව්‍යවල ඇතුළත් කළ යුතු ය.

vii. පුහුණු සැසිවල දී දැනට භාවිත කෙරෙන විෂය අන්තර්ගතය ප්‍රමාණවත් නොවේ. එබැවින් 21 වැනි සියවසේ අවශ්‍යතා පූරණය වන පරිදි විෂය වපසරිය පුළුල් කර සංස්කරණය කළ යුතු ය.

## 8. ක්‍රමවේදයට අදාළ යෝජනා

i. පුහුණුකරුවන්ට සරල බසින් හා ගුරු මිතුරු ආකාරයෙන් අන්තර්ගතය පැහැදිලි කර දීමට හැකි විය යුතු ය.

ii. සැසිවල දී දේශන ක්‍රමය භාවිතයට ගත යුත්තේ අවම වශයෙනි. ඒ වෙනුවට විවිධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම අවශ්‍ය ය.

iii. ප්‍රායෝගික ක්‍රියාකාරකම්, කණ්ඩායම් සාකච්ඡා හා කණ්ඩායම් ක්‍රියාකාරකම් වැඩිපුර යොදා ගත යුතු ය.

iv. අන්තර්ගතය පැහැදිලි කර දීමේ දී විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමත්, ආදර්ශ පාඩම් යොදා ගැනීමත් ගුරු ශක්‍යතා වර්ධනයට හේතු වේ.

v. පුහුණුව සඳහා නව තාක්ෂණික උපකරණ භාවිතයට ගත යුතු ය. මේ සඳහා අවශ්‍ය පහසුකම් (වීඩියෝ කැමරා, බහුමාධ්‍ය උපකරණ වැනි) මධ්‍යස්ථානවලට සැපයිය යුතු ය.

## 9. පුහුණුව සඳහා නව තාක්ෂණය භාවිතය

නියැදියට ඇතුළත් ගුරුවරුන් බොහෝ දෙනෙකු විසින් පුහුණු සැසිවල දී නව තාක්ෂණය භාවිතයට ගැනීමේ අවශ්‍යතාව සඳහන් ක ඇත. ඊට අදාළ ව කර ඇති යෝජනා මෙසේ ය.

i. අන්තර්ගතය ඉදිරිපත් කිරීමේ දී පුහුණුකරුවන් බහුමාධ්‍ය ආදී නූතන තාක්ෂණික උවාරණවල සහාය ලබා ගත යුතු ය.

ii. පන්තිකාමරය තුළ දී තාක්ෂණික උපකරණ භාවිතයට ගැනීම සඳහා ගුරුවරුනට පුහුණුවක් දීමට පුහුණුකරුවන්ට හැකියාව තිබිය යුතු ය.

iii. පුහුණුකරුවන්, අන්තර්ජාලයෙන් දැනුම ලබා ගැනීම සඳහා ගුරුවරුන් යොමු කළ යුතු ය.

iv. තාක්ෂණික ක්‍රම භාවිතයට ගනිමින් සිතියම් පිළියෙල කිරීම හා ලකුණු කිරීම පිළිබඳ ව උපදෙස් අවශ්‍ය ය.

v. පන්තිකාමර මට්ටමේ දී ඉගැන්වී සඳහා පරිගණක භාවිතය හා ඉගැන්වීම සඳහා පාසල්වල ඇති පරිගණක ඒකකයේ සහාය ලබා ගැනීම පිළිබඳ ව උපදෙස් අවශ්‍ය ය.

vi. පුහුණු සැසිවල දී කෙරෙන ඉදිරිපත් කිරීම් සංයුක්ත තැටිවල අන්තර්ගත කර ඒව පුහුණුව ලබන්නන් අතර බෙදා දීමට කටයුතු යෙදීම ප්‍රයෝජනවත් ය.

## 10. ඇගයීම

i. සම්භවන හා අඛණ්ඩ ඇගයීම් කිරීම කෙරෙහි පුහුණුකරුවන්ගේ අවධානය යොමු විය යුතු ය.

ii. ගුරුවරුන් සේ ම පුහුණුකරුවන් විසින් ද ඉදිරිපත් කරන ලද යෝජනා අනුව පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීමට උපාය මාර්ග නිර්මාණය කර ගත යුතු ය.

## 11. විෂයානුබද්ධ යෝජනා

**සියලු විෂයන්ට පොදු යෝජනා**

i. ගුරු උපදෙස් සංග්‍රහ, විෂය නිර්දේශ හා පෙළපොත්, පුහුණු සැසි ආරම්භ කිරීමට පෙරාතුව බෙදා දිය යුතු ය.

ii. යොදා ගනු ලබන සම්පත් පුද්ගලයන් අදාළ විෂයෙහි විශේෂඥතාව ලද්දවුන් ද විය යුතු අතර වෘත්තීය වශයෙන් ශික්ෂණ විද්‍යාව අදාළ පුහුණුවක් ලද්දවුන් විය යුතු ය.

iii. සේවාස්ථ පුහුණු සැසි සංවිධානාත්මක අයුරින් පැවැත්විය යුතු ය. ඒ පිළිබඳ ව ගුරුවරුන් කල් තබා දැනුවත් කිරීම අවශ්‍ය ය. සේවාස්ථ පුහුණු සැසිවලට සහභාගි වීම අදාළ පාර්ශවකරුවනට අනිවාර්ය කළ යුතු ය.

iv. සේවාස්ථ පුහුණු සැසි සංවිධානය කිරීමේ දී පාසල්වල සාමාන්‍ය කාර්ය පටිපාටියට බාධා නොවිය යුතු ය.

**එක් එක් විෂයය අනුබද්ධ ව ඉදිරිපත් වූ යෝජනා**

**A භාෂාව**

i. භාෂාව විෂය නිර්දේශය අධ්‍යයනය කොට සංශෝධනය කිරීම සඳහා ප්‍රවීණ විෂය නිර්දේශ සංස්කරණ මණ්ඩලයක් පත් කළ යුතු ය.

ii. භාෂාව විෂය නිර්දේශ, ඒ ඒ ශ්‍රේණි මට්ටමට හා පාසල් කාලසටහන්වල භාෂාව සඳහා වෙන් කර ඇති කාලයට ගැළපෙන පරිදි සංශෝධනය විය යුතු ය.

iii. සිසුනට ස්වයං අධ්‍යයනයේ නිරත විය හැකි පරිදි පාඩම් පිළියෙල විය යුතු ය.

iv. ඇතැම් භාෂා පාඩම් ඉතා සංකීර්ණ බැවින් ඒවා ලිහිල් කළ යුතු ය.

**B ඉංග්‍රීසි**

i. පාඩම්වල සංකීර්ණ බව අඩු විය යුතු අතර වඩා සරල පාඩම් වැඩිපුර ඇතුළත් විය යුතු ය. විෂය නිර්දේශයෙන් නිර්දේශිත ඇතැම් පාඩම් ඉතා සංකීර්ණ ඒවා වන අතර අදාළ ශ්‍රේණි මට්ටම සලකන කල, ඒවා දුෂ්කරතාවෙන් වැඩි ය. විශේෂයෙන් සෙමෙන් ඉගෙනගන්නා සිසුන්ගේ ප්‍රගතිය ගැන සලකන කල් හි වඩා සරල පාඩම් ඇතුළත් කිරීම යෝජනා කෙරේ. එසේ ම ඇතැම් අභ්‍යාස ද සිසුන්ගේ හැකියා මට්ටම අභිබවන ඒවා වෙයි. නිදසුනක් ලෙස 6 හා 7 ශ්‍රේණි සඳහා නිර්දේශිත අභ්‍යාස, 8 හා 9 ශ්‍රේණිවලට මාරු කළ යුතු ය.

ii. කථනයට අදාළ පාඩම් වැඩියෙන් ඇතුළත් කළ යුතු ය. කථනය වෙනුවෙන් වෙන් කර ඇති පාඩම් ප්‍රමාණවත් නොවේ. පෙළපොතෙහි හඳුන්වා දී ඇති ක්‍රියාකාරකම් ඒවායේ දුෂ්කරතා මට්ටම් අනුව ක්‍රමාරෝහණ පිළිවෙළකට පෙළගැස්විය යුතු ය.

iii. පාඩම් පිළියෙළ කිරීමේ දී ඒවාට දේශීය සිද්ධි හා කතන්දර පදනම් කරගත යුතු ය.

iv. ඉංග්‍රීසි ඉගැන්වීම, අවශ්‍ය තාක්ෂණය සැපයිය යුතු ය. විශේෂයෙන් සවන්දීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පටිගත කරන ලද ---- පටි, සංයුක්ත තැටි (CD), DVD, කැසට් හා අනෙකුත් තාක්ෂණික මෙවලම් පාසල්වලට/පාසල් පුස්තකාලවලට සැපයිය යුතු ය. මෙවැනි උපාංග සපයා දීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස නියැදියෙහි ඇතුළත් බොහෝ ඉංග්‍රීසි ගුරුවරුන් විසින් ප්‍රකාශ කොට ඇත.

v. තාක්ෂණය භාවිතයට ගැනීමට ගුරුවරුන් පුහුණු කිරීම-තාක්ෂණය භාවිතයට ගනිමින් භාෂාව උගන්වන ආකාරව පිළිබඳ ව ගුරුවරුනට උපදෙස් සැපයිය යුතු ය.

**C ආගම**

i. 6 හා 8 ශ්‍රේණිවල බුද්ධාගම විෂය නිර්දේශ සම්පූර්ණයෙන් ප්‍රතිසංශෝධනය කිරීම-එකිනෙකට පරස්පර වූ අදහස් බුද්ධාගම උගන්වන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ය. සමහරෙක් විෂය නිර්දේශය ඉතා පුළුල් බවත්, එබඳු තේමා සංඛ්‍යාවක් ඉගැන්වීම ඉතා දුෂ්කර කාර්යයක් බවත් සඳහන් කරති. මේ අතර තවත් සමහර ගුරුවරුන්ගේ දැක්මට අනුව 6-10 බුද්ධාගම විෂය නිර්දේශවලින් බුද්ධාගම විෂයයට අදාළ වැදගත් විෂය සංරචක ගණනාවක් ගිලිහී ඇත. මේ අතර තවත් අයකුගේ අදහස වන්නේ පාඩම් ඉතා දීර්ඝ බවයි. මේ විවේචනවලින් ගම්‍ය වන්නේ 6-10 බුද්ධාගම විෂය නිර්දේශ පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්විය යුතු බවයි.

ii. විෂයමාලාව ක්‍රියාත්මක කරන ව්‍යවහාරිකයන් විෂයමාලා කමිටුවලට සහභාගි විය යුතු ය. පන්තිකාමර මට්ටමින් විෂයමාලාව ක්‍රියාවට නංවන්නේ ගුරුවරුන් ය. එහෙයින් විෂයමාලා ප්‍රතිසංස්කරණ කමිටුවලට ඔවුන් සහභාගි කරවිය යුතු ය.

iii. ආගම ඉගැන්වීම සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. එහෙයින් ආගම ඉගැන්වීම සඳහා දැනට ඇති දින ගණන/ කාලච්ඡේද ගණන වැඩි කළ යුතු ය.

iv. ආගම ඉගැන්වීමේ නව ක්‍රමශිල්ප හඳුන්වා දීම - තවමත් ඉගැන්වීම සඳහා පන්තිකාමරවල භාවිත වන්නේ සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම බව පෙනෙන්නට තිබේ. නව ඉගැන්වීම් ක්‍රම ශිල්ප හඳුන්වා දෙන ලෙස ගුරුවරු යෝජනා කරති.

v. ඉගැන්වීම සඳහා CD, DVD වැනි වැනි තාක්ෂණික පහසුකම් සැපයිය යුතු ය.

vi. නව ක්‍රම භාවිතය පිළිබඳ ව උපදෙස් දීම සඳහා සුදුසු සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබා ගත යුතු ය.

vii. අතිරේක කියවීම් ද්‍රව්‍ය සැපයිය යුතු ය.

**D විද්‍යාව**

i. විද්‍යාව සඳහා පුහුණු සැසි සඳහා පුහුණු සැසි සංඛ්‍යාව වැඩි කිරීම-විද්‍යාව සඳහා වූ සේවාස්ථ පුහුණු සැසි සංඛ්‍යාව වැඩි කිරීම සඳහා කටයුතු යෙදිය යුතු ය. දැනුම යාවත්කාලීන කිරීම සඳහා නිරන්තරයෙන් සැසි පැවැත්විය යුතු ය. විශේෂයෙන් සය වැනි ශ්‍රේණියේ ගුරුවරුන් සඳහා වැඩියෙන් පුහුණු සැසි පැවැත්විය යුතු ය.

ii. උසස් ප්‍රවීණත්වයකින් යුත් බාහිර සම්පත් පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීම - නව සංරචක අවබෝධ කර ගැනීමේ දුෂ්කරතාව ගුරුවරුන් මුහුණ දෙන ගැටලුවකි. එහෙයින්, විෂය නිර්දේශයේ වඩාත් දුෂ්කර වූ කොටස් පැහැදිලි කර දීම සඳහා ඒ පිළිබඳ ප්‍රවීණත්වයෙන් යුත් බාහිර සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබා ගත යුතු බවට ගුරුවරු යෝජනා කරයි.

iii. සේවාස්ථ සැසිවල දී අදාළ ඉගැන්වීම් මාධ්‍යය යොදා ගැනීම - සේවාස්ථ සැසි පැවැත්වෙන මාධ්‍යය පිළිබඳ ව ද ඇතැමුන් අදහස් ප්‍රකාශ කර ඇත. ගුරුවරුන් යෝජනා කරන පරිදි සේවාස්ථ සැසි පැවැත්වෙන මාධ්‍යය, තමා පන්තිකාමරයේ විෂය උගන්වන මාධ්‍යය ම විය යුතු ය.

iv. පාඩම්වලට අදාළ ක්‍රියාකාරකම් - පෙළ පොතට අතිරේක ව තවත් 'වැඩ පොතක්' හඳුන්වා දීම ප්‍රයෝජනවත් ය. පෙළ පොත්වල ඇතුළත් පාඩම්වලට තවදුරටත් ක්‍රියාකාරකම් ඇතුළත් විය යුතු ය.

v. සංශෝධිත විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විද්‍යාගාර පහසුකම් සැපයිය යුතු ය. දැනට පාසල්වල පවත්නා විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් නැත.

vi. විද්‍යා සැසි පැවැත්වීමට අවශ්‍ය උපකරණ සැපයිය යුතු ය.

vii. පාසල් විද්‍යාගාර සහායකයනට ද නව විෂය නිර්දේශය සම්බන්ධ පුහුණු අවස්ථා දිය යුතු ය.

**E ගණිතය**

i. අන්තර්ගතයේ සංකීර්ණත්වය අඩු කිරීම

ගුරුවරුන් විසින් කරන ලද පරිදි 6 ශ්‍රේණියේ විෂය නිර්දේශය එම වයස් මට්ටම ඉක්මවා යව බැවින් එහි බර අඩු කළ යුතු ය. එහි අන්තර්ගත කොටස් 7, 8 හා 9 විෂය නිර්දේශවල ඇතුළත් කළ හැකි ය. 10 ශ්‍රේණියේ විෂය නිර්දේශය සම්බන්ධයෙන් ද ඔවුහු ඊට සමාන ප්‍රතිචාරයක් දක්වති. එහි අන්තර්ගත ඇතැම් කොටස් 11 ශ්‍රේණියේ විෂය නිර්දේශයට ඇතුළත් කිරීමෙන් එය ලිහිල් කළ හැකි ය.

ii. සුදුසු සම්පත් පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීම

අලුතින් ඇතුළත් කරන ලද ඇතැම් සංරචක අවබෝධ කර ගැනීම දුෂ්කර වීම ගුරුවරුන් මුහුණ පා ඇති ගැටලුවකි. සේවාස්ථ පුහුණු සැසිවල දී ගණිත නිර්දේශයේ අමාරු කොටම් පැහැදිලි කිරීම සඳහා සුදුසු සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබා ගත යුතු බවට ගුරුවරු යෝජනා කරති.

iii. සැසි පැවැත්වීමට පෙර, පුහුණුකරුවන්ට මනා පුහුණුවක් දිය යුතු ය. සේවාස්ථ පුහුණු සැසි පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ විය යුතු ය. තමන් පන්ති කාමරයේ භාවිතයට ගන්නා ඉගැන්වීම් ක්‍රම සම්බන්ධ විධිමත් පුහුණුවක් ගුරුවරුන්ට ලැබිය යුතු ය. නිදසුනක් ලෙස ක්‍රියාකාරකම් පාදක ඉගැන්වීම පිළිබඳ පුහුණුවක් ලැබීමට නම් සේවාස්ථ සැසිවල දී එම ක්‍රමය භාවිතයට ගත යුතු ය. 'සක්‍රීය ඉගෙනුම' හා 'ක්‍රියාවෙන් අවබෝධය' සඳහා යෝග්‍ය ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීමට පුහුණුකරුවන්ට උපදෙස් දිය යුතු ය.

iv. පන්තිකාමරයේ භාවිතයට ගන්නා නව ක්‍රමවලට ගැළපෙන ඉගෙනුම් ආධාරක සැපයිය යුතු ය.

v. නිසි කලට, එනම් පුහුණු සැසි පැවැත්වීමට පෙර ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, විෂය නිර්දේශ හා පෙළ පොත් සැපයිය යුතු ය/ බෙදා දිය යුතු ය. පෙළ පොතට අමතර ව 'වැඩ පොතක්' ද හඳුන්වා දීම ප්‍රයෝජනවත් ය.

vi. තාක්ෂණය භාවිතයට ගනිමින් ගණිත පාඩම් ඉගැන්වීම පිළිබඳ ව පුහුණුකරුවන්ට සේ ම ගුරුවරුන්ට ද මනා පුහුණුවක් දිය යුතු ය.

**F ඉතිහාසය**

i. ඉතිහාසය විෂය නිර්දේශය හා පෙළපොත් සංශෝධනය කිරීම - පෙළපොත්වල සදොස් තැන් බොහොමයක් හඳුනාගෙන ඇත. ඒවායේ අන්තර්ගතය ඉතා පුළුල් සේම දීර්ඝ ද වේ. ඒවා ළමයින්ට ආකර්ෂණීය නොවන අතර ශ්‍රේණි මට්ටම්වලට ද නොගැළපේ. පුරාවිද්‍යාවට අදාළ කරුණු කෙරෙහි නාභිගත වෙමින් ආදි කාලීන යුගවලට වැඩි බරක් තබා ඇත. විෂය ඒකක අන්තර්සම්බන්ධතාවෙන් තොර ය. පෙළ පොත් සිසු-මිතුරු බවින් ද තොර ය. එබැවින් ඉතිහාසය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පූර්ණයෙන් සංස්කරණය විය යුතු ය.

ii. ඉතිහාසය ඉගැන්වීමේ යෙදෙන ඇතැම් ගුරුවරු තම උසස් අධ්‍යාපන පාඨමාලාවල දී විෂයයක් ලෙස ඉතිහාසය හැදෑරූ අය නොවෙති. එබැවින් විශේෂයෙන් එබඳු අයගේ විෂය දැනුම දියුණු කළ යුතු ය.

iii. පළපුරුදු සම්පත් පුද්ගලයන්ගේ සේවය ලබා ගත යුතු ය.

iv. ඉතිහාසය ඉගැන්වීම සඳහා තාක්ෂණික පහසුකම් සැපයිය යුතු ය.

v. ඉතිහාසය ඉගැන්වීම සඳහා වෙන් වී ඇති දින ගණන හා කාලච්ඡේද ගණන ප්‍රමාණවත් නොවේ. එබැවින් එය වැඩි කිරීමට යෝජනා කෙරේ.